GLOBAL
PLURALISM
MONITOR

# ශ්‍රී ලංකාව

ගෝලීය බහුත්වවාදය පිළිබඳ නිරීක්ෂකයː ශ්‍රී ලංකාව
බහුත්වවාදය සඳහා වන ගෝලීය කේන්ද්‍රය විසිනි

© 2023 බහුත්වවාදය සඳහා වන ගෝලීය කේන්ද්‍රය විසිනි
Creative Commons Attribution 4.0 ජාත්‍යන්තර බලපත්‍රය යටතේ ප්‍රකාශනය කරන ලදී.

## ප්‍රකාශක
බහුත්වවාදය සඳහා වන ගෝලීය කේන්ද්‍රය
330 සසෙක්ස් ඩ්‍රයිව්
ඔටාවා, ඔන්ටේරියෝ, K1N 0C7
කැනඩාව

## සිංහල පරිවර්තනය
ආචාර්ය මාග්‍රට් කුරුප්පු

@GlobalPluralism

## පිටකවරය සහ ඇතුළත නිර්මාණය
designbysoapbox.com

## පිටු සැකසීම
Em Dash design
emdashdesign.ca

pluralism.ca

@GlobalPluralism

**Library and Archives Canada Cataloguing in Publication**

Title: Global Pluralism Monitor. Sri Lanka : siṁhalaṭa parivartanaya kara æta.
Other titles: Global Pluralism Monitor. Sri Lanka. Sinhala.
Names: Global Centre for Pluralism, publisher.
Description: Translated into Sinhala by Margaret Kuruppu. | Includes bibliographical references. | In Sinhala.
Identifiers: Canadiana (print) 20230540694 | Canadiana (ebook) 2023054178X | ISBN 9781998059300 (softcover) | ISBN 9781998059317 (PDF)
Subjects: LCSH: Cultural pluralism—Sri Lanka. | LCSH: Religious pluralism—Sri Lanka. | LCSH: Equality—Sri Lanka. | LCSH: Sri Lanka—Ethnic relations. | LCSH: Sri Lanka—Social conditions. | LCSH: Sri Lanka—Economic conditions.
Classification: LCC DS489.2 .G56175 2023 | DDC 305.8914/13—dc23

978-1-998059-30-0
978-1-998059-31-7 (PDF)

මෙම කාර්යය ගෝලීය කටයුතු කැනඩාව (GAC) සහ ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානය (IDRC) ඔටාවා, කැනඩාව යන සංවිධානවල මූල්‍ය අනුග්‍රහය ඇතිව සිදු කරන ලදී. මෙහි ප්‍රකාශිත අදහස් අවශ්‍ය වශයෙන්ම ගෝලීය කටයුතු කැනඩාව යන්නෙහිල හෝ ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානයෙහි සහ එහි පාලක මණ්ඩලයෙහි අදහස් නියෝජනය නොකරයි.

## මෙම මාලාව ගැන

මෙම වාර්තාව සකස් කරන ලද්දේ ගෝලීය බහුත්වවාදය තක්සේරු කිරීමේ නිරීක්ෂක රාමුව භාවිතා කරමිනි. ගෝලීය බහුත්වවාදය පිළිබඳ නිරීක්ෂකයෙහි ඒ ඒ රටට අදාළ තක්සේරු කිරීම් සිදු කරනු ලබන්නේ එම රටේ ජාතිකයින් හෝ රට තුළ සැලකිය යුතු අත්දැකීම් ඇති විවිධත්වයෙහි ගැටළු පිළිබඳ ප්‍රවීණයන් කණ්ඩායමක් විසිනි.

මෙම වාර්තාවේ ඉදිරිපත් කර ඇති ලකුණු සියලු රටවලට එකම ආකාරයෙන් අදාළ වන විශ්වීය පරිමාණයක් ලෙස අර්ථ කථනය නොකළ යුතු ය. ඒ වෙනුවට, මෙම ලකුණු අවබෝධ කරගත යුත්තේ බහුත්වවාදී පරමාදර්ශයක් කරා (හෝ ඉන් බැහැරව) රටේ ප්‍රගතිය පිළිබඳව සන්දර්භයට විශේෂිත ඇඟවීමක් ලෙස ය. නිදසුනක් ලෙස, තවමත් ප්‍රචණ්ඩත්වය අත්විඳින - එනමුත් ගැටුමේ උච්චතම අවස්ථාවට වඩා සංසන්දනාත්මකව අඩු - පශ්චාත්-ගැටුම් සමාජයක් හට, සාමකාමී එහෙත් මෑතකදී වෛරී අපරාධ වල වැඩිවීමක් අත්විඳින ලද සමාජයක් හා සමාන ලකුණු තිබිය හැකිය. බහුත්වවාදයෙහි අතිශය සන්දර්භීය ස්වභාවය පිළිබිඹු කිරීම සඳහා ඔවුන්ගේම කොන්දේසි මත රටවල් තක්සේරු කිරීමට ගෝලීය බහුත්වවාදය පිළිබඳ නිරීක්ෂකය අරමුණු කරයි: සාර්ථකත්වය සඳහා සියළු සමාජයන් අනුගමනය කළ යුතු තනි මාර්ගයක් නොමැත.

නිරීක්ෂකය සහ එහි ක්‍රමවේදය පිළිබඳ වැඩි තොරතුරු සඳහා අපගේ වෙබ් අඩවිය pluralism.ca/monitor වෙත පිවිසෙන්න.

## ප්‍රණාමය

බහුත්වවාදය සඳහා වන ගෝලීය කේන්ද්‍රය ගෝලීය බහුත්වවාදය පිළිබඳ නිරීක්ෂකය සඳහා පහත සඳහන් පුද්ගලයන් දැක්වූ සහයෝගය සහ දායකත්වයට එහි ස්තුතිය ප්‍රකාශ කරයි. ඇනා මරියා බයිරෝ, ජිනා කොසෙන්ටිනෝ, ඇලිසන් හැරල්, නිරාජ ගෝපාල් ජයාල්, විල් කිම්ලිකා, හෝක් අවුන් ලී, කොරීන් ලෙනොක්ස්, ටැවින්ඩර් නිජාවන්, ඊඩම් සෙලෝම්, අෂාඩ් සෙන්ටොන්ගෝ, රේචල් සීඩර්, ෆ්‍රාන්සස් ස්ටුවර්ට්, සහ ස්ටෙෆාන් වොල්ෆ්.

# බහුත්වවාදය සඳහා වන ගෝලීය නිරීක්ෂකය පිළිබඳව

## බහුත්වවාදය යනු කුමක්ද?

සමාජය තුළ විවිධත්වය යනු විශ්වීය කරුණකි; සමාජයන් විවිධත්වයට ප්‍රතිචාර දක්වන ආකාරය තීරණය වන්නේ තෝරාගැනීම මත ය. බහුත්වවාදය යනු විවිධත්වය කෙරෙහි දක්වන ධනාත්මක ප්‍රතිචාරයකි. බහුත්වවාදය පුද්ගලයන් සහ සමාජයන් ලෙස තීරණ සහ ක්‍රියාමාර්ග ගැනීම හා සම්බන්ධ වන අතර, ඒවා පදනම් වී ඇත්තේ විවිධත්වය සඳහා වන ගරුත්වය තුළ ය.

## විවිධ සමාජ තුළ අන්තර්කරණය සහ බැහැර කිරීම මැනීම

සමාජයේ වෙනස්කම් සමඟ ජීවත්වීම සහ ඒවා සමඟ සම්බන්ධ වීම සෑම සමාජයක්ම මුහුණ දෙන අභියෝගයකි. අසමානාත්මතාව, කොන්කිරීමට ලක් කිරීම, සහ බෙදීම් ඉහළ යන විට, සාමකාමී සහ සියල්ලන් ඇතුළත් වන සමාජ ගොඩනැගීම වඩාත් ඉක්මනින් කළ යුතු වේ.

ආගමික සහ ජනවාර්ගික-සංස්කෘතික සුළුතර ජනතාව, ස්වදේශීය කණ්ඩායම්, සහ කාන්තාවන් සහ ගැහැණු ළමයින් ඇතුළු අවදානමට ලක්විය හැකි කණ්ඩායම්, අඛණ්ඩ දේශපාලන, ආර්ථික හා සමාජීය බැහැර කිරීම් වලට මුහුණ දෙති. වඩාත් සාධාරණ, සාමකාමී සහ සමෘද්ධිමත් සමාජ පෝෂ්‍ය කිරීම සඳහා, මෙම බැහැර කිරීම් ආමන්ත්‍රණය කළ යුතු ය. අර්ථාන්විත ක්‍රියාමාර්ග ගැනීමට නම්, ප්‍රතිපත්ති සම්පාදකයින් හා වෘත්තිකයන් හට මෙම ගැටලු පිළිබඳව සාකල්‍ය අවබෝධයක් අවශ්‍ය වේ.

බහුත්වවාදය සඳහා වන ගෝලීය කේන්ද්‍රය විසින් දියත් කරන ලද ගෝලීය බහුත්වවාදය පිළිබඳ නිරීක්ෂකය ලොව පුරා රටවල බහුත්වවාදයේ තත්ත්වය තක්සේරු කරන මිනුම් මෙවලමකි. දේශපාලන, ආර්ථික, සමාජීය සහ සංස්කෘතික ක්ෂේත්‍රයන් හරහා, බැහැර කිරීමේ මූල හේතු ආමන්ත්‍රණය කිරීම සහ බහුත්වවාදය සඳහා වන අපේක්ෂාවන් වැඩිදියුණු කිරීම සඳහා තීරණ ගැනීම මෙම නිරීක්ෂකය මඟින් දැනුවත් කරයි.

රජයන්, සිවිල් සමාජය, සහ පෞද්ගලික අංශය මඟින් දැනට ගන්නා ප්‍රයත්නයන් ඉහළ නංවයි.

නිරීක්ෂකය පහත සඳහන් ඒවා බලදායි කරයි:

- හිඩැස් විශ්ලේෂණය: සමාජයක් තුළ බහුත්වවාදයේ තත්ත්වය තක්සේරු කිරීමට සහ බැහැර කිරීම ආමන්ත්‍රණය කිරීම සඳහා මැදිහත්වීම අවශ්‍ය වන ක්ෂේත්‍ර හඳුනාගැනීම සඳහා;
- ප්‍රවණතා විශ්ලේෂණය: කාලයත් සමඟ රටක ගමන් පථය වැඩි වශයෙන් යොමුව ඇත්තේ අන්තර්කරණය කෙරෙහි ද නැතහොත් බැහැර කිරීම කෙරෙහි ද යන්න නිරීක්ෂණය කිරීම සඳහා;
- අන්තර්-ආංශික විශ්ලේෂණය: සමාජ තුළ කාන්තාවන්ට සැලකීම තක්සේරු කිරීමට, ඇතුළත් කිරීමේ සහ බැහැර කිරීමේ අන්තඃ-කණ්ඩායම් (කණ්ඩායම් තුළ) ගතිකතාවයන් පිළිබඳව සොයා බැලීම සඳහා;
- ගැටුම් වැළැක්වීම: අර්බුදය ඉතා ආසන්න වීමට පෙර බැහැර කිරීමේ සහ කොන් කිරීමට ලක් කිරීමේ සලකුණු හඳුනාගැනීම සඳහා;
- යහ භාවිතාවන්: තවදුරටත් වර්ධනය කළ හැකි ධනාත්මක බලපෑමක් ඇති, නැතහොත් වෙනත් සන්දර්භ සඳහා පාඩම් ලෙස ප්‍රයෝජනවත් විය හැකි මුලපිරීම් හඳුනාගැනීමට.

විවිධත්වය කෙරෙහි ආයතනික සහ සංස්කෘතික ප්‍රතිචාර යන දෙකම තුළ මුල් බැසගත් ප්‍රවේශය

බහුත්වවාදය කෙරෙහි මෙම කේන්ද්‍රයෙහි ප්‍රවේශය ආයතන (දෘඩාංග), සංස්කෘතික ක්‍රියාවලීන් (මෘදුකාංග) සහ මේ දෙක අතර ඇති සංකීර්ණ අන්තර්ක්‍රියා කෙරෙහි අවධානය යොමු කරයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්, ව්‍යවස්ථාදායකයන්, අධිකරණයන් සහ රජයේ පද්ධති වැනි ආයතනික වින්‍යාසයන් සමාජ වල සාමාජිකයන් ක්‍රියා කරන නෛතික සහ දේශපාලනික අවකාශයන් ගෙන හැර දක්වයි. සංස්කෘතික පුරුදු හෝ මානසිකත්වයන් අයත් වන්නේ කවුද සහ දායක වන්නේ කවුද යන්න පිළිබඳව අපගේ දෘෂ්ටිකෝණයන් හැඩගස්වන අතර, අප දිනපතා එකිනෙකා සමඟ අන්තර්ක්‍රියා කරන ආකාරය කෙරෙහි බලපෑම් කරයි.

බහුත්වවාදය තක්සේරු කිරීමේ නිරීක්ෂක රාමුව ආයතනික සහ සංස්කෘතික ප්‍රතිචාර අතර වන අන්තර් ක්‍රියාකාරිත්වය තුළ මුල් බැස ඇති අතර, දේශපාලන, ආර්ථික හා සමාජීය මානයන් හරහා ඇතුළත්කිරීම් සහ බැහැරකිරීම් මනිනු ලබයි. එහි නිර්ණායක 20 පහත සඳහන් කරුණු ආවරණය කරයි:

1. බහුත්වවාදයට සහාය දැක්වීම සඳහා වන නෛතික බැඳීම්;
2. බැඳීම් සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය ආයතන වල ඇති භාවිතාවන්;
3. සමාජමය ක්‍රියාධරයින් බහුත්වවාදය කෙරෙහි සපයන නායකත්වය;
4. කණ්ඩායම් මත පදනම්ව ඇති අසමානාත්මතාවන්හි තත්ත්වය;
5. අන්තර්කණ්ඩායම් සම්බන්ධතා සහ අයිතිවීම.

විශේෂඥ දැනුම සහ දත්ත මඟින් දැනුවත්වීම

රට තුළ විවිධත්වය සහ අන්තර්කරණය පිළිබඳ ජාතික විශේෂඥයින් කණ්ඩායමක් ගුණාත්මක සහ ප්‍රමාණාත්මක දත්ත පරාසයකින් උකහා ගෙන රට පිළිබඳ වාර්තාවක් නිෂ්පාදනය කිරීම සඳහා තක්සේරු කිරීමේ නිරීක්ෂක රාමුව භාවිතා කරයි. මෙම වාර්තා බහුත්වවාදය ප්‍රගමනය කරන ආකාරය ගැන ප්‍රතිපත්ති සම්පාදකයින් සහ වෘත්තිකයින් සඳහා නිර්දේශ ඉදිරිපත් කරන අතර, සමාජය පුරාවට සිටින පාර්ශවකරුවන් සමඟ සංවාදයක් සඳහා පදනමක් ඉදිරිපත් කරයි.

සෑම විශේෂඥ කණ්ඩායමක්ම බහුත්වවාදය ගැන ඔවුන්ට කීමට අවශ්‍ය කතාව අර්ථ දැක්වීමට දිරිමත් කරනු ලබයි. මේ අන්දමට, මෙම වාර්තා දේශීය යථාර්ථයන් තුළ මුල් බැස ඇති අතර, ප්‍රතිපත්ති සහ භාවිතාව කෙරෙහි තිබිය හැකි ඉහළම බලපෑම ඇති කිරීම සඳහා සැලසුම් කර ඇත.

දර්ශක සහ විවිධත්ව ගැටලු පිළිබඳ ප්‍රමුඛ පෙළේ විශේෂඥයින්ගෙන් සමන්විත ජාත්‍යන්තර තාක්ෂණික උපදේශක කණ්ඩායමක් විසින් නිරීක්ෂකයට මඟ පෙන්වනු ලබයි.

# ගෝලීය බහුත්වවාදය තක්සේරු කිරීමේ නිරීක්ෂක රාමුව

රටෙහි පැතිකඩ

| බැඳීම් | භාවිතාවන් | නායකත්වය | කණ්ඩායම් පදනම් කොටගත් අසමානාත්මතාවන් | අන්තර්කණ්ඩායම් සබඳතා + අයිතිවීම |
|---|---|---|---|---|
| ජාත්‍යන්තර බැඳීම් | ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම | දේශපාලන පක්ෂ | දේශපාලනික | අන්තර්කණ්ඩායම් ප්‍රචණ්ඩත්වය |
| ජාතික බැඳීම් | දත්ත රැස්කිරීම | පුවත් මාධ්‍ය | ආර්ථික | අන්තර්කණ්ඩායම් විශ්වාසය |
| සමස්තය ඇතුළත් කරන පුරවැසිභාවය | හිමිකම් කියාපෑම හා තර්ක ඉදිරිපත් කිරීම | සිවිල් සමාජය | සමාජීය | ආයතන කෙරෙහි විශ්වාසය |
| | | පෞද්ගලික අංශය | සංස්කෘතික | අන්තර්කරණය හා පිළිගැනීම |
| | | | යුක්තියට ඇති ප්‍රවේශය | සමාජයේ හවුල් හිමිකාරිත්වය |

නිර්දේශ

# අන්තර්ගතය


විධායක සාරාංශය 7

රටෙහි පැතිකඩ 10

I වන කොටස. බැඳීම් 13
1. ජාත්‍යන්තර බැඳීම් 14
2. ජාතික බැඳීම් 16
3. සමස්තය ඇතුළත් කරන පුරවැසිභාවය 17

II වන කොටස. භාවිතාවන් 19
4. ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම 20
5. දත්ත රැස්කිරීම 21
6. හිමිකම් කියාපෑම හා තර්ක ඉදිරිපත් කිරීම 22

III වන කොටස. බහුත්වවාදය සඳහා නායකත්වය 25
7. දේශපාලන පක්ෂ 26
8. පුවත් මාධ්‍ය 27
9. සිවිල් සමාජය 29
10. පෞද්ගලික අංශය 32

IV වන කොටස. කණ්ඩායම් පදනම් කොට ගත් අසමානාත්මතාවන් 34
11. දේශපාලනික අසමානාත්මතාවන් 35
12. ආර්ථික අසමානාත්මතාවන 36
13. සමාජීය අසමානාත්මතාවන් 38
14. සංස්කෘතික අසමානාත්මතාවන 40
15. යුක්තියට ඇති ප්‍රවේශය 42

V වන කොටස. අන්තර්කණ්ඩායම් සබඳතා සහ අයිතිවීම 44
16. අන්තර්කණ්ඩායම් ප්‍රචණ්ඩත්වය 45
17. අන්තර්කණ්ඩායම් විශ්වාසය 47
18. රාජ්‍ය ආයතන කෙරෙහි විශ්වාසය 49
19. අන්තර්කරණය සහ පිළිගැනීම 50
20. සමාජයේ හවුල් හිමිකාරිත්වය 51

නිර්දේශ 53

හදවීර 55

ආශ්‍රිත ග්‍රන්ථ 62

# විධායක සාරාංශය

## සමස්ත ලකුණු: 6

රටේ දෙමළ ජනගහනය තුළින් නැඟී ආ ප්‍රතිරෝධී බලවේග වලට එරෙහිව රජය හමුදාමය ජයග්‍රහණය ප්‍රකාශයට පත් කර වසර 13 කට පසුව, කණ්ඩායම් පාදක කොටගත් බැහැර කිරීම්වල සහ අසමානාත්මතාවන්ගේ සම්පූර්ණ පිරිවැය කෙතරම්ද යන්න ශ්‍රී ලංකාවේ දරුණු ආර්ථික ගැටලු මඟින් හෙළිදරව් කරමින් පවතී. ශ්‍රී ලංකාව සඳහා වන ගෝලීය බහුත්වවාදය පිළිබඳ නිරීක්ෂකයෙහි වාර්තාව සමාජ-ආර්ථික භේදනයන්ට සංවේදී වෙමින් ආගමික හා ජනවාර්ගික පදනම්වල විවිධත්වයන් ඔස්සේ අවධානය යොමු කරයි. මෙම වාර්තාව සියලු ජනතාවට ප්‍රතිලාභ සැලසෙන පරිදි අර්ථවත් ආකාර වලින් බහුත්වවාදය ශක්තිමත් කිරීම සඳහා ඇති හැකියාව කෙරෙහි අවධානය යොමු කරයි.

ශ්‍රී ලංකාවේ අඩිතාලම තුළම මුල්බැස ඇත්තේ අදටත් නොනැසී පවතින හා ගැඹුරු අසමානාත්මතාවන්ට සහ ගැටුම් වලට සහාය දෙන ශක්තිමත්, කණ්ඩායම් මත පදනම් වූ බහුතර ප්‍රවණතාවන් ය. මැතිවරණ ජයග්‍රහණය කිරීම සඳහා බැහැර කිරීමේ ප්‍රතිපත්ති සකස් කිරීම මඟින් දේශපාලන පක්ෂ පුරුද්දක් ලෙස ප්‍රජාතන්ත්‍රවාදය අඩපණ කරති. මෙම ප්‍රතිපත්ති, ක්‍රමයෙන්, ගැඹුරු කණ්ඩායම් පදනම් කරගත් බෙදීම් වලට දායක වේ. එහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන අස්ථාවරත්වය මඟින් බැහැර කිරීම් සහ අතීත ගැටුම් වල ප්‍රභවයන් පවත්වා ගෙන යන ආණ්ඩුකරණ රටාවන් යළි නිෂ්පාදනය කරයි. කෙසේවෙතත්, සැබෑ සංහිඳියාව කෙරෙහි අවධානය යොමු කිරීමෙන් සහ ජයග්‍රාහකයෙකුගේ සාමය පැතිරවීමට රජය තුළ ඇති ප්‍රවණතාවය ආපසු හැරවීම මඟින් වෙනස සහ ප්‍රගතිය සඳහා කළ හැකි දේ තවමත් පවතී.

### නෛතික බැඳීම්

ශ්‍රී ලංකාව බහුත්වවාදය ප්‍රවර්ධනය කරන ජාත්‍යන්තර සම්මුතීන් සහ මෙවලම් රාශියකට අත්සන් කර ඇති නමුත්, සිදු වී ඇතැයි කියන්නාවූ යුද අපරාධ වැනි තීරණාත්මක කරුණු වලදී, ඒවා ක්‍රියාවට නැංවීමේ අඩුපාඩු ඇත. 1997 දී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව (HRCSL) ස්ථාපිත කිරීම රටේ ජාත්‍යන්තර සහ දේශීය බැඳීම් ශක්තිමත් කිරීමට දායක වූ අතර, මෙම කැපවීම් ක්‍රියාවට නැංවීමේදී එයට යම් කාර්යභාරයක් ඉටු කළ හැකි වේ. කෙසේවෙතත්, මෑතකාලීනව සිදුවූ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ හේතුවෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව එහි ස්වාධීනත්වය කෙරෙහි එල්ල වන අභියෝග වලට මුහුණ දෙමින් සිටී.

වඩාත් බහුත්වවාදී ශ්‍රී ලංකාවක් සඳහා නෛතික පදනම් ශක්තිමත් කිරීමේදී අභියෝග රාශියක් පවතී. විශේෂයෙන්ම, දශක ගණනාවක් ඔස්සේ පැවති ගැටුම තුළ සිදුවූ මානව හිමිකම් උල්ලංඝනයන් වෙනුවෙන් වගවීමේ අඩුවක් පවතී. නිදසුනක් වශයෙන්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ස්වාධීනත්වය කෙරෙහි ඇති ජාත්‍යන්තර බැඳීම් සහ අභියෝග වෙනුවෙන් තනි පුද්ගල පැමිණිලි යාන්ත්‍රණයන් රජය විසින් ප්‍රතික්ෂේප කර ඇත. මෙම පියවර බලහත්කාර අතුරුදහන් කිරීම් සහ සිදුකර ඇතැයි චෝදනා කරන යුද අපරාධ වෙනුවෙන් යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට සෘජුවම බාධා කරයි.

### භාවිතාවන් සහ නායකත්වය

රාජ්‍ය සේවයට එක සමාන ලෙස පුද්ගලයන් බඳවා ගැනීම සඳහා රාජ්‍යයේ කැමැත්තෙහි සැලකිය යුතු පරතරයක් පවතී. ශ්‍රී ලාංකීය දෙමළ, ඉන්දියානු දෙමළ සහ මුස්ලිම් වැනි ජනවිකාස සුළුතරයන් සිවිල් සේවය තුළ සියයට 10 කටත් අඩුවෙන් සහ හමුදාවෙන් සියයට 5 කටත් අඩුවෙන් සමන්විත වන බව ඇස්තමේන්තු කර ඇත. නිදසුනක් වශයෙන්, මහජන විරෝධතා පෑම සැමට හිමි අයිතියක් වන අතර, ජනවිකාස බහුතරය හිමිකම් කියාපාන විට රාජ්‍යය වැඩියෙන් ප්‍රතිචාර දක්වන බව විශ්ලේෂකයෝ සඳහන් කරති. සිංහල බෞද්ධ බහුතරයට වරප්‍රසාදිත තත්ත්වයක් ප්‍රදානය කරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ භාෂාව මඟින් මෙම යථාර්ථයට සහයෝගය ලබාදෙයි.

සුළුතර කණ්ඩායම් වල විවිධ වූ ජීවන අත්දැකීම් බොහෝ විට රජයේ ප්‍රතිපත්ති සහ දත්ත රැස්කිරීමේ ක්‍රම මඟින් ඉස්මතු නොකරයි. නිදසුනක් වශයෙන්, කණ්ඩායම් මත පාදක කොටගත් සමාජ සහ ආර්ථික දත්ත රැස්කිරීමක් සිදුනොකෙරේ. එහි ප්‍රතිඵලයක් ලෙස, ජීවන තත්ත්වයන් ලිහිල්ව අනුමානය කළ හැකි වන්නේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයෙහි සමානාත්මතාවය පිළිබඳ භූගෝලීය දත්ත වලින් පමණකි. විශේෂයෙන්ම කාන්තා ගෘහ-මූලික කුටුම්බයන් ගත් කළ, මිලිටරීකරණය වූ තත්ත්වයන් තුළ ප්‍රචණ්ඩත්වයට සහ අපයෝජනයට මෙම කාන්තාවන් ගොදුරුවීමේ අවදානම වැඩි වී තිබියදීත්, ජනවාර්ගික සහ ආගමික සුළුතරයන්ට අයත් කාන්තාවන්ගේ අත්දැකීම් පිළිබඳව දත්ත රැස්කිරීම සිදු නොකෙරේ.

විවිධ ඇදහිලි සහ විශ්වාසයන්ට අයත් ශ්‍රී ලාංකිකයන් සඳහා වඩා පුළුල් පරාසයක අයිතිවාසිකම් පුද්ගලික නීති මඟින් ලබා දෙයි. බහුත්වවාදය ශක්තිමත් කිරීමට ක්‍රියාමාර්ග ගොඩනැඟීම සඳහා පදනම ලෙස මෙය ක්‍රියා කළ හැක. අවසනාවකට මෙන්, වත්මන් පුද්ගලික නීති වල විෂය පථය අඩු කිරීමට අදහස් කරන් එකම රටක්, එකම නීතියකී ප්‍රතිපත්තිය ඉදිරියට ගෙන යාමේ වර්තමාන ප්‍රයත්නයන්, බහුත්වවාදය සඳහා ඇති මෙම අවස්ථාව සැලකිය යුතු අවදානමකට ලක් කරයි.

## කණ්ඩායම් පාදක කොටගත් අසමානාත්මතාවන් සහ අන්තර්-කණ්ඩායම් සබඳතා සහ අයිතිවීම

විශේෂයෙන්ම ජාතික සහ රාජ්‍ය මට්ටම් වල දේශපාලන නායකත්වය තුළ ඌන නියෝජනය දරුණු ය. 2021 දී ජාතික මට්ටමේ රජයේ අමාත්‍යංශ 32 න් කිසිදු අමාත්‍යංශයකට ජනවාර්ගික ආගමික සුළුතරයක පුද්ගලයෙකු නායකත්වය සැපයුවේ නැත. මීට අමතරව, උපජාතික මට්ටමින් ක්‍රියාත්මක වන රාජ්‍ය මට්ටමේ අමාත්‍යංශ 42 න් සුළුතර ප්‍රජාවක සාමාජිකයෙකු විසින් නායකත්වය සපයනු ලැබුවේ එක් අමාත්‍යංශයක් සඳහා පමණි. නිරීක්ෂක තක්සේරුව සිදු කෙරෙන අතරතුර, කැබිනට් අමාත්‍යවරුන් 27 දෙනාගෙන් එක් අයෙකු පමණක් කාන්තාවක් වූ අතර, ජාතික ව්‍යවස්ථාදායකයේ ආසන 225 න් කාන්තාවන්ට හිමි වී තිබුණේ ආසන 13 ක් පමණි.

ශ්‍රී ලාංකීය සමාජයේ සෑම අංශයක් කෙරෙහිම කාන්තා දායකත්වය තවදුරටත් වර්ධනය කිරීමේ අවස්ථාවක් පවතී. අධ්‍යාපනය සඳහා වන නිදහස් ප්‍රවේශය ශ්‍රී ලංකාවේ ඉහළ සාක්ෂරතා අනුපාතය ශක්තිමත් කරයි; සහ, ඇත්ත වශයෙන්ම, ද්වීතීයික අධ්‍යාපනය සඳහා කාන්තාවන් ඇතුළත් කර ගැනීම පිරිමින් ඇතුළත් කර ගැනීමට වඩා සුළුවෙන් වැඩි ය. කෙසේවෙතත්, වතුකරයේ සහ ඇඟලුම් කර්මාන්තයේ සූරාකෑමේ තත්ත්වයන්ට මුහුණ දෙන්නන් වැනි අවදානම් සහිත ආර්ථික අංශ වල සිටින අසමානුපාතික කාන්තාවන් සංඛ්‍යාව, වඩාත් පුළුල් කණ්ඩායම් පාදක කොටගත් අසමානාත්මතාවන් කරා ඇදවැටේ. ආර්ථිකය සහ රජය තුළ කාන්තාවන් වඩා හොඳින් ඇතුළත් කිරීමට ගන්නා ප්‍රයත්නයන් සමඟ ඉහළ ගුණාත්මකභාවයකින් යුත් අධ්‍යාපනය සහතික කිරීම මඟින් කාන්තාවන් විසින් ලබා දිය හැකි දායකත්වයන් සැලකිය යුතු ලෙස පුළුල් කිරීමට උපකාරී විය හැක.

## නිරීක්ෂකයෙන් ඉගෙනගත හැකි පාඩම්/කරුණු

ශ්‍රී ලංකාව තුළ ඡන්දදායකයන්ගේ සහභාගිත්වය ඉහළ මට්ටම් වල පවතින නමුත්, සැමට සාධාරණ සහ සමාන නියෝජනයක් සඳහා කැපී පෙනෙන අභියෝග පවතී. ප්‍රකාශිත ඡන්ද ප්‍රමාණය වැනි ප්‍රජාතාන්ත්‍රික සම්මතයන් හට බහුත්වවාදය ශක්තිමත් කිරීමට දරන ප්‍රයත්නයන් සත්‍ය වශයෙන්ම නිෂේධනය කළ හැකි ආකාරය සහ සමහරවිට වැළැක්වීම වුවද සිදු කළ හැකි ආකාරය පිළිබඳව ආවර්ජනය කිරීමට මෙම යථාර්ථය මඟින් අවස්ථාවක් සපයා දෙයි. ශ්‍රී ලංකාවේ ප්‍රජාතාන්ත්‍රික ක්‍රමවේදය මඟින් දේශපාලන වාසි තකා ප්‍රබල බහුතරවාදයට සහ ජනවාර්ගික කණ්ඩායම් වල එදිරිවාදීකමට අනුබල දෙයි. මෙවැනි ප්‍රවණතා වඩා ශක්තිමත් බහුත්වවාදී ප්‍රතිපත්ති සහ භාවිතාවන් පෝෂ්‍ය කිරීමට දරන උත්සාහයන් අවහිර කරයි.

දෙමළ ඊලාම් විමුක්ති කොටි (එල්ටීටීඊය) පරාජයෙන් පසු දශක කිහිපය තුළ, රජය විසින් ජයග්‍රාහකයෙකුගේ සාමයී පනවා ඇති අතර, එය සංහිඳියාව සඳහා ඇති අවශ්‍යතාවය හීන කරයි. මෙම ප්‍රවණතාවය උග්‍ර මිලිටරීකරණය චිරස්ථායි කිරීම තුළින් පෙන්නුම් කරන පරිදි, පවතින තත්ත්වයෙහි ප්‍රතිපත්ති සහ භාවිතාවන් පවත්වා ගෙන යයි. කෙසේනමුත්, රාජ්‍යයෙහි අධි-බහුතරවාදී නැඹුරුවීම් රටේ වත්මන් සමාජ ආර්ථික අරගල හා සමඟ පැටලී ඇති බවට ජනගහනය

තුළ අවබෝධයක් මතුවෙමින් පවතී. විශේෂයෙන්ම අර්ථවත් සංහිඳියාවක් සාක්ෂාත් කර ගැනීම සඳහා මෑත දේශපාලන අධිෂ්ඨානය සැලකිල්ලට ගන්නා විට, මෙම තත්ත්වයෙහි තිරසරභාවයක් නොමැතිකම වෙනස සඳහා ශක්තිසම්පන්න කවුළුවක් නිර්මාණය කරයි.

යුද අපරාධ සහ අතුරුදහන් කිරීම් වෙනුවෙන් යුක්තිය සොයන අර්ථවත් සංහිඳියාවකට මාරුවීම, විනාශකාරී ගැටුමෙහි උරුමයන් ආමන්ත්‍රණය කරන වැඩියෙන් අන්තර්කරණය කෙරෙන ජාතික කතා වස්තුවක් මෙන්ම, වඩාත් බහුත්වවාදී ප්‍රතිපත්ති සහ භාවිතාවන් හැඩගැස්වීමට හැකියාව ලබා දෙයි.

## නිර්දේශ

මෙම නිරීක්ෂකයෙහි නිර්දේශ විශේෂඥයින්, ක්‍රියාකාරීන් සහ පාර්ශවකරුවන් ශ්‍රී ලංකාව තුළ දිගු කලක් තිස්සේ ඉල්ලා ඇති දේ ප්‍රතිරාවය කරන අතර, රට තුළ බහුත්වවාදය සඳහා මංපෙත් ගණනාවක් සපයා දෙයි.

- එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය (UNHRC) විසින් ජිනීවා හි 43 වන සැසි වාරයේ දී සකස් කළ යුතු යැයි යෝජනා කළ පරිදි, නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකින් දිවයින බහු-ජනවාර්ගික, බහු-භාෂාමය, බහු-ආගමික සහ බහු-සංස්කෘතික රටක් ලෙස සංග්‍රහයක් සකස් කිරීම. ඇතැම් කණ්ඩායම් වෙත යොමු කර ඇති පක්ෂපාතී ප්‍රතිපත්ති වල බලපෑම හීන කිරීම සඳහා මෙයට ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළ හැකි අතර, බහුත්වවාදයට සහය දෙන නීති සහ ප්‍රතිපත්ති සඳහා රාමුව ලෙස කටයුතු කළ හැකි වේ.

- බහුත්වවාදය පිළිබඳව සිවිල් සේවකයින් පුහුණු කිරීම සඳහා රාජ්‍ය නොවන සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම. මෙම කාර්යයට ඉහළ මට්ටමේ නිලබලධරයන් සහ රාජ්‍ය සේවකයන් සඳහා වැඩිදුර ද්විභාෂා පුහුණු ඇතුළත් විය හැක. රාජ්‍ය භාෂා දෙකෙන්ම සපයනු ලබන මහජන සේවාවන් පුරවැසියන්ගේ ප්‍රවේශය වැඩිදියුණු කරනු ඇත.

- රාජ්‍ය සේවය තුළ සියලුම ජනවාර්ගික සහ ආගමික කණ්ඩායම් වල සමාන නියෝජනය ප්‍රවර්ධනය කිරීම සඳහා කුසලතා පාදක කොටගත් භාවිතාවන් කරා ආපසු යාම. එසේ කිරීමෙන්, පුරවැසියන්ට සමානව සලකනු ලබයි.

- ජනවාර්ගික-ආගමික ආතතීන් අවම කර, ප්‍රජාවන් හරහා ක්‍රියාකාරී සම්බන්ධවීම් ප්‍රවර්ධනය කිරීමට උපකාරී වීම සඳහා දිස්ත්‍රික් සංහිඳියා කමිටු යළි සක්‍රීය කිරීම. මෙම කාර්යය හරහා ගැටුම් නිරාකරණය ප්‍රවර්ධනය කිරීම මඟින් වඩා පුළුල් සංහිඳියාවක් කරා යාමට රට දරන උත්සාහයන්හි දී සහයෝගය දැක්විය හැකිය.

- සමාජය තුළ බහුත්වවාදය ප්‍රවර්ධනය කරන්නාවූ, බහුත්වවාදය සහ සමාන අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාවක් ස්ථාපිත කිරීම. මෙම කොමිෂන් සභාවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ හඳුනාගෙන ඇති ගැටලු සම්බන්ධයෙන් කටයුතු කළ හැකි අතර, එවැනි නීති බහුත්වවාදය ප්‍රවර්ධනය කිරීම හෝ එයට බාධා කිරීම සිදු කරන්නේ කෙසේද යන්න සම්බන්ධ නිරීක්ෂණ සමග ඕනෑම යෝජිත නීතියක් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමු කළ හැකි වනු ඇත.

# රටෙහි පැතිකඩ

**1931 සිට සර්වජන ඡන්ද බලය භුක්ති විඳිමින් සිටින ශ්‍රී ලංකාව ආසියාවේ පැරණිතම ප්‍රජාතන්ත්‍රවාදය නියෝජනය කරයි.**

වසර 450 කට ආසන්න කාලයක් තුළ පෘතුගීසි සහ ලන්දේසි පාලනයෙන් සමන්විත වූ යටත් විජිත පාලනයෙන් පසුව ශ්‍රී ලංකාව 1948 පෙබරවාරි මස බ්‍රිතාන්‍යයන්ගෙන් නිදහස ලබා ගත්තේය. රටෙහි යටත් විජිත ඉතිහාසය සහ ඉන්දියානු ශිෂ්ටාචාරයේ බලපෑම වර්තමානයේ මිලියන 22 ක පමණ ජනතාවකින් සමන්විත වන බහු-ජනවාර්ගික සහ බහු-ආගමික සමාජයකට දායක වී ඇත.

අවසාන සංගණනයට අනුව, සිංහල ජනතාව ආසන්න වශයෙන් ජනගහනයෙන් 74.9 ක් ද, ශ්‍රී ලාංකික දෙමළ ජනතාව සියයට 11.2 ක් ද, ඉන්දියානු දෙමළ ජනතාව සියයට 4.2 ක් ද, යෝනක (මුස්ලිම්) ජනතාව සියයට 9.2 ක් ද වෙති. ආගමික වශයෙන් ගත් කළ, දිවයිනේ සියයට 70.2 ක් බෞද්ධ, සියයට 12.6 ක් හින්දු, 7.4 ක් ක්‍රිස්තියානි (මෙයින් සියයට 6.1 ක් රෝමානු කතෝලික වෙති) සහ සියයට 9.7 ක් මුස්ලිම් වෙති.[1] මුස්ලිම්වරුන් මූලික වශයෙන් දෙමළ භාෂාව කතා කරන අතර, බොහෝ තරුණ මුස්ලිම් වරු සිංහල භාෂාව කතා කරති. එහෙත්, මෙම ප්‍රජාව දිගු කලක් තිස්සේ ඉස්ලාමය සිය අනන්‍යතාවය ලෙස භාවිතා කර ඇත (මේ හේතුවෙන් එය රටෙහි ජනවාර්ගික දෙමළ ජනතාවගෙන් වෙනස් වෙයි).

රටේ ජනවාර්ගික-ආගමික විවිධත්වය මඟින් සමස්තය හරහා යන සංකීර්ණ බෙදීම් උත්පාදනය කරයි. නිදසුනක් ලෙස, අද, සිංහල සහ දෙමළ ජනතාවගෙන් සියයට 10 ක් පමණ ක්‍රිස්තියානි වන අතර, යමෙකුට සිංහල හින්දු හෝ දෙමළ බෞද්ධයෙකු හමුවන්නේ කලාතුරකිනි. එහෙත්, පුරාණ කාලයේ බෞද්ධාගම දෙමළ ප්‍රදේශ වල ප්‍රබල ලෙස පැවතුණි (ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ යන දෙකෙහිම). විශේෂයෙන්ම නිදහසින් පසු ශ්‍රී ලංකාව ආක්‍රමණය කළ බහුතරවාදී සමාජ පරිසරය අවාසනාවන්ත ලෙස සිංහල හා දෙමළ ජනයා බෙදාහදා ගන්නා පොදු බෞද්ධ සබඳතාව කෙරෙහි වූ අවධාරණය ඉවත් කළේය. ඒ වෙනුවට එය ජනවාර්ගික-ආගමික බෙදීම් සහ පටු මානසිකත්වය අවධාරණය කර එමඟින් බොහෝ සෙයින් ප්‍රචණ්ඩත්වයට දායක විය. ඒ අනුව, මෙම විශ්ලේෂණයෙහි ප්‍රධාන විවිධත්ව වර්ග ලෙස ආගම සහ ජනවාර්ගිකත්වය භාවිතයට ගෙන ඇති අතර, ඒ සමඟ කුලය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ සමාජ-ආර්ථික අසමානාත්මතාවන් වැනි අනන්‍යතා සහ බෙදීම් අවශ්‍ය පරිදි සාධක ලෙස ඉදිරිපත් කර ඇත.

දකුණු ආසියාව පුරා ප්‍රධාන ලෙස අනන්‍යතාව සලකුණු කරන්නක් ලෙස කුලය ක්‍රියාත්මක වන අතර, නිදහසින් පසු ශ්‍රී ලංකාව තුළ එහි ක්‍රියාකරවීම අඩු වී ඇත. සමස්තයක් ලෙස ගත් කළ, දෙමළ ජනයා අතර කුලභේදය වඩාත් කැපී පෙනේ. සිංහලයන් අතර, පෞද්ගලික ක්ෂේත්‍රයෙන් පිටත බොහෝ සමාජීය අන්තර්-ක්‍රියා සිදුවන්නේ කුල ක්‍රමය ගැන සඳහන් කිරීමෙන් තොරව ය. කෙසේවෙතත්, විවාහයේදී සහ පළාත් පාලන මැතිවරණ වලදී කුලය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. එහි ප්‍රතිඵලය වන්නේ, කුලය බොහෝ අනන්‍යතා අතරින් එකක් වන අතර, සිංහලයින් අතර එහි වැදගත්කම අතීතයට වඩා අඩුවෙන් අදාළ වී, අසල්වැසි ඉන්දියාවේ මෙන් ප්‍රකටව භාවිතා නොකිරීමයි.

1931 සිට සර්වජන ඡන්ද බලය භුක්ති විඳිමින් සිටින ශ්‍රී ලංකාව ආසියාවේ පැරණිතම ප්‍රජාතන්ත්‍රවාදය නියෝජනය කරයි. රටේ මහජනතාව වෙනත් ඕනෑම ආකාරයක රජයකට වඩා ප්‍රජාතන්ත්‍රවාදයට වැඩි මනාපයක් ඇති බව පැහැදිලිව පෙන්වති.[2] මෙය සෑම තැනකම - කාන්තාවන්, පිරිමින්, තරුණ තරුණියන් සහ තරුණ නොවන අය අතර එසේ වේ.[3] ජනාධිපති ගෝඨාභය රාජපක්ෂට සහ ඔහුගේ රජයට එරෙහිව 2021 සහ 2022 වසර වල පැන නැඟුණු විරෝධතා, සහ රාජපක්ෂ පවුල දේශපාලනයෙන් ඉවත් විය යුතු යැයි ජනවාර්ගික-ආගමික පදනම් හරහා කරන ලද බලකිරීම්, දිවයින තුළ ප්‍රකාශනයේ නිදහස කෙතරම් දුරට ගැබ්ව ඇති ද යන්නට සාක්ෂි දරයි.[4] ඒ සමගම, රට අස්ථාවර කරන ප්‍රචණ්ඩත්වය මධ්‍යයේ ප්‍රජාතාන්ත්‍රිකව රට බරපතළ ලෙස වැරදි මාර්ගයන්ට යළිත් යොමු වීම අත්විඳ ඇත. වාමාංශික කැරලි දෙකක් - පළමුවැන්න 1971 සහ දෙවැන්න 1988-89 අතර, සිංහල තරුණ තරුණියන් දහස් ගණනක් ඝාතනය කිරීමට හේතු විය. කෙසේවෙතත්, වඩාත්ම විනාශකාරී ප්‍රචණ්ඩත්වයට හේතු වූයේ, එල්ටීටීඊ නායකත්වයෙන් යුත් බෙදුම්වාදී කැරලිකරුවන් සහ ප්‍රධාන වශයෙන් සිංහල බෞද්ධ රජය අතර දශක තුනකට ආසන්න කාලයක් පැවති සිවිල් යුද්ධය යි.

පළමු දෙමළ-විරෝධී ජනවාර්ගික කෝලාහලය 1956 දී සිදු වූ අතර, ඉන්පසුව 1958 දී තවදුරටත් කෝලාහල සිදුවුණි. මෙය ඇතිවූයේ රජය විසින් සිංහල භාෂාව එකම රාජ්‍ය භාෂාව ලෙස අධිස්ථාපනය කිරීම හේතුවෙනි. 1977 දී දෙමළ-විරෝධී ප්‍රචණ්ඩත්වය තවත් ඇතිවූ නමුත්, දරුණුතම දෙමළ-විරෝධී කෝලාහලය ඇති වූයේ 1983 ජුලි මාසයේ දී දෙමළ කැරලිකරුවන් සැඟව සිට හමුදා සෙබළුන් 13 දෙනෙකු ඝාතනය කිරීමෙන් පසුව ය. වසර 1983 සිවිල් යුද්ධයෙහි ආරම්භය සලකුණු කරයි; එය 2009 වසරේ මැයි මස දක්වා පැවති අතර, මිනිසුන් 100,000 කට වැඩි සංඛ්‍යාවක් ඝාතනයට ලක් විය. බෙදුම්වාදී දෙමළ ඊලාම් කොටි (එල්ටීටීඊ) සංවිධානයේ පරාජය ජනවාර්ගික ගැටුම අවසන් කරන්නට ඇති නමුත්, එම කාලය තුළ සිදු කරන ලදැයි චෝදනා කරන යුද අපරාධ ශ්‍රී ලංකාවේ, විශේෂයෙන්ම, බටහිර රටවල් සමඟ පවතින රාජ්‍යතාන්ත්‍රික කටයුතු ව්‍යාකූල කර ඇත. එල්ටීටීඊයෙහි පරාජය, දෙමළ ජනතාවගේ නිත්‍යානුකූල දුක්ගැනවිලි සම්බන්ධයෙන් ඔවුන් සමඟ සංහිඳියාව ඇති කර ගැනීම සඳහා මඟ පෑදීමට සහ වඩාත් බහුත්වවාදී පශ්චාත්-යුද සමාජ පරිසරයක් ගොඩනැඟීමට රාජ්‍යය දිරිමත් කිරීම වෙනුවට, එය සිංහල බෞද්ධ විජයග්‍රාහිත්වයට දායක වී ඇත.

සිවිල් යුද්ධය දහස් ගණන් දෙමළ ජනතාව දිවයිනෙන් පලා යාමට හේතු වූ අතර, ඔවුහු දැන් ඔවුන්ගේ පවුල් වලට සහ ප්‍රජාවට එරෙහිව සිදු කළ කුරිරුකම් වෙනුවෙන් වගවීම ඉල්ලා සිටින ප්‍රබල ඩයස්පෝරාවකින් සමන්විත වෙති. ශ්‍රී ලංකා රජය දෙමළ ජනතාව සමඟ සංහිඳියාව ඇති කර ගැනීම සඳහා සීමිත පියවර ගෙන ඇති අතර, එය යුද අපරාධ වලට සම්බන්ධ බව ප්‍රතික්ෂේප කරයි. දෙමළ-විරෝධී දේශපාලනය ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රාන්තයේ ද ඒවා ක්‍රියාත්මක කර ඇති අතර, මෙය ශ්‍රී ලංකාව සමඟ ගනුදෙනු කිරීමේ දී ඉන්දීය රජය විසින් සැලකිල්ලට ගත යුතු හැඟීමකි. මෙය දිවයින තුළ චීනය සිටීම ව්‍යාප්ත වීම නිසා ඉන්දියානු කනස්සලුවට එකතු කරන අතර ය.



Photo: Shutterstock/SLSK Photography

සිවිල් යුද්ධය අවසන් වීමෙන් පසු, ශ්‍රී ලංකාව මුස්ලිම්-විරෝධී ප්‍රචණ්ඩත්වය ද අත් විඳ ඇත. එවැනි කෝලාහල වල බරපතලම සිද්ධීන් 2014, 2018, සහ 2019 යන වසර වල සිදු විය. මෙතෙක් දෙමළ සහ මුස්ලිම් ජනයා ඉලක්ක කරගෙන ඇති ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය, අනුප්‍රාප්තික ශ්‍රී ලංකා රජයන් විසින් අන් සියල්ලන් අතපසු කරමින් සිංහල බෞද්ධයන් සවිබල ගැන්වීමට ගන්නා ප්‍රයත්නයන්ට සෘජුවම සම්බන්ධ වේ. මේ සියල්ල සිදුකරන්නේ මිත්‍රත්වය මැද සහජීවනයෙන් ජීවත් වන ප්‍රජාවන්ගේ ඉතිහාසයක් නොසලකා හරිමිනි. ජනවාර්ගික-ආගමික රිස්සීම ප්‍රවර්ධනය කරන අනුග්‍රාහකයින් රාශියක් දිවයින තුළ සිටින අතරම වුවද, භේදභින්න කිරීමේ ප්‍රයත්නයන් ශ්‍රී ලංකාව සැබෑවටම ජනවාර්ගික තන්ත්‍රයක් බවට පත්කිරීමට හේතු වී තිබේ. කෙටියෙන් කිවහොත්, බහුතරවාදී ශ්‍රී ලංකාව ප්‍රජාතාන්ත්‍රිකව පසු බැස ඇති අතර, එහි ඔරොත්තු දීමේ හැකියාව ඇති මිනිසුන් අතර බොහෝ දෙනෙක් බහුත්වවාදය මධ්‍යයේ සහජීවනයෙන් සිටීමට ඇති හැකියාවට සාක්ෂි දරති. මෙය 2022 දී ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ සහ අගමැති මහින්ද රාජපක්ෂ බලයෙන් පහ කළ දැවැන්ත විරෝධතා මධ්‍යයේ ප්‍රකාශ වූ හැඟීමකි.

විරෝධතා සඳහා ආසන්නම හේතුව වූයේ ගෙවීම් ශේෂ අර්බුදයයි - දිගුකාලීන දූෂණය, අඛණ්ඩ අයවැය හිඟයන් සහ ප්‍රමාණය ඉක්මවා විශාල වූ රාජ්‍ය ව්‍යවසායයන්ගේ ප්‍රතිඵලයක් වූ මෙය - සංචාරක ව්‍යාපාරය සහ විදේශගත සේවයේ නිරත වී සිටින ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රේෂණ කෙරෙහි කඩඣෂෘ-19 න් සිදුවූ බලපෑම මගින් උග්‍ර විය. එය නිදහසින් පසු ශ්‍රී ලංකාවේ දරුණුතම ආර්ථික අර්බුදයට මඟ පෑදුවේය. රට ඉහළ-මධ්‍යම-ආදායම් තත්ත්වයට ළඟාවීමට ආසන්නව තිබුණු නමුත්, ගෙවීම් ශේෂ අර්බුදය විශේෂයෙන් ග්‍රාමීය සහ අඩු-ආදායම්ලාභී ප්‍රජාවන් අතර පුළුල්ව පැතිර ගිය කුසගින්නට හේතු විය. ජාත්‍යන්තර ප්‍රජාව සෙමෙන් ශ්‍රී ලංකාවේ ආධාරයට පැමිණෙනු ඇති අතර, රට, කාලයාගේ ඇවෑමෙන්, අත්‍යවශ්‍ය ද්‍රව්‍ය හිඟය සහ එහි ආර්ථික විපත් හසුරුවාගනු ඇත. කෙසේවෙතත්, මෙම සාමූහික කම්පනය ජනවාර්ගික-ආගමික පදනම් හරහා එකට එකතු වීමට සහ එමඟින් බහුත්වවාදය ශක්තිමත් කිරීමට ජනතාව දිරිමත් කරයිද යන්න තවමත් දැකගත නොහැකිය.

# I වන කොටස.
# බැඳීම්

# 1. ජාත්‍යන්තර බැඳීම්
## සමස්ත ලකුණු: 6

ආගම | **සමස්ත ලකුණු: 6**
ජනවාර්ගිකත්වය | **සමස්ත ලකුණු: 6**

**මේ අනුව ශ්‍රී ලංකාව ජාත්‍යන්තර නෛතික ප්‍රමිතීන් කෙරෙහි බැඳීමක් පෙන්නුම් කරන අතරම, එම ප්‍රමිතීන් රැකගැනීමේදී බලාපොරොත්තු ඉටු නොකරයි.**

සමස්තයක් වශයෙන් ගත් කළ, බහුත්වවාදය ප්‍රවර්ධනය කරන ජාත්‍යන්තර සම්මුතීන්ට දායකවීමේ දී ශ්‍රී ලංකාව දෝෂාරෝපණයෙන් තොර වන අන්දමින් මනාව ක්‍රියාකර ඇත. නිදසුනක් වශයෙන්, ශ්‍රී ලංකාව සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ (ICCPR) පාර්ශවකරුවෙකු වන අතර, දිවයිනේ මෙම ජාත්‍යන්තර සම්මුතියේ පනත ආගමික සහ වාර්ගික අසමගිය ප්‍රවර්ධනය කිරීම තහනම් කර දඬුවම් කරයි. කෙසේවෙතත්, දේශපාලනඥයින් සහ බලගතු අනුග්‍රාහකයින් සහිත බෞද්ධ පූජකයින් දඬුවම් විඳීමෙන් තොරව එවැනි නීති උල්ලංඝනය කරන අතර, 2012 න් පසු මුස්ලිම්-විරෝධී ප්‍රචණ්ඩ ක්‍රියා අධික ලෙස සිදු වූ විට එය විශේෂයෙන් පැහැදිලි විය.[5] මේ අනුව ශ්‍රී ලංකාව ජාත්‍යන්තර නෛතික ප්‍රමිතීන් කෙරෙහි බැඳීමක් පෙන්නුම් කරන අතරම, එම ප්‍රමිතීන් රැකගැනීමේදී බලාපොරොත්තු ඉටු නොකරයි.

දිවයිනේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බහුත්වවාදය කෙරෙහි ධනාත්මකව දිශානත වී ඇත. නිදසුනක් වශයෙන්, නීතියෙන් කටයුතු කළ හැකි සහ ජාත්‍යන්තර ගිවිසුම් වල බැඳීම් මඟින් බලපෑමට ලක්ව ඇති විශේෂ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇත. ව්‍යතිරේක කිහිපයක් සමඟින්, යුරෝපා සංගමයේ සාමාන්‍යකරණය කළ වරප්‍රසාද (GSP+) තීරුබදු වරප්‍රසාද සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය ගිවිසුම් 27 ඇතුළුව, ශ්‍රී ලංකාව සියලු ප්‍රධාන ජාත්‍යන්තර ගිවිසුම් අනුමත කර ඇත. කෙසේවෙතත්, මෙම සමහර ගිවිසුම් හා සම්බන්ධ තනි පුද්ගල පැමිණිලි ක්‍රියාපටිපාටි කිහිපයක් ශ්‍රී ලංකාව අනුමත කර නොමැත. මේවාට බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් වලට එරෙහි සහ ආබාධිතතා සහිත පුද්ගලයින්ගේ පැමිණිලි ඇතුළත් වේ.

මානව හිමිකම් පෙරමුණ ගත් කළ, ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ (UN) සියලුම ප්‍රධාන ජාත්‍යන්තර මානව හිමිකම් සම්මුතීන් අනුමත කර ඇති අතර, සාමාන්‍යයෙන්, ජාත්‍යන්තර මානව හිමිකම් අධීක්ෂණ ආයතන සමඟ සම්බන්ධ වීමේ සහ වාර්තා කිරීමේ යහපත් වාර්තාවක් ඇත.[6] වාර්තාකරුවන් දිවයිනට පැමිණ වාර්තා ඉදිරිපත් කිරීම සමඟින්, වාරික සමාලෝචන සිදුකිරීමට එක්සත් ජාතීන්ගේ සංවිධානය සමඟ එය සම්බන්ධ වී ඇත. 1997 වසරේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව (HRCSL) පිහිටුවීම මානව හිමිකම් කෙරෙහි රටේ කැපවීම හා සම්බන්ධ ධනාත්මක වර්ධනයන් අතර විය. බොහෝ දුරට, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ස්වාධීනව ක්‍රියා කිරීම සඳහා ශක්තිමත් නෛතික විධිවිධාන භාවිතා කර ඇත. කෙසේවෙතත්, මෑතකාලීන ව්‍යවස්ථාමය වෙනස්කම් මෙම ස්වාධීනත්වයට තර්ජනය කරන අතර, ඉදිරියේ දී ඒවා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ වැඩකටයුතු වලට අභියෝග කරනු ඇත.

සමස්තයක් වශයෙන් ගත් කළ, මානව හිමිකම් උල්ලංඝනයන් වෙනුවෙන් වගවීම මතභේදයට තුඩු දේ. යුද අපරාධ චෝදනා සම්බන්ධයෙන් කටයුතු කිරීමට අනුප්‍රාප්තික රජයන්ට පැවති නොහැකියාව සහ ඉතා දරුණු ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) අර්ථවත් ලෙස ප්‍රතිසංස්කරණය කිරීමට හෝ ඉවත හෙළීම කෙරෙහි හෝ ඇති රාජ්‍යයේ විරෝධය මෙයට එක් ප්‍රධාන හේතුවකි. තාවකාලික නීතියක් ලෙස 1979 දී පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදුව, මෙම පනත අඛණ්ඩව ක්‍රියාත්මක කෙරේ. සැකකරුවන් අතිශයින් අසීමිත කාලයක් සඳහා ඇප නොමැතිව දින නියමයක් නොමැතිව රඳවා තබාගැනීම සඳහා එයින් ඉඩ සලසයි. 2019 පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරවලින් පසු ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ බොහෝ මුස්ලිම්වරුන් ද චෝදනා ලැබුවත් - දෙමළ ජාතිකයින් මෙම පනතෙහි ප්‍රධාන ඉලක්කය වෙමින්, විශේෂයෙන්ම සුළු ජාතීන් ඉලක්ක කිරීමට බලධාරීන් විසින් මෙම පනත භාවිතා කර ඇත.

2021 ජුනි මස 10 වෙනි දින යුරෝපා පාර්ලිමේන්තුව විසින් GSP+ සහනය සඳහා ශ්‍රී ලංකාවට ඇති ප්‍රවේශය ඉවත්කර ගැනීම ගැන සලකා බලන ලෙස යුරෝපා කොමිසමෙන් ඉල්ලමින් යෝජනාවක් සම්මත කරනු ලැබුවේ, ත්‍රස්ත්‍රවාදය වැළැක්වීමේ පනත උපයෝගි කර ගන්නා අත්තනෝමතික ආකාරය සහ සුළු ජාතීන්ට එරෙහිව එය මුගුරක් ලෙස භාවිතා කිරීමට ඇති ප්‍රවණතාවය හේතුවෙනි.[7] තවද යුරෝපා සංගමයේ (EU) යෝජනාව 2020 දී සම්මත කරනු ලැබූ 20 වෙනි සංශෝධනය ගැන

මෑත කාලයේදී ශ්‍රී ලංකාව සිය බැඳීම් ක්‍රියාවට නැංවීමේ දී ජාත්‍යන්තර නියෝජිතායතන සමඟ කෙතරම් දුරට සහයෝගිත්වයෙන් ක්‍රියා කරන්නේද යන්න රඳා පවතින්නේ බලයේ සිටින රජය මත ය.

සහ "එහි ප්‍රතිඵලයක් ලෙස අධිකරණයේ ස්වාධීනත්වය පිරිහීම, පාර්ලිමේන්තුවේ පාලනය හීනවීම, සහ ජනාධිපති ක්‍රමය සමග අධික ලෙස බලය රාශිභූත වීම" ගැන බරපතළ කනස්සල්ල පළ කරන අතරම, ආගමික සහ ජනවාර්ගික සුළුතරයින්ට එරෙහිව අඛණ්ඩව කෙරෙන වෙනස්කොට සැලකීම සහ ඔවුන් කෙරෙහි ඇති ප්‍රචණ්ඩත්වය ද සටහන් කර ඇත.[8] දිවයිනේ වඩාත් නරක අතට හැරෙමින් පැවති මූල්‍ය අර්බුදය මධ්‍යයේ ඇතිවූ ජාත්‍යන්තර පීඩනය ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ පුද්ගලයින් අත්අඩංගුවට ගැනීම තාවකාලිකව නවතා දැමීමට රජයට මුලදී බලපෑම් කළේය.[9] කෙසේවෙතත්, 2022 ජූලි මස රනිල් වික්‍රමසිංහ ජනාධිපති වීමෙන් පසු, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ප්‍රධාන වශයෙන් පාලනතන්ත්‍රයට විරෝධී සිංහල ජාතිකයින් වන විරෝධතාකරුවන්ට එරෙහිව ද භාවිතා කර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, දැන් සියලුම ජනවාර්ගික ආගමික ප්‍රජාවන්ගේ ක්‍රියාකාරීන්ට අවශ්‍ය වී ඇත්තේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත විසුරුවා හැරීම දැකීමට ය.

මෑත කාලයේදී ශ්‍රී ලංකාව සිය බැඳීම් ක්‍රියාවට නැංවීමේ දී ජාත්‍යන්තර නියෝජිතායතන සමඟ කෙතරම් දුරට සහයෝගිත්වයෙන් ක්‍රියා කරන්නේද යන්න රඳා පවතින්නේ බලයේ සිටින රජය මත ය. නිදසුනක් වශයෙන්, පසුගිය රජය යටතේ ශ්‍රී ලංකාව 2015 දී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ (UNHRC) යෝජනාවකට සම අනුග්‍රහය දක්වා සිවිල් යුද්ධයෙන් පැන නැඟුණු චෝදනා සඳහා වගකීමට යාන්ත්‍රණ සෙමෙන් නිර්මාණය කිරීමට උත්සාහ දැරීය. කෙසේවෙතත්, සිංහල බෞද්ධ ජාතිකවාදී හැඟීම සතුටු කරමින් බලයට පත්වූ වත්මන් රජය එම යෝජනාවෙන් ඉවත් වූ අතර,[10] මෙය එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය සමඟ දුෂ්කර සබඳතා වලට හේතුවී ඇත.[11] පසුගිය රජය යටතේ, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශේෂ ක්‍රියාපටිපාටි වල වරය දරන්නන් 10 දෙනෙකුට ශ්‍රී ලංකාවට පැමිණීමට ස්ථාවර ආරාධනා ලබා දී තිබුණු අතර, ඔවුන්ගේ නිර්දේශ 400 න් අති බහුතරය ඉහත සඳහන් 2015 එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ යෝජනාවේ ඇතුළත් කර තිබුණු ප්‍රධාන වගකීම්/කැපවීම් 25 ට සම්බන්ධ ඒවා විය.

රටේ පවතින දරුණු ආර්ථික තත්ත්වයට ඍජු සහනය වෙන කවරදාටත් වඩා වැදගත් වන අතර, 2021 දී, යුරෝපා සංගමයේ GSP+ සහන අධීක්ෂණ කමිටුව ශ්‍රී ලංකාවට පැමිණි විට, එම රැස්වීම් වලට පුළුල් පරාසයක ක්‍රියාධරයෝ සහභාගි වූහ.[12] දිවයිනේ ප්‍රජාතාන්ත්‍රික පිරිහීම සම්බන්ධයෙන් යුරෝපා සංගමයේ විශේෂඥයින් ප්‍රකාශ කරන ලද සන්තාපය[13] මඟින් යළිත් පෙන්වා දෙන්නේ ශ්‍රී ලංකාව සිය ජාත්‍යන්තර බැඳීම් වලට ගරු කිරීමට දක්වන කැපවීම බලයේ සිටින පාලන තන්ත්‍රයේ ස්වභාවය මත රඳා පවතින ආකාරය යි. එහෙත් 2022 ජූනි මස විදේශ අමාත්‍යවරයා විසින් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය වෙත කරන ලද ප්‍රකාශය යමෙක් විශ්වාස කිරීමට නම්, රටේ බංකොලොත් තත්ත්වය, එහි ජාත්‍යන්තර කැපවීම් වඩාත් බැරෑරුම් ලෙස පිළිපැදීමට රජයට බලපෑම් කරනවා විය හැකිය.[14] අනෙක් අතට විදේශීය අධීක්ෂණයෙන් තොරව දේශීය යාන්ත්‍රණයක් භාවිතා කරමින් චෝදනා ලබා ඇති යුද අපරාධ විමර්ශනය කිරීමට අවශ්‍ය කරන බව ද රජය පැහැදිලි කර ඇත - මෙම ස්ථාවරය 2022 සැප්තැම්බර්-ඔක්තෝබර් මාස වල එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ රැස්වීම් අතරතුර දී යළි යළිත් ප්‍රකාශ කරන ලද්දකි.[15]

වෛරී ප්‍රකාශ සාපරාධී වරදක් බවට පත් කරන සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICCPR) 2007 දී බලාත්මක කිරීම, ශ්‍රී ලංකා රජය සිය ජාත්‍යන්තර සම්මුතීන් ඉටුකිරීමට උත්සාහ කිරීමේ දී ගන්නා ලද ධනාත්මක පියවරක් ලෙස සැලකිය හැකිය. අවාසනාවකට මෙන්, මෙම නීතිය ක්‍රියාත්මක කිරීම සහ උපයෝගී කර ගැනීම විෂම වී ඇති අතර, අපේක්ෂිත ප්‍රතිඵල ලඟා කර ගෙන නොමැත. සමහර අවස්ථාවලදී, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියෙහි අඩංගු දැඩි නීති වෛරී ප්‍රකාශ වලට එරෙහිව උද්ඝෝෂණ කරන පුද්ගලයින්ට ම එරෙහිව භාවිතා කරන අතර, වෛරී ප්‍රකාශ කිරීමේ නිරත වන්නන්ට එරෙහිව කිසිදු පියවරක් නොගනී.[16]

සිවිල් යුද්ධයෙන් පැන නැඟුණු ගැටළු සම්බන්ධයෙන් කටයුතු කිරීමට සහ එක් රටක්, එක් නීතියක් ස්ථාපිත කිරීමට උත්සාහ කිරීමට පිහිටුවන ලද ආයතන දෙකක් වන - අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සහ හානිපූරණය සඳහා වන කාර්යාලය සමග පසුගිය සහ වත්මන් රජයන් සම්බන්ධ වී ඇති ව්‍යාජ ආකාරය - නීති කෙටුම්පත් කිරීමේ කාර්යසාධක බලකායට නායකත්වය දීමට සුළුතර-විරෝධී (විශේෂයෙන් මුස්ලිම්-විරෝධී) ක්‍රියාකාරීත්වයන්ට සම්බන්ධ ආන්දෝලනාත්මක බෞද්ධ භික්ෂුවක් රජය විසින් තෝරාගැනීමත් සමග - ශ්‍රී ලංකාව කඩදාසි මත කරන ජාත්‍යන්තර කැපවීම් සහ එහි ක්‍රියාකාරීත්වයන් අතර ඇති පරතරය බරපතළ ලෙස ඉස්මතු කර පෙන්වා දෙයි.

ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් සියයට 52 ක් කාන්තාවන් වන අතර[17] ඔවුහු රටේ ආර්ථිකයට ප්‍රධාන ආකාරවලින් දායක වෙති. විදේශ මුදල් උත්පාදනය කිරීම ගත් කළ, තේ නිෂ්පාදනය, ඇඟලුම් කර්මාන්ත, සහ විදේශ ප්‍රේෂණ ප්‍රධාන කාර්යභාරයන් ඉටු කරයි. මෙම කර්මාන්ත වල කොඳු නාරටිය වන්නේ කාන්තාවන් ය. මෙම කාන්තාවන්ගෙන් බොහෝ දෙනෙක් අයත් වන්නේ ද පහළ පන්ති වලට ය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ශ්‍රී ලංකාව සිය ජාත්‍යන්තර බැඳීම් ආරක්ෂා කිරීමට අපොහොසත් වූ විට, එය නියත වශයෙන්ම, රටේ කාන්තාවන්ට බහුවිධ ආකාරයෙන් බලපායි. ඇතැම් ජාත්‍යන්තර එකඟතා පිළිබඳ බැඳීම් සම්පූර්ණයෙන් පිළිපැදීමට දිවයින අසමත්වීම පිළිබඳ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය කාරණාවන් වඩාත් බැරෑරුම් ලෙස ආමන්ත්‍රණය කළ යුතු ය. නිදසුනක් වශයෙන්, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යංශය කාන්තාවන්ට එරෙහි වෙනස්කොට සැලකීම් තුරන් කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ කමිටුව හා සම්බන්ධ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ ප්‍රධාන ආයතනය වේ. දිවයින ජාත්‍යන්තර වශයෙන් කර ඇති කැපවීම් දේශීයව ගැබ්ව ඇති කාන්තාවන් පිළිබඳ ජාතික ප්‍රඥප්තියක් සම්මත කර ඇති අතර (මෙය අනෙක් අතට, ජාතික කාන්තා කමිටුව නම් ආයතනයක් විසින් අධීක්ෂණය කරනු ලබයි), මෙය වෙනත් ගැටළු අතර වැටුප් විෂමතාව, වීදි වල හිරිහැර කිරීම්, ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කොටගත් ප්‍රචණ්ඩත්වය හා හිරිහැර කිරීම්, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, ස්ත්‍රී දූෂණය හා ගැහැණු ළමයින් අපයෝජනයට ලක් කිරීම වළක්වා නොමැත.[18]

# 2. ජාතික බැඳීම්

## සමස්ත ලකුණු: 5.5

ආගම | **සමස්ත ලකුණු: 6**

ජනවාර්ගිකත්වය | **සමස්ත ලකුණු: 5**

ශ්‍රී ලංකාව තුළ බහුත්වවාදය ප්‍රවර්ධනය කරන නීති සෑහෙන තරම් ප්‍රමාණවත් මෙන්ම, විවිධාකාර ද වේ. එවැනි නීති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ වෙනත් නෛතික ආඥාපනත් යන දෙකම තුළ අන්තර්ගතව පවතී. නිදසුනක් වශයෙන්, ආගමික නිදහස සම්බන්ධයෙන් ගත් කළ රට ඉහළ මට්ටමක පවතින අතර, 1978 සිට, ඉංග්‍රීසි සන්ධාන භාෂාවක් ලෙස විස්තර කරන ලද අතර, සිංහල සහ දෙමළ රාජ්‍ය භාෂාවන් ලෙස සැලකේ. විවිධ පුද්ගලික නීති මඟින් යාපනය අර්ධද්වීපයේ දෙමළ ජනතාවට දේපල, උරුමය හා විවාහ කටයුතු සම්බන්ධව ලන්දේසීන් යටතේ ස්ථාපිත කර ඇති නීති අනුව කටයුතු කිරීමට ඉඩ සලසන අතර, පැරණි උඩරට රාජධානියේ සිංහල ජනතාව සාම්ප්‍රදායික පිළිවෙත් සහ ආඥාපනත් වලට අනුව තම පිළිවෙත් අනුගමනය කරති. ඒ හා සමාන ව, මුස්ලිම් පුද්ගලික නීතිය මුස්ලිම් විවාහ සහ දික්කසාද පාලනය කරන අතර, මුස්ලිම් වාග් පනත (Wakf Act) මුස්ලිම් දේවස්ථාන සහ පුණ්‍ය භාර පරිපාලනය කරයි. එකම රටක්, එකම නීතියක් නිර්මාණය කිරීමට වත්මන් රජය දරන උත්සාහයන්, විශේෂයෙන්, මුස්ලිම් පුද්ගලික නීතිය ඉලක්ක කිරීම සඳහා නිර්මාණය කර ඇති බව පෙනෙන්නට තිබෙන අතර,[19] සිදුවේයැයි සිතන ප්‍රතිසංස්කරණ වල ස්වභාවය රට තුළ බහුත්වවාදය තවදුරටත් නිෂ්ප්‍රභ කිරීමට හේතු විය හැක. එසේම, වාර්ගික අසමගිය ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් ඕනෑම කෙනෙකු රඳවා තබාගැනීමට ඉඩ සලසන 2021 අංක 1 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ රෙගුලාසි හරහා මුස්ලිම්වරුන් ද ඉලක්ක කර ගන්නා බව පෙනේ.[20] රට එහි මූල්‍ය අර්බුදය අත්විඳීමට පටන් ගත් දා සිට සහ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ නෙරපා හැරීමට බල කෙරුණු දැවැන්ත විරෝධතාවන්ට පසු, මුස්ලිම්-විරෝධී හැඟීම පහව ගොස් ඇති නමුත්, බුර්කාව තහනම් කිරීමේ කැබිනට් නියෝගය (පාර්ලිමේන්තු අනුමැතිය අවශ්‍ය කරන) සමහර දේශපාලනඥයන්ගේ මුස්ලිම්-විරෝධී මානසිකත්වය හා සමඟ ගැලපේ.[21]

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පැහැදිලිවම රාජ්‍යයේ බහු ස්වභාවය පිළිගන්නා අතර, අධිකරණය මේ සම්බන්ධයෙන් ජාතික නෛතික රාමුවක් තහවුරු කර ඇත: බහුත්වවාදයට අදාළ වන නෛතික විධිවිධාන කිහිපයක් ශ්‍රී ලාංකීය නීති පද්ධතිය තුළ තිබේ. විශේෂයෙන්ම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආගමික නිදහස (10 වෙනි වගන්තිය), සහ තම ආගම විවෘතව ඇදහීමට සියලුම පුද්ගලයින්ට ඇති අයිතිය (14(1)(ඉ) වගන්තිය) පිළිගනී. තවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව “වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන හේතු මත හෝ ඉන් කවර

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පැහැදිලිවම රාජ්‍යයේ බහු ස්වභාවය පිළිග න්නා අතර, අධිකරණය මේ සම්බන්ධයෙන් ජාතික නෛතික රාමුවක් තහවුරු කර ඇත.

වූ හේතුවක් මත වෙනස්කොට සැලකීමෙන්" ආරක්ෂාව සපයයි (12(2) වගන්තිය). ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වැනි වගන්තිය ඉංග්‍රීසි සන්ධාන භාෂාවක් ලෙස තිබීම සමඟ, සිංහල සහ දෙමළ ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂාවන් ලෙස පිළිගනී.

කෙසේවෙතත්, එවැනි විධිවිධාන තිබියදීත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව භාෂාව සහ ආගම යන දෙකම සම්බන්ධයෙන් ගත් කළ, ධූරාවලියක් ගැන ඉඟි කරයි. නිදසුනක් වශයෙන්, ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂාව සිංහල බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පවසයි. ඉන්පසුව එන වාක්‍ය ඛණ්ඩයක, දෙමළ භාෂාව ද රාජ්‍ය භාෂාවක් වන්නේය යන්න සඳහන් කරයි. ආගම සම්බන්ධයෙන් ගත් කළ, බුද්ධාගමට "ප්‍රමුඛතම" ස්ථානය හිමි වන බව එය කෙලින්ම පවසන අතර, එය ප්‍රවර්ධනය කිරීම සහ පෝෂ්‍ය කිරීම රාජ්‍යයේ යුතුකම බවත් සටහන් කරයි.

බුද්ධාගම සඳහා වන වරප්‍රසාද ලත් තත්ත්වය 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හරහා හඳුන්වා දී, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව එය එසේම පවත්වා ගෙන ගියේය. රාජ්‍ය භාෂාවන් හා සම්බන්ධ පාරිභාෂික වචනමාලාව 1956 දී පාර්ලිමේන්තු පනතක් හරහා සිංහල පමණක් රාජ්‍ය භාෂාවක් බවට පත් කෙරුණු මතභේදාත්මක ආකාරයෙන් පැන නැඟී, 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හරහා ශක්තිමත් කෙරුණි. මේ වන විට ශ්‍රී ලංකාවේ සිටින සියලුම ඉන්දියානු දෙමළ ජාතිකයින් පාහේ පුරවැසිභාවය ලබා ඇතත්, වෙනස්කොට සලකන භාෂා නීති සම්පාදනයට පෙර, නිදහසින් පසු ඉන්දියානු දෙමළ ජාතිකයින්ට (ප්‍රධාන වශයෙන් තේ වතු වල වැඩකරන) පුරවැසි භාවය ලබාගැනීම තහනම් කරන ලද ප්‍රතිපත්ති පැවතුණි.

# 3. සමස්තය ඇතුළත් කරන පුරවැසිභාවය

## සමස්ත ලකුණු: 8

ආගම | **සමස්ත ලකුණු: 8**
ජනවාර්ගිකත්වය | **සමස්ත ලකුණු: 8**

වර්තමානයේ, ශ්‍රී ලංකාවේ උපත ලබා ඇති, තම දෙමාපියන් ශ්‍රී ලාංකිකයින් වන සියලුම දෙනා පුරවැසිභාවය ලබාගැනීම සඳහා සුදුසුකම් ලබති. ව්‍යවස්ථානුකූලව, වර්ගය, ආගම, ජනවාර්ගිකත්වය හෝ දේශපාලන සම්බන්ධයන් මත පදනම්ව පුරවැසිභාවය ප්‍රතික්ෂේප කළ නොහැකිය. "පුරවැසි තත්ත්වය අත්කර ගනු ලැබූ ආකාරය, එනම් පරම්පරාවෙන් ද, නැතහොත් ලියාපදිංචි වීමෙන් ද යනු සලකා කවර වූ හෝ කාර්යයක් සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන් වෙසෙසා නොදැක්විය යුත්තේ ය" යනුවෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාශ කරයි.

මෙහි දෙවැන්නෙන්, එනම්, ලියාපදිංචි වීමෙන් අදහස් කරනු ලබන්නේ රට නිදහස ලැබීමට පෙර සිටම වුවද ලියාපදිංචි වීම මඟින් පුරවැසිභාවය ලබාගැනීමට අවසර ලත් අයයි. මෙම වාක්‍ය ඛණ්ඩය මඟින් මෑත කාලයේ දී මුදල් හිඟයට මුහුණ දුන් රජයන් විසින් ප්‍රවර්ධනය කරන ලද ද්විත්ව පුරවැසියන් වන අය පිළිබඳව ද සඳහන් කරයි. 2020 දී සම්මත කරන ලද 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව, ද්විත්ව පුරවැසියන්ට පාර්ලිමේන්තු මැතිවරණ වලදී තරඟ කළ හැකි අතර, කැබිනට් අමාත්‍යවරුන් ලෙස පවා පත්විය හැකිය. 21 වෙනි ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගැනීම පිළිබඳව රට තුළ විවාද කෙරෙමින් පවතින අතර, එක් මතභේදාත්මක ගැටලුවක් වනුයේ, ද්විත්ව පුරවැසියන්ට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ කැබිනට් අමාත්‍යවරුන් වීමේ හැකියාව ලබාදෙන වාක්‍ය ඛණ්ඩය ඉවත් කළ යුතු ද යන්නයි.

ද්විත්ව පුරවැසිභාවය සම්බන්ධයෙන් ගත් කළ, විදේශ පුරවැසිභාවය ලබා සිටින දෙමළ ජාතිකයින් ශ්‍රී ලංකා පුරවැසිභාවය යළි ලබාගැනීමට අයදුම් කිරීමේ දී දැඩි ලෙස පරීක්ෂාවට ලක්වන බව පෙනේ.[22] බහුතර ප්‍රජාවට අයත් අයට රාජ්‍යය වරප්‍රසාද ලබා දෙන ආකාරය සැලකිල්ලට ගන්නා විට, සිංහල බෞද්ධයෙකු වීම ශ්‍රී ලාංකිකයෙකු වීමේ තුරුම්පුවක් බවට සුළුතරයින් අතර ඇති හැඟීම සමඟ මෙය ගැලපේ. මෙම හැඟීම බරපතළ ලෙස සවිගැන්වූයේ COVID-19 හේතුවෙන් මියගිය බවට සිතන ලද පුද්ගලයින්ව භූමදානය කිරීම රජය විසින් ටික කලකට තහනම් කළ විට ය, මෙම

පෙළපතින් හෝ ලියාපදිංචිය මගින් ලැබෙන පුරවැසිභාවය අතර වෙනස ස්වාධීන රාජ්‍යයක් ලෙස එම රට උපත ලද අවස්ථාවේදී පැවති භේදභින්න කළ හැකි දේශපාලන ගැටළුවක් ආපසු සිහි ගන්වයි.

ප්‍රතිපත්තිය විශේෂයෙන් දිවයිනේ මුස්ලිම්වරුන් කම්පනයට පත් කළේය (එමෙන්ම සිය ඥාතීන් ආදාහනය කිරීමට මනාපයක් නොදැක් වූ කිතුණුවන්ට ද මෙය අපහසුවක් විය).

පෙළපතින් හෝ ලියාපදිංචිය මගින් ලැබෙන පුරවැසිභාවය අතර වෙනස ස්වාධීන රාජ්‍යයක් ලෙස එම රට උපත ලද අවස්ථාවේදී පැවති භේදභින්න කළ හැකි දේශපාලන ගැටළුවක් ආපසු සිහි ගන්වයි. 1948 නිදහසින් පසු, රජය විසින් ලංකා පුරවැසි පනත පාර්ලිමේන්තුව තුළ සම්මත කරන ලදී. මෙම නීතියේ දෘශ්‍යමාන අරමුණ වූයේ පුරවැසිභාවය ලබාගැනීමට ක්‍රමයක් සැපයීම ය. නමුත් එහි සැබෑ අරමුණ වූයේ මෑතකාලීන ඉන්දියානු සම්භවයක් සහිත වූ දෙමළ ජනතාවට පුරවැසිභාවය ප්‍රතික්ෂේප කිරීම ය. මෙම අසාධාරණය ආපසු හැරවූයේ 1988 දී පමණි.

ඉන්දියානු දෙමළ ජනතාවට පුරවැසි අයිතීන් නොතිබුණු කාලය තුළ සමාජ සුබසාධන වැඩසටහන් සඳහා ඔවුන්ට ප්‍රවේශය නොතිබුණි. ජීවන තත්ත්වයන් සහ අධ්‍යාපන අවස්ථා අඩු ප්‍රමිතිවලින් පැවතීමත් සමඟ, මෙම උරුමය මෙම කණ්ඩායමට අහිතකර ලෙස බලපෑම්කිරීම දිගින් දිගටම සිදුවෙයි.[23] මීට අමතරව, මෑත වසර තුළ වතුකරයේ තත්ත්වයන් හෙළා දකින තරුණ තරුණියන් භෝජනාගාර සේවකයින් සහ සාප්පු සහායකයින් ලෙස නගර තුළ රැකියා සොයා ගොස් ඇති නමුත්, ප්‍රධාන වශයෙන් තේ වතු ආශ්‍රිතව ජීවත් වන මෙම දෙමළ ජනතාව වතු පද්ධතියට බැඳී සිටිති.

# II වන කොටස.
# භාවිතාවන්

# 4. ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම

## සමස්ත ලකුණු: 5.5

ආගම | **සමස්ත ලකුණු: 6**

ජනවාර්ගිකත්වය | **සමස්ත ලකුණු: 5**

බහුත්වවාදය ප්‍රවර්ධනය කරන නීති සංග්‍රහයන් සම්පාදනය කිරීමේ දී ශ්‍රී ලංකාව ඉහළ ලකුණු ලබාග න්නා අතර, මෙම නෛතික රාමුව දිගුකාලීනව පවතින බහුතරවාදය සහ ජනවාර්ගික- ජාතිකවාදී ජනතාවාදයෙහි සිත් ඇදගන්නා දේශපාලනඥයන් විසින් අඩපණ කර තිබේ. මෙම ක්‍රියාවලිය 1950 ගණන් වල මැද භාගයේ දී ආරම්භ වූ අතර, එය සිංහල භාෂාව ජාතික භාෂාව බවට පත් කිරීමටත්, සිංහල කතාකරන්නන් හට රජයේ රැකියා සඳහා අන් අයට ඉහළින් නිර්ලජ්ජිතව අනුග්‍රහය දැක්වීමටත් හේතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, වර්තමානයේ රාජ්‍ය සේවකයින්ගෙන් සියයට 90 කට වැඩි ප්‍රමාණයක් සිංහලයන් වන අතර, හමුදා සේවක පිරිස් අතර මෙම සංඛ්‍යාව සියයට 95 ඉක්මවිය හැක.[24] දිවයිනේ මිලියන 1.5 කට අධික රජයේ සේවකයින් සිටින බැවින් (රාජ්‍යය ක්‍රියාත්මක වීමට අවශ්‍ය වන්නේ මෙයින් අඩක් පමණක් බව පරිපාලකයින් පවසද්දීත්),[25] එසේ බඳවා ගැනීමෙන් සෘජුවම පෙන්වන්නේ බහුත්වවාදී දේශපාලන සමාජයකට වඩා ජනවාර්ගික තන්ත්‍රයකි.

බහුත්වවාදය ප්‍රවර්ධනය කරන නීති සංග්‍රහයන් සම්පාදනය කිරීමේ දී ශ්‍රී ලංකාව ඉහළ ලකුණු ලබාග න්නා අතර, මෙම නෛතික රාමුව දිගුකාලීනව පවතින බහුතරවාදය සහ ජනවාර්ගික- ජාතිකවාදී ජනතාවාදයෙහි සිත් ඇදගන්නා දේශපාලනඥයන් විසින් අඩපණ කර තිබේ.

නිලධාරිවාදී තනතුර උසස් වන තරමට සුළුතරයින්ට බලපාන වෙනස්කොට සැලකීම ද විශාල වේ. නිදසුනක් වශයෙන්, රජයේ පරිපාලන නිලධාරියෙකුට අමාත්‍යංශයක ලේකම්වරයෙකුගේ තනතුර දක්වා ඉහළට යා හැකිය. 2021 දී, රජයේ අමාතංශ්‍ය ලේකම්වරුන් 32 දෙනාගෙන් එක් අයෙකුවත් ජනවාර්ගික-ආගමික සුළුතරයකින් පැමිණියේ නැත. මීට අමතරව, දෙවන මට්ටමේ අමාත්‍යංශ වලින් සමන්විත වන රාජ්‍ය අමාත්‍යංශ 42 න් සුළුතර ප්‍රජාවකට අයත් වූයේ එක් ලේකම්වරයෙකු පමණි. 2022 මැයි මාසයේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ නව අමාත්‍යංශ ලේකම්වරුන් පත් කළ විට, එක් අයෙකුවත් ජනවාර්ගික සුළුතර ප්‍රජාවකින් නොසිටියේය. මෙය සිදුවූයේ ජනගහනයෙන් සියයට 25 ක් සුළුතරයින් ගෙන් සමන්විත වී තිබියදී ය.

මෑතකදී, දෙමළ පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.ඒ. සුමන්තිරන් විසින්, පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද දේශපාලන වින්දිතයින් පිළිබඳව විමර්ශනය කිරීමේ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ දෙමළ පිටපතෙහි විශාල කොටස් අතහැර දමා තිබූ ආකාරය ඉස්මතු කිරීමත් සමඟ, ලිඛිත ප්‍රතිපත්තිය සහ ක්‍රියාවට නැංවීම අතර පරතරය පිළිබඳව සාක්ෂි ඉදිරිපත් විය. සුමන්තිරන්ට අනුව, පිටු 2,043 කින් යුත් මෙම වාර්තාවේ ෂෂ වෙළුම සම්පූර්ණයෙන්ම දෙමළ භාෂාවෙන් ඉදිරිපත් කර නොතිබුණු අතර, පිටු 160-554, 570-608, 667-1556 සහ 1565-2043 අත්හැර දැමූ ඒවා අතර විය.[26] රජය තුළ දෙමළ භාෂාව සමාන භාෂාවක් ලෙස සැලකීම පිළිබඳව ඇති නොසැලකිල්ල සිංහල භාෂාවෙන් කටයුතු නොකරන අය අතර නිරන්තරව ඇති මැසිවිල්ලකි.[27] මේවායින් සාමාන්‍ය මැසිවිලි වන්නේ, දෙමළ භාෂාව කතා කරන අයට රජයේ ආකෘති සිංහල භාෂාවෙන් ලබාදීම සහ සිංහල කියවීමට හෝ ලිවීමට නොදන්නා අයට පොලිස් ස්ථාන වලදී සිංහල භාෂාවෙන් ඇති කටඋත්තර අත්සන් කිරීමට බල කිරීම ය.

භාෂාමය පදනම් හරහා රජයේ සේවාවන්ට සමාන ප්‍රවේශයක් සහතික කිරීමට මෙසේ අසමත්වීම විශේෂයෙන් ම බලපාන්නේ වැඩියෙන්ම කොන්කිරීමට ලක් වූ අයට ය. සිංහල දුප්පතුන්ට සිංහල භාෂාවෙන් කටයුතු කිරීමට ඇති හැකියාව අනුව රාජ්‍ය නිලධාරීවාදය හසුරුවා ගැනීමට හැකි වන අතර, සමාජ-ආර්ථික වශයෙන් කොන්කිරීමට ලක්ව ඇති දෙමළ භාෂාව කතා කරන අය රාජ්‍යය සමඟ සම්බන්ධ වීමට උත්සාහ කිරීමේ දී අමතර බාධක වලට මුහුණ දෙති. සිවිල් යුද්ධය 2009 දී අවසන් වූවත්, අවසන් නොවූ ක්‍රියාවලියක් වන උතුරු නැගෙනහිර සිදුවී ඇති මිලිටරීකරණය, විශේෂයෙන් ම කාන්තා-මූලික කුටුම්බයන් අවදානම් සහිත තත්ත්වයකට පත් කරයි. මීට හේතුව වන්නේ, මෙම නිවෙස් වලට නායකත්වය දෙන කාන්තාවන් ප්‍රධාන වශයෙන් සිංහල සෙබළුන් අතර ජීවනෝපායය සෙවිය යුතු අතර, එම සෙබළුන්ට දෙමළ භාෂාවෙන් කටයුතු කිරීමට හේතුවක් නැති වීමයි.[28]

මේ අනුව, 1956 සහ 1977 අතර කාලය හා සසඳන විට, ශ්‍රී ලංකාව ලියකියවිලි මත වඩාත් බහුත්වවාදී බව කෙනෙකුට තර්ක කළ හැකි වූවත්, බිම් මට්ටමේ යථාර්ථය එවැනි ස්ථිර ප්‍රකාශයක් අභියෝග යට ලක් කරයි. එක් අතකට, ශ්‍රී ලාංකිකයෝ තම විශ්වාසයන් ඇදහීම නිදහසේ සහ විවෘතව

කාන්තා අධ්‍යාපනය සම්බන්ධයෙන් ගත් කළ, ශ්‍රී ලංකාව එහි මිතුරු දකුණු ආසියානු රාජ්‍යයන්ට වඩා බෙහෙවින් හොඳින් කටයුතු කරන අතර, එය පීතෘමූලික සමාජයක් ලෙස පවතී.

සිදුකරති; අනෙක් අතට, සියලුම අබෞද්ධයන් එසේ කරන්නේ බුදු දහමට සහ එහි නියෝජිතයින්ට කැපී පෙනෙන ගෞරවයක් දැක්වීමෙනි. විවිධ කාලයන්හි දී කතෝලිකයින්ට, ක්‍රිස්ත්‍රියානි ඉවැංජලිස්ත දේශකයින්ට, සහ වඩාත් මෑතකදී, මුස්ලිම්වරුන්ට සහ ඔවුන්ගේ දේවස්ථාන වලට ද එරෙහිව ප්‍රහාර එල්ල වී ඇත. ග්‍රාමීය පෙදෙස්වල වාසස්ථාන සහ වන්දනාමාන සඳහා අවකාශයන් කුලියට ගැනීමට උත්සාහ කිරීමේ දී, ඉවැංජලිස්ත දේශකයින් විශේෂයෙන් තර්ජන වලට සහ නොහික්මුණු වෙනස්කොට සැලකීම් වලට මුහුණ දී ඇත. මෙවැනි වෙනස්කොට සැලකීමේ ක්‍රියාවන් සඳහා වගකිව යුත්තන්ට කිසිවිටෙකත් නඩු පැවරීමක් සිදු නොවන්නේ, පොලීසිය සහ රාජ්‍ය නිලධාරීන්, සාමාන්‍යයෙන් දේශපාලන අනුග්‍රහය භුක්ති විඳින බෞද්ධ අපරාධකරුවන්ට පක්ෂ වන බැවිනි.[29]

භාෂා සහ ආගමික පදනම් ඔස්සේ වෙන්වූ පාසැල් ද බහුත්වවාදයට හානිකර ඇත්තේ, මේ මඟින් ජනවාර්ගික සහ ආගමික ප්‍රජාවන් එකිනෙකා සමඟ මුසුවීම වළක්වා ඇති බැවිනි. පාසැල් තුළ තෙවැනි භාෂාවක් ඉගැන්වීමෙන් (ඉංග්‍රිසි භාෂාවට අමතරව සිංහල හෝ දෙමළ) ප්‍රජාවන් යා කිරීම සඳහා පාලම් තැනීමක් වීමේ හැකියාව ඇති නමුත්, දිවයිනේ සිසුන් පාසැල් අධ්‍යාපනය කරගෙන යන්නේ ජනවාර්ගික-ආගමික කුටි තුළ බැවින් මෙය එකිනෙකා අතර මුසුවීම අභිවර්ධනය නොකරයි.

කාන්තා අධ්‍යාපනය සම්බන්ධයෙන් ගත් කළ, ශ්‍රී ලංකාව එහි මිතුරු දකුණු ආසියානු රාජ්‍යයන්ට වඩා බෙහෙවින් හොඳින් කටයුතු කරන අතර, එය පීතෘමූලික සමාජයක් ලෙස පවතී. ආගම සමඟ එක්වූ විට මෙම පුරුෂාධිපත්‍යය සමහර ආගමික ප්‍රජාවන් අනෙක් ඒවාට වඩා වැඩියෙන් කොන් කිරීමට ලක් කරයි. දිවයිනේ මුස්ලිම් කාන්තාවන් සම්බන්ධයෙන් විශේෂයෙන් මෙය එසේ වේ.[30] සිවිල් යුද්ධය, විශේෂයෙන්ම උතුරු පළාතේ කාන්තා ගෘහමූලිකයින් දහස් ගණනක් බිහි කිරීමට හේතු වී ඇත. මෙම ප්‍රදේශයේ බොහෝ කාන්තාවන්ට තමන් ගොදුරු කර ගන්නා (තම දෙමළ ප්‍රජාව තුළ හා ඉන් පිටත යන දෙකෙහිම) බලවේගයන්ට එරෙහිව සටන් කිරීමට සිදුව ඇත්තේ රාජ්‍ය නිලධාරීන්ගෙන් කිසිදු උදව්වක් නොමැතිව ය.[31]

1977 දී හඳුන්වා දුන් විවෘත වෙළඳපල ආර්ථිකය විශේෂයෙන්ම ග්‍රාමීය පෙදෙස් වල දිවි ගෙවන අය සඳහා ජනවාර්ගික-ආගමික පදනම් ඔස්සේ අසමානකම් උග්‍ර කරන ලදී. COVID-19 වසංගතය සහ ඒ සමඟ ඇති වූ අගුලු දැමීම් මෙම අසමානකම වඩාත් පැහැදිලිව පෙන්වන ලදී. නිදසුනක් වශයෙන්, අන්තර්ජාලයට ප්‍රවේශය නැති දරුවන්ට අධ්‍යාපනය අහිමි කර ඇති අතර, දෛනික ශ්‍රමිකයින්ට තම පවුල් සඳහා මූලික අවශ්‍යතා සැපයීමට අරගලයක යෙදීමට සිදුව ඇත - දරුණු උද්ධමනය සහ ආහාර හිඟකමෙහි ප්‍රතිඵලයක් ලෙස මෙම තත්ත්වය වඩාත් නරක අතට හැරී ඇත. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් මෑතකදී සිදුකරන ලද සමීක්ෂණයකින් මෙය යළි අවධාරණය විය. මෙහිදී සියයට 75.1 ක් ඔවුන්ගේ ආදායම පහත වැටී ඇති බව පවසන අතර, COVID-19 හා සම්බන්ධ දිවයිනේ ආර්ථික තත්ත්වය හේතුවෙන් ඉන්දියානු (වතු) දෙමළ ජනතාවට මෙය වඩාත් අසමානුපාතිකව බලපා ඇති බව අනාවරණය විය.[32] සෞඛ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ ආයතනය (IHP), විසින් 2021 නොවැම්බර් මස සිදුකරන ලද සමීක්ෂණයකට අනුව, වැඩිහිටියන්ගෙන් සියයට 72 ක් දිවයිනේ ආර්ථිකය තවත් නරක අතට හැරෙනු ඇතැයි අපේක්ෂා කළ අතර, එම තත්ත්වය දැන් උදාවෙමින් පවතී.[33]

## 5. දත්ත රැස්කිරීම

## සමස්ත ලකුණු: 5

ආගමික | **සමස්ත ලකුණු: 5**

ජනවාර්ගිකත්වය | **සමස්ත ලකුණු: 5**

අර්ධ වශයෙන් ශ්‍රී ලංකාව ප්‍රමාණයෙන් සීමිත වීම සහ එහි ඉහළ සාක්ෂරතා අනුපාතය හේතුවෙන්, එහි සමස්ත දත්ත රැස්කිරීම ප්‍රශංසනීය ගුණාත්මක බවකින් යුක්ත වේ. මහ බැංකුව සහ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව රටේ ආර්ථික සහ සමාජීය දත්ත රැස්කිරීමේ ප්‍රමුඛ ප්‍රභවයන් අතර වේ. මෙම දෙපාර්තමේන්තු වල දත්ත වෙරිටෙ රිසර්ච් (Verité Research) සහ විකල්ප ප්‍රතිපත්ති

දත්ත රැස්කිරීම සිදු කිරීමට රාජ්‍යයට ඇති හැකියාව සැලකිල්ලට ගන්නා විට, ජනවාර්ගික-ආගමික කණ්ඩායම් වල අසමානකම් දැක්වෙන තොරතුරු රැස් කිරීමට එයට ඇති නොකැමැත්ත ගැටලු සහගත වේ.

කේන්ද්‍රය වැනි බුද්ධි මණ්ඩල මගින් සහ ආසියා සමාජය, ලෝක බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි ජාත්‍යන්තර ආයතන මගින් රැස් කරන විවිධ දත්ත මගින් ඌනපූරණය වේ.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව කලින් කලට ආර්ථික හා සමාජීය දත්ත රැස් කරයි. සංගණන දෙපාර්තමේන්තුවේ දශවාර්ෂික ජනගහන හා නිවාස සංගණනය වැඩියෙන්ම භාවිතයට ගනු ලබන ජනවිකාස දත්ත ජනනය කරයි. අවසාන ජනගහන සහ නිවාස සංගණනය සිදුවූයේ 2012 දී ය. එය වයස්-ස්ත්‍රී පුරුෂ සංයුතිය, යැපුම් ජනගහනය, වෛවාහක තත්ත්වය, ජනවාර්ගිකත්වය සහ ආගම, සාක්ෂරතාව සහ අධ්‍යාපනය, ශ්‍රම බලකාය, රැකියාව, සංක්‍රමණය සහ ජනගහනයේ සශ්‍රීකත්වය පිළිබඳ සංඛ්‍යා සපයයි. ජනගහනය සහ ජනවිකාස සංඛ්‍යාලේඛන ජාතික, පළාත්, දිස්ත්‍රික් සහ ගම් මට්ටමින් ගණනය කෙරේ. නාගරික, ග්‍රාමීය හා වතු යන අංශ අනුව ද දත්ත වෙන් කිරීම සිදු කෙරේ. වතු යනුවෙන් අදහස් කෙරෙන්නේ තේ සහ රබර් වතු ආධිපත්‍යය දරන ප්‍රදේශ වේ.

මෙම ජනවිකාස දත්ත සෞඛ්‍යය, ආදායම් සහ වියදම්, ශ්‍රමය සහ කාන්තා යහ-පැවැත්ම පිළිබඳව කලින් කල සිදු කෙරෙන ගෘහස්ථ සමීක්ෂණ සමඟ ඒකාබද්ධ කෙරේ. මෙහි විශාල හිඩැස වන්නේ, කණ්ඩායම් තුළ ඇති අසමානාත්මතාවන් සම්බන්ධව නිශ්චිතව කෙරෙන දත්ත රැස්කිරීමක් නොමැති වීමයි. මේ අනුව, යමෙකුට ආගමට සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අදාළ කණ්ඩායම් අසමානාත්මතා හඳුනාගැනීමට අවශ්‍ය වූ විට, එය දිස්ත්‍රික් මට්ටමේ දත්ත දළ වශයෙන් ආසන්න කර ලබාගත යුතු වේ. මෙයින් අදහස් කෙරෙන්නේ, කණ්ඩායම් අසමානාත්මතාවන්ට පටහැනිව කලාපීය විසමතා මත රජයේ සැලසුම්කරණය පදනම් වන බවයි. රජයේ නියෝජිතායතන වලට සාපේක්ෂ වශයෙන් හොඳ දත්ත තිබෙන විට පවා, ජනවාර්ගික ආගමික කණ්ඩායම් වලට බලපාන විෂමතාවන් නොසලකා හැර ජාතික මට්ටමින් ප්‍රතිපත්ති සම්පාදනය කෙරෙන බව පෙනෙන්නට ඇත.[34]

කෙසේවෙතත්, දිවයිනේ බොහෝ පරිපාලන කොට්ඨාශ ඒක-ජනවාර්ගික වීමට නැඹුරුවක් ඇති බැවින්, ඇතැම් පෙදෙස් වලින් අන්තර්-ජනවාර්ගික වෙනස්කම් පිළිබඳ තොරතුරු රැස් කළ හැකිය. 2015 ලෝක බැංකු දරිද්‍රතා තක්සේරුවකට අනුව, සිවිල් යුද්ධය ප්‍රධාන වශයෙන් පැවති උතුරු සහ නැගෙනහිර පළාත්, වතු ආශ්‍රිත කෘෂිකර්මාන්තය වටා පිහිටි ප්‍රදේශ සහ අග්නිදිග පෙදෙසේ ප්‍රධාන වශයෙන් සිංහල ජනතාව වෙසෙන මොනරාගල දිස්ත්‍රික්කය දරිද්‍රතාවයෙහි ඉහළම මට්ටම් අත්විඳීමට නැඹුරු වෙති.

දත්ත රැස්කිරීම සිදු කිරීමට රාජ්‍යයට ඇති හැකියාව සැලකිල්ලට ගන්නා විට, ජනවාර්ගික-ආගමික කණ්ඩායම් වල අසමානකම් දැක්වෙන තොරතුරු රැස් කිරීමට එයට ඇති නොකැමැත්ත ගැටලු සහගත වේ. අවම වශයෙන්, එයින් ඇඟවෙන්නේ, සුළුතර ප්‍රජාවන් බහුතර ප්‍රජාවන්ට වඩා කෙතරම් පසුගාමී වන්නේද යන්න අඩුකර දැක්වීමට රාජ්‍යය වැඩි කැමැත්තක් දක්වන බවයි. මේ සම්බන්ධයෙන්, උතුරු පළාතේ ගෘහ-මූලික කාන්තාවන්ගේ දුක්ඛිත තත්ත්වය විශේෂයෙන් අනෙකුත් සියලුම කුටුම්බයන්ට වඩා ඔවුන් පසුගාමී වීම අනිවාර්ය කරයි.

## 6. හිමිකම් කියාපෑම හා තර්ක ඉදිරිපත් කිරීම

## සමස්ත ලකුණු: 6

ආගම | **සමස්ත ලකුණු: 6**

ජනවාර්ගිකත්වය | **සමස්ත ලකුණු: 6**

දුර්වල ලෙස ආණ්ඩුකරණය කෙරෙන නමුත්, ශ්‍රී ලංකාව සවිමත් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් ව පවතින අතර, රජයට විරෝධය පළ කරන පුද්ගලයින් ගත් කළ, මෙය විශේෂයෙන් සත්‍ය වේ. එසේ කිරීමට ඇති අයිතිය ව්‍යවස්ථානුකූලව ආරක්ෂා කර ඇති අතර, ගෝඨාභය රාජපක්ෂ රජය යටතේ ඉහළ යන ජීවන වියදම සහ අත්‍යවශ්‍ය භාණ්ඩ හිඟය සම්බන්ධයෙන් මතු වූ විරෝධතා ඊට නිදසුනකි. එහි ප්‍රතිඵලය වන්නේ, සිවිල් සමාජය සහ අධිකරණය හරහා රජයට එරෙහිව හිමිකම් උපදවා, ඒවා ප්‍රසිද්ධ කිරීමට වෘත්තීය සමිති වල සිට ජනවාර්ගික-ආගමික ප්‍රජාවන් දක්වා විවිධ පරාසයක කණ්ඩායම් වලට හැකිවී තිබීමයි. සමහර විට, හිමිකම් කියාපෑම සහ ඒවාට ප්‍රතිවිරුද්ධ හිමිකම්

සමහර විට, හිමිකම් කියාපෑම සහ ඒවාට ප්‍රතිවිරුද්ධ හිමිකම් කියාපෑම ප්‍රචණ්ඩත්වයට හේතු විය හැකිය. දේශපාලන පක්ෂ හා සම්බන්ධ ප්‍රතිවාදී වෘත්තීය සමිති එකිනෙක හා ගැටෙන විට එසේ සිදුවීමට පෙළඹේ.

කියාපෑම ප්‍රචණ්ඩත්වයට හේතු විය හැකිය. දේශපාලන පක්ෂ හා සම්බන්ධ ප්‍රතිවාදී වෘත්තීය සමිති එකිනෙක හා ගැටෙන විට එසේ සිදුවීමට පෙළඹේ.

ජනවාර්ගික-ආගමික ජාතිකවාදය මිනිසුන්ට ඒකරාශී වීමට ඇති හැකියාවෙහි ප්‍රමුඛ කාර්යභාරයක් ඉටුකර ඇති නමුත්, මෙය ශ්‍රී ලාංකීය ප්‍රජාතන්ත්‍රවාදයට වරප්‍රසාදයක් මෙන්ම විනාශයක් ද වී ඇත. එක් අතකට, එය දුක්ගැනවිලි සහ නිත්‍යානුකූල ගැටළු ඉස්මතු කිරීමට ජනතාව සවිබල ගන්වයි; අනෙක් අතට, දිවයිනේ ජනවිකාස සිංහලයන්ට සහ බෞද්ධයන්ට දැඩි ලෙස අනුග්‍රහය දැක්වීම හේතුවෙන් එය පන්ති වශයෙන් බෙදෙන බහුතරවාදය බලදායී කර ඇත. ඒ අනුව, 1956 වසරෙන් ආරම්භ වී, සුළුතරයින්ගේ නිත්‍යානුකූල අවශ්‍යතා වලට අවාසි වන අන්දමින් බහුතර සිංහල බෞද්ධයන්ගේ හිමිකම් තහවුරු වී ඇත. මෙයින් අදහස් කෙරෙන්නේ, බොහෝ ගැටළු සම්බන්ධයෙන් ශ්‍රී ලාංකිකයන් සියල්ලන්ටම පාහේ රජයට එරෙහිව හිමිකම් කියාපෑමට හැකි වුවද, රජයන් ප්‍රධාන වශයෙන් බහුතර ප්‍රජාවට අයත් වන අයට ප්‍රතිචාර දැක්වීමට සහ සිංහල බෞද්ධ වැඩි මනාපයන් කෙරෙහි තියුණු අන්දමින් අනුග්‍රහය දැක්වීමට පෙළඹෙන බවයි.

විශේෂයෙන්ම සිවිල් යුද්ධය ආශ්‍රිත ගැටළු සම්බන්ධයෙන් මෙය සත්‍ය වේ. නිදසුනක් වශයෙන්, සිවිල් යුද්ධයට සාමකාමී විසඳුමක් වෙනුවෙන් බලපෑම් කළ දේශපාලන පක්ෂ සහ සිවිල් සමාජය හිරිහැරයට ලක්වූවා පමණක් නොව, යුද්ධයෙන් පසු ඔවුන්ව අධීක්ෂණය කර ඇති අතර, යුද්ධයට සම්බන්ධ යැයි චෝදනා ලැබ ඇති සාහසික ක්‍රියා සම්බන්ධයෙන් තමන්ව ස්වයං-වාරණය කිරීමට බල කර ඇත.[35] හමුදාවට සහ එහි ක්‍රියාවන්ට සහාය දක්වන අය දේශප්‍රේමීන් ලෙස හංවඩු ගැසුණු අතර, හමුදාවේ භාවිතාවන්, කෙතරම් දූෂිත සහ අධම වුවත්, ඒවා විවේචනය කළ අය දේශද්‍රෝහීන් ලෙස සලකමින් සිවිල් යුද්ධයේ අවසන් අදියරේදී දේශප්‍රේමීන් සහ දේශද්‍රෝහීන් ලෙස සැලකුණු අය වටා කතාවස්තුවක් ගොතා තිබුණි.[36]

රාජපක්ෂ පවුල බලයේ සිටින සෑම අවස්ථාවකම මෙම වාතාවරණය විශේෂයෙන් බහුලව පැවති නමුත්, බලයේ සිටින රජය කුමක් වුවත්, හමුදාව ගැන නරක ලෙස කථාකිරීම තහනම් දෙයක් වන බව සියළුදෙනාම වටහා ගෙන සිටිති. මෙය යුද්ධය අතරතුරදී තම අතුරුදහන් වූ ආදරණීයයන් සොයාගැනීමට අවශ්‍ය කරන දෙමළ ජනයාට විශේෂයෙන් බලපා ඇත. එය තවමත් උතුරු-නැගෙනහිර තමන්ගේ ඉඩම් ආපසු දෙනතුරු බලා සිටින දෙමළ සහ මුස්ලිම් ජනයාට ද බලපායි. ඔවුන්ට සහ ඔවුන්ගේ නියෝජිතයන් හට සාමාන්‍යයෙන් රජයට එරෙහිව හිමිකම් කියාපෑමට නිදහස ඇති අතර, එම හිමිකම් හමුදාවන් සමඟ සම්බන්ධ ඒවා වූ විට ඔවුහු කිසිදු වෙනසක් සිදු නොකිරීමට පෙළඹෙති.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සහ නීති අධිකරණ ද හිමිකම් කියාපෑම සඳහා වන ස්ථාන වේ. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට කණ්ඩායම් සහ ප්‍රජා අයිතීන් පිළිබඳ ගැටළු භාර ගෙන විභාග කළ හැකි අතර, ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණය හරහා හිමිකම් කියාපෑම වඩාත් විධිමත් වේ. නීතිපති කාර්යාලයේ සේවය කර පසුව මහාධිකරණ වලට පත්වූ බොහෝ පුද්ගලයන් සැලකිල්ලට ගන්නා විට, ශ්‍රී ලාංකීය අධිකරණ දීර්ඝ කාලයක් තිස්සේ "ජනාධිපති මානසිකත්වයකින්" පීඩා විඳ ඇති බව පෙනේ.[37]

කෙසේවෙතත්, එවැනි නඩු විභාග කිරීමට සූදානම්ව සිටින අධිකරණ සහ නීතිඥයින් හරහා රාජ්‍යයට එරෙහිව හිමිකම් කියාපෑමට නිදහස පවතී. ඇතැම් අවස්ථා වලදී, එවැනි නඩු විභාග කිරීම අධිකරණය ප්‍රතික්ෂේප කර ඇත. නිදසුනක් වශයෙන්, කොවිඩ් ආශ්‍රිත මරණ සඳහා ආදාහනය කිරීම අනිවාර්ය කළ රජයේ රෙගුලාසියට එරෙහිව මුස්ලිම් ප්‍රජාවේ සාමාජිකයින් විසින් ගොනු කරන ලද පෙත්සම් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඉවතලන ලදී. කෙසේවෙතත්, මෙම තීරණයට ප්‍රතිවිරුද්ධ හිමිකම් කියාපෑම සමථයකට පත්වන තුරු, සිරුරු මෘතශරීරාගාර වල තැබිය යුතු බවට නියෝග කරමින් රජය ගත් තීරණය පමා කිරීමට උත්සාහ කළ පහළ අධිකරණයන් තිබුණි. අධිකරණය විසින් සුළුතර ප්‍රජාවන්ගේ ආගමික අයිතීන් තහවුරු කළ තවත් බොහෝ අවස්ථා ද තිබේ.[38]

බොහෝ සමාජයන්හි මෙන්ම, වඩා ඵලදායී නෛතික නියෝජනයන් ලබාගැනීම සඳහා වඩා පොහොසත් තත්ත්වයන් හි සිටින අය සතුව වත්කම් පවතී. එවැනි පුද්ගලයින් බලයේ සිටින්නන් සමඟ වඩා හොඳින් සම්බන්ධ වී සිටින අතර, තමන්ගේ නඩු වලට වාසිදායක වන ලෙස ඔවුන්ගේ බලපෑම භාවිතා කිරීමේ හැකියාව පවතී. පහළ අධිකරණ තුළ වඩාත් ගැටලු සහගත වන අධිකරණමය දූෂණ මඟින් එවැනි අයුක්තීන් ප්‍රවර්ධනය කිරීම සිදුවේ.[39]

සිවිල් යුද්ධය අතරතුරදී බොහෝ පිරිමින් මියයාම හේතුවෙන්, විශේෂයෙන් උතුරු පළාත තුළ, අසමානුපාතික කුටුම්බයන් සංඛ්‍යාවක් කාන්තා ගෘහ-මූලික ඒවා වන බැවින්, විශේෂයෙන් දෙමළ කාන්තාවන් හට හිමිකම් කියාපෑමට ඇති හැකියාව සහ ප්‍රවේශය ගත් කළ, බල රහිත වීමට පෙළඹෙති. එමෙන්ම, බොහෝදෙනා දැඩි ලෙස මිලිටරීකරණය වූ ප්‍රදේශ වල ජීවත්වීම හේතුවෙන් රාජ්‍ය බලධාරීන්ගෙන් යුක්තිය ඉල්ලා සිටීමට ඔවුන්ට ඇති හැකියාව තවදුරටත් හීනවී යයි.[40]

# III වන කොටස.
# බහුත්වවාදය සඳහා නායකත්වය

# 7. දේශපාලන පක්ෂ
## සමස්ත ලකුණු: 5

ආගම | **සමස්ත ලකුණු: 5**
ජනවාර්ගිකත්වය | **සමස්ත ලකුණු: 5**

**සියලුම පක්ෂ බහුත්වවාදය අනුගමනය කරන බව ප්‍රකාශ කරන අතර, සමහර පිල් බහුතරවාදයට සහාය දෙතිග**

1948 නිදහසේ සිට 1977 දක්වා ශ්‍රී ලංකාවේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක - එක්සත් ජාතික පක්ෂය සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය - මාරුවෙන් මාරුවට බලයට පත් විය. 1978 දී ජනාධිපති ක්‍රමය හඳුන්වා දීමෙන් පසු මෙය අඩුවෙන් සිදුවුණි. නමුත්, පක්ෂ මාරුවෙන් මාරුවට බලයට පත්වූ විට පවා, ඔවුන් එසේ කළේ බහුතරවාදී සන්දර්භයක් තුළ ය, එනම් විශේෂයෙන් ප්‍රධාන පක්ෂ දෙක, 1950 ගණන් වල මැද භාගයේ සිට, ජනවාර්ගික වාසි ලබාගැනීම කෙරෙහි ප්‍රමුඛත්වය දුන්නේය.[41] මෙහිදී ඔවුහු විශේෂයෙන් දෙමළ සුළුතරයට අවාසි වන පරිදි බහුතරයේ අවශ්‍යතා ප්‍රවර්ධනය කිරීමට තරඟ කළහ. එසේ වාසිය කෙරෙහි යොමුවීම ජනවාර්ගිකතන්ත්‍රයට සහ සිවිල් යුද්ධයට මඟ පෑදුවේය. බෙදුම්වාදී එල්ටීටීඊය පරදවා ලැබූ ජයග්‍රහණයෙන් සිදුවූයේ සමහර පක්ෂ වල වඩා බහුලව සිටින බහුතරවාදී අන්තවාදීන් දිරිමත් කිරීම පමණි.

සියලුම පක්ෂ බහුත්වවාදය අනුගමනය කරන බව ප්‍රකාශ කරන අතර, සමහර පිල් බහුතරවාදයට සහාය දෙති. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ රාජපක්ෂ පවුලට සහයෝගය දැක්වීම සඳහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් කැඩී ගිය බොහෝ දෙනෙකුගෙන් සමන්විත වන ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ දිවයින පාලනය කරන විට සිංහල බෞද්ධ බහුතරවාදයෙහි පිහිට පතා ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, ශ්‍රී ලංකාව සාමාන්‍යයෙන් බහුත්වවාදය වෙනුවෙන් සටන් කරන්නන් රැසකට රැකවරණය දෙන නමුත්, එහි දේශපාලනය දිගු කලක් තිස්සේ ජනවාර්ගික-කේන්ද්‍රීය වී ඇත. ජාතිකවාදය ප්‍රවර්ධනය කළ දෙමළ පක්ෂ (අර්ධ වශයෙන් සිංහල බෞද්ධ ජාතිකවාදයට ප්‍රතිචාර ලෙස) සහ මුස්ලිම් පක්ෂ රටේ දේශපාලන පක්ෂ ක්‍රමවේදය වඩාත් වාර්ගික දිශානතියකට තල්ලු කර ඇතත්, සිවිල් යුද්ධය මෙය උග්‍ර කළේය.

මෙම වාර්ගිකවාදය පිළිබඳ හැඟීම වඩාත් ප්‍රත්‍යක්ෂ වන්නේ, පාර්ලිමේන්තු මැතිවරණ අතරතුරදී, ජනතාව ජනවාර්ගික-ආගමික පදනම් මත පක්ෂ වලට ඡන්දය ප්‍රකාශ කරන විට ය. කෙසේවෙතත්, මැතිවරණයෙන් පසු, ජනවාර්ගික-ආගමික පදනම් ඔස්සේ තරඟ කළ පක්ෂ මැතිවරණ ප්‍රතිඵල මත රඳා පවතිමින්, සන්ධාන හවුල්කරුවන් බවට පත්විය හැක. 2010 මහින්ද රාජපක්ෂ යළි තේරී පත්වීමේදී සහ 2019 ගෝඨාභය රාජපක්ෂ තේරී පත්වීමේදී තමන්ට බලය ලබාගැනීමට සුළුතර ඡන්ද අවශ්‍ය නොවූ බව ප්‍රකාශ කළ නමුත්, ප්‍රධාන පක්ෂ දෙකෙන් තරඟ වදින ජනාධිපති අපේක්ෂකයෝ සියළුම ජනවාර්ගික කණ්ඩායම් වල ජනතාව ආකර්ෂණය කර ගැනීමට නැඹුරු වූහ.[42]

නිදහස සමඟ සම්බන්ධ වූ සමහර දේශපාලනඥයින් අතර වංශක්කාර පැළැන්තියක හැඟීම සුලභ වූ නමුත්,[43] පසුගිය දශක කිහිපය තුළ පක්ෂ දේශපාලනය ඉක්මනින්-ධනවත්-වීමේ යෝජනාක්‍රම වලට හුරු වී ඇත. මෙය ආණ්ඩුකරණයේ ගුණාත්මක භාවය අනතුරේ හෙළීම පමණක් නොව, එලදායී බවින් අඩු, විනයකින් තොර පක්ෂ බිහිකිරීමට ද හේතු වී ඇත. මෙහිදී අර්ධ වශයෙන් දොස් පැවරිය යුත්තේ පක්ෂ අභ්‍යන්තරයෙහි ප්‍රජාතන්ත්‍රවාදය නොමැති කමට ය.

ප්‍රාදේශීය සහ පළාත් මට්ටමේ දේශපාලනය දූෂණයෙහි විවිධ ස්ථර නිර්මාණය කිරීමට දායක වී ඇති අතර, මෙම මට්ටම් වල ඇතිවන දේශපාලන තරඟවැදීම් අඩු ආදායම්ලාභී පසුබිම් වලින් පැමිණෙන අය හට තමන්ට නමක් දිනා ගැනීමටත්, අවසානයේදී ජාතික මට්ටමේ දේශපාලන තනතුරු වෙනුවෙන් තරඟ වැදීමටත්, ඔවුන්ව බලදායී කර ඇත. මෙසේ සිදුවීමට නැඹුරු වන්නේ සාපේක්ෂව සමජාතීය ඡන්දදායකයින්ගේ පිහිට පතන දේශපාලන අපේක්ෂකයන් අතර බැවින්, මෙසේ දේශපාලනය තුළ ඉහළට ගමන් කිරීම මඟින් ප්‍රජාතන්ත්‍රවාදයේ හෝ බහුත්වවාදයේ ගුණාත්මක භාවය ඉහළ නංවන බව අවශ්‍ය වශයෙන්ම මෙයින් අදහස් නොකෙරේ.

ලොව ප්‍රථම කාන්තා අගමැතිනිය පත්වූයේ (එකල සිලෝන් නමින් හැඳින්වුණු) ශ්‍රී ලංකාවේ ය. සිරිමාවෝ බණ්ඩාරනායක මෙම තනතුරට පත්වීමට ප්‍රධාන හේතුව වූයේ ඇය එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායකගේ වැන්දඹුව වීම ය. ඇයගේ දියණිය, චන්ද්‍රිකා කුමාරතුංග විවාදයට තුඩු දෙන අන්දමින් අගමැතිනිය සහ ජනාධිපතිනිය වූයේ මෙම වංශක්කාර පාලක පෙළපතට අයත් වීම

හේතුවෙනි.[44] වංශක්කාර දේශපාලනය දකුණු ආසියාව පුරා සුලභ වන අතර,[45] කැපී පෙනෙන ලක්ෂණය වනුයේ, විශ්‍රාමික හෝ මියගිය සැමියන්ට සහ පියවරුන්ට ස්තුති වන්නට කලාපයේ බොහෝ කාන්තාවන් පක්ෂ වල සහ රජයේ ප්‍රමුඛ තනතුරු වලට පැමිණීමයි. ගෝඨාභය රාජපක්ෂගේ පළමු කැබිනට් මණ්ඩලයට ඇතුළත් වූයේ එක් කාන්තාවක් පමණක් වූ නමුත්, 2022 මැයි මාසයේ දී අගමැති මහින්ද රාජපක්ෂ ඉල්ලා අස්වූ විට, කැබිනට් මණ්ඩලය විසිරුවා හරින ලදී. 2022 ජූනි මස මුල වන විට නම් කරන ලද නව කැබිනට් සාමාජිකයින් අතර කිසිදු කාන්තාවක් නොසිටියා ය. කාන්තා ප්‍රතිශතය රටේ ජනගහනයෙන් සියයට 52 ක් ව තිබියදීත්, මන්ත්‍රීවරුන් 225 දෙනෙකුගෙන් යුත් පාර්ලිමේන්තුව සමන්විත වන්නේ කාන්තාවන් 12 දෙනෙකුගෙන් පමණි. ප්‍රාදේශීය මට්ටමේ දී කාන්තා නියෝජිතවරියන් වැඩි සංඛ්‍යාවක් ක්‍රියාත්මක වුවද, එයද සිදුවන්නේ "කාන්තා මන්ත්‍රීවරියන් හට [. . .] ව්‍යවස්ථාපිතව තහවුරු කර දී ඇති අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස පවා ක්‍රියාත්මක කිරීමට ඉඩ නොදෙන"[46] විශාල හිරිහැර කිරීම් මධ්‍යයේ ය. පිරිමින්ට වඩා කාන්තාවන් සිටින සහ පිරිමින්ට නොදෙවෙනි සාක්ෂරතා අනුපාතයක් ඇති රටක මෙය ඉතා අගාධනීය තත්ත්වයකි.

## 8. පුවත් මාධ්‍ය

# සමස්ත ලකුණු: 4.5

### අ. නියෝජනය | සමස්ත ලකුණු: 5.5

ආගම | සමස්ත ලකුණු: 5

ජනවාර්ගිකත්වය | සමස්ත ලකුණු: 6

කෙසේවෙතත්, ශ්‍රී ලාංකිකයන්ගෙන් අති මහත් බහුතරයක් රූපවාහිනිය සහ ගුවන් විදුලිය හරහා තම ප්‍රවෘත්ති ලබා ගන්නා අතර, මෙහිදී රජය විසින් පාලනය කරන නාලිකා වලින් ඇති කරන බලපෑම පෙරට වඩා අඩුවී ඇත්තේ බොහෝ පෞද්ගලික නාලිකා ව්‍යාප්ත වීම හේතුවෙනි.

සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම මාධ්‍ය ක්‍රියාත්මක වේ. මෙය මුද්‍රිත සහ රූපවාහිනිය යන දෙකම සඳහා සත්‍ය වන අතර, මෑත වසර තුළ, සමාජ මාධ්‍ය හරහා සන්නිවේදනය කිරීමට භාෂා තුනම භාවිතා කරනු ලබයි. වර්තමානයේ දී සමාජ මාධ්‍ය තුළ භාෂා ඒකාබද්ධ කර, විශේෂයෙන් ඉංග්‍රීසි සමඟ සිංහල සහ, ඉංග්‍රීසි සමඟ දෙමළ භාෂාවන් භාවිතා කරනු දක්නට ලැබීම පොදු දෙයකි. සන්නිවේදනය කිරීමේ දී සමාජ මාධ්‍ය විසින් භාෂා මිශ්‍ර කරගන්නා අතරම, ශ්‍රී ලාංකීය මාධ්‍යය ඒ අනුව, විවිධ වේ. කෙසේවෙතත්, ශ්‍රී ලාංකිකයන්ගෙන් අති මහත් බහුතරයක් රූපවාහිනිය සහ ගුවන් විදුලිය හරහා තම ප්‍රවෘත්ති ලබා ගන්නා අතර, මෙහිදී රජය විසින් පාලනය කරන නාලිකා වලින් ඇති කරන බලපෑම පෙරට වඩා අඩුවී ඇත්තේ බොහෝ පෞද්ගලික නාලිකා ව්‍යාප්ත වීම හේතුවෙනි.[47]

කෙසේවෙතත්, භාෂාමය සහ බහුත්වවාදයේ දෘෂ්ටි කෝණවලින් ගත් කළ, මාධ්‍යය, කුටි තුළ ක්‍රියාත්මක වීමට පෙළඹෙයි. සිංහල භාෂා මාධ්‍ය විසින් සාමාන්‍යයෙන් සිංහල ජනතාවගේ ගැටළු කෙරෙහි අවධානය යොමු කරයි. එයින් ගම්‍ය වන්නේ බහුතර ප්‍රජාවට අදාළ ගැටළු ජාතික වැදගත්කමක් ගන්නා අතර, සුළුතරයින් සම්බන්ධ කාරණා කලාපීය වන බවයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස, සිංහල රූපවාහිනි ප්‍රවෘත්ති වැඩසටහන් දෙමළ දෘෂ්ටිකෝණයන් ප්‍රමාණවත්ව ඉදිරිපත් කිරීමට අසමත් වේ. දෙමළ භාෂා මාධ්‍ය ජාතික මාතෘකා පිළිබඳව පුළුල් ලෙස වාර්තා කරන අතරම, දෙමළ භාෂාව කතා කරන සුළුතරයින් මුහුණ දෙන ගැටළු සඳහා වැඩි අවකාශයක් ලබා දෙයි. මෙයට දෙමළ සහ මුස්ලිම් යන දෙඅංශයම ඇතුළත් වන අතර, පශ්චාත්-සිවිල් යුද ආරවුල් සහ ප්‍රජාවගේ අඛණ්ඩ දුක්ගැනවිලි හේතුවෙන් දෙමළ ජනයාට අදාළ වන ගැටලු කෙරෙහි අමතර අවධානයක් යොමු කරයි. ඉංග්‍රීසි භාෂා මාධ්‍යය පෙනුමෙන් වැඩියෙන්ම බහුත්වවාදී බවට තර්ක කළ හැකි නමුත්, එහි ප්‍රවේශය සීමිත වන අතර, එහි ආවරණ පථය (ස්වදේශීය භාෂාවෙන් ක්‍රියාත්මක වන මාධ්‍ය හා සසඳන විට) විවිධ ජාතීන් සහ ව්‍යාපාරික අවශ්‍යතා කෙරෙහි නැමීමට පෙළඹෙයි.

මෙයින් සිදුවන්නේ, ප්‍රධාන වශයෙන්, බහුත්වවාදී ස්වරූපයක් ඉදිරියට ගෙනයාම සිදු නොකර, ජනවාර්ගික-ආගමික බහුවිධ සමාජයක අවශ්‍යතා ඉටුකරන මාධ්‍යයක් බිහිවීමයි. ඇත්ත වශයෙන්ම, මාධ්‍ය හිමිකරුවෝ මෙන්ම පුවත්පත් ලේඛකයෝ ද වාර්ගික අගතීන් සහ පවතින භීතීන් අවුළුවන පටු ජාතිකවාදී ආස්ථානයන් ගැනීමට නැඹුරු වෙති.[48] පුවත්පත් ලේඛකයෝ සිය මූලාශ්‍ර වල සත්‍යතාව සත්‍යෙක්ෂණය කිරීම සහ විකල්ප දෘෂ්ටිකෝණ ඉදිරිපත් කිරීම ඇතුළත් වන මූලික වෘත්තීය මාධ්‍ය ආචාරධර්ම අනුගමනය කිරීමට අපොහොසත් වෙති. මෙම ගැටලුව ඩයස්පෝරාවෙන් නිකුත් වන

මාධ්‍ය මඟින් සංකීර්ණ කරයි - මෙහිදී ප්‍රධාන වශයෙන් සලකනු ලබන්නේ දෙමළ ඩයස්පෝරාව ය - මන්දයත් එහි පුවත් අයිතමයන් සත්‍යය සඳහා පරීක්ෂා කිරීමකින් තොරව දිවයින තුළ ප්‍රතිසංසරණය වන බැවිනි. ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය වරින් වර ව්‍යාජ පළකිරීම් ඉස්මතු කරන අයිතමයන් පෙන්වා දෙන අතර, ඔවුන්ගේ උත්සාහයන් මෙම සැක සහිත සහ ව්‍යාජව ඉදිරිපත් කරන අදහස් (විශේෂයෙන් සමාජ මාධ්‍ය හරහා කෙරෙන) සමඟ පවත්වා ගෙන යාමට තරම් ප්‍රමාණවත් නොවේ.

ජනවාර්ගික-ආගමික සහජීවනය වෙනුවෙන් පෙනී සිටින, සීමිත සංසරණයකින් යුත් පුවත්පත් සහ පොඩ්කාස්ට් ආකාරයෙන් විකල්ප මාධ්‍ය තිබේ. මෙයින් අදහස් කෙරෙන්නේ විකල්ප දෘෂ්ටිකෝණ සොයන්නන් සඳහා ඒවා පවතින බවයි. මෙය කාලය වැයවන්නක් වන අතර, මෙම අන්තර්ගතයෙන් වැඩි කොටසක් ඇත්තේ සමාජ මාධ්‍ය තුළ හෙයින්, (විශේෂයෙන්ම දුරකථන වල පරිභෝජනය කෙරෙන විකාශන ධාරිතාව සඳහා බොහෝදෙනෙකුට ගෙවීමට සිදුවන බව සැලකිල්ලට ගන්නා විට) ඒ සඳහා වැඩි මුදලක් ද වැය වනු ඇත . මෙයින් අදහස් කෙරෙන්නේ, මෙවන් විකල්ප මාධ්‍ය වෙත සමහර විට ප්‍රවේශ වන්නේ ඇතැම් සමාජ ස්තරයන් පමණක් වන බවයි.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන ප්‍රවෘත්ති වැඩසටහන් මඟින් පිරිමි සහ කාන්තා විකාශන මෙහෙයවන්නන් භාවිතා කිරීමට පෙළඹෙන නමුත්, පිරිමි විකාශන මෙහෙයවන්නන් වැඩි ගුවන් කාලයක් ලබාගැනීමේ නැඹුරුවක් පවතී. කෙසේවෙතත්, කාන්තාවෝ මානව උනන්දුවක් දක්වන කතාන්දර, විශේෂාංග කොටස් සහ විලාසිතා පිටු ආශ්‍රිත මාධ්‍යයන්හි ආධිපත්‍යය දැරීමට නැඹුරු වෙති. වඩාත් තරුණ කාන්තාවන් දේශපාලන කටයුතු වාර්තාකරණය සහ දේශපාලනය පිළිබඳ රූපවාහිනී වැඩසටහන් ඉදිරිපත් කිරීම දැන් වැඩි වැඩියෙන් දැකිය හැක. ඔවුන් සුළුතරයක්ව සිටින නමුත්, එය ස්ත්‍රී පුරුෂ සමාජභාවීය කෝණයකින් බලන කල, වැදගත් මාරුවක් සනිටුහන් කරයි. ඉංග්‍රීසි මාධ්‍ය තුළ පුවත්පත් තීරු ඉදිරිපත් කරන කාන්තාවන් සංඛ්‍යාව වැඩි බව පෙනෙන අතර, මෙයට වෙනස්ව ස්වදේශීය මාධ්‍ය වල තීරු රචනා කරන කාන්තාවන්ගේ සංඛ්‍යාව නොසැලකිය හැකි මට්ටමක පවතී.

## ආ. බහුත්වවාදී ක්‍රියාධරයින්ගේ ප්‍රමුඛත්වය | සමස්ත ලකුණුः 3.5

### ආගම | සමස්ත ලකුණුः 4

### ජනවාර්ගිකත්වය | සමස්ත ලකුණුः 3

බොහෝ මාධ්‍ය විසින් සුළුතරයින්ගේ දුක්ගැනවිලි අවම කර පෙන්වන රජයේ කතාවස්තු ප්‍රවර්ධනය කරන අතර, රාජ්‍යය සතු මාධ්‍ය සම්බන්ධයෙන් මෙය විශේෂයෙන්ම සත්‍ය වේ.

බොහෝ මාධ්‍ය විසින් සුළුතරයින්ගේ දුක්ගැනවිලි අවම කර පෙන්වන රජයේ කතාවස්තු ප්‍රවර්ධනය කරන අතර, රාජ්‍යය සතු මාධ්‍ය සම්බන්ධයෙන් මෙය විශේෂයෙන්ම සත්‍ය වේ. මෙය සමාජ මාධ්‍ය වෛරී කථනයෙන් පිරී ඇති අතර ය. මෙහි ප්‍රතිඵලය කිසිසේත් බහුත්වවාදයට දායක නොවේ; ඒ වෙනුවට, එය වාර්ගික අගතීන් සහ දුක්ගැනවිලි ශක්තිමත් කරයි. නිදසුනක් වශයෙන්, 2012 වසරේ පමණ සිට සිදුවූ මුස්ලිම්-විරෝධී ප්‍රචණ්ඩත්වය, ප්‍රධාන ධාරාවේ මාධ්‍ය මඟින් ඉස්ලාම් භීතිකාව වෛෂයිකව සාකච්ඡා කිරීමට අපොහොසත් වූ ආකාරය පිළිබඳව පැහැදිලිව පෙනෙන උදාහරණයකි. මීට පටහැනිව, වෛරී කථනය සජීවීව ආවරණය කිරීමෙන් සහ අන්තවාදී භික්ෂූන් සඳහා ප්‍රසිද්ධ වේදිකා සැපයීම මඟින්, ශ්‍රී ලාංකීය මාධ්‍ය මඟින් සංවේදනවාදය දිරිමත්කර මෑතකදී ඇතිවූ වාර්ගික ආතතීන්ට දායක වී ඇත.

COVID-19 ප්‍රථම වරට ශ්‍රී ලංකාවට ලඟාවූ විට මෙය යළිත් ප්‍රත්‍යක්ෂ විය. ආරම්භයේ දී ඇතැම් ජනාකීර්ණ මුස්ලිම් ප්‍රජාවන් තුළ කොරෝනා වයිරසය අනාවරණය කරගැනීමත් සමඟ, COVID-19 පැතිරීම සම්බන්ධයෙන් මුස්ලිම්වරුන්ට දොස් පැවරීමට ඇතැම් රජයේ නිලධාරීන් සමඟ මාධ්‍යය හවුල් විය.[49] COVID-19, හේතුවෙන් මියගිය අය සඳහා භූමදානය තහනම් කිරීමට රජය තීරණය කළ විට, එය විශේෂයෙන් මුස්ලිම්වරුන් කම්පනයට පත් කළ ප්‍රතිපත්තියක් වූ අතර, සිංහල මාධ්‍ය ඒකමතිකවම පාහේ එම ස්ථාවරයට සහයෝගය දැක්වීය. මෙම ප්‍රතිපත්තිය 2021 පෙබරවාරි මස අර්ධ වශයෙන් ආපසු හරවන ලදුව, 2022 මාර්තු මාසයේ දී සම්පූර්ණයෙන් ආපසු හරවන ලදී - මෙම අවස්ථා දෙකම සිදුවූයේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ උල්ලංඝනයන් සාකච්ඡා කිරීමට රැස්වීමට මොහොතකට පෙර ය - මෙම භාවිතාව විද්‍යාත්මක සාක්ෂි වලට කිසිසේත්ම සම්බන්ධ නොවූ බවට මෙය සාක්ෂියකි. මෙම ප්‍රතිපත්තිය ආපසු හැර වූ විට, ඒ පිළිබඳව රූපවාහිනී මාධ්‍ය තුළ කිසිදු සඳහනක් නොතිබිණි.

තවද, මාධ්‍යය විසින් භීතිය හෝ මතවාදීය හේතූන් මත හමුදාව හා සම්බන්ධ වැරදි ක්‍රියාවන් විකාශනය කිරීමෙන් වැළකී සිට, ඉන්පසුව සිද්ධ වන්නේ සන්නද්ධ හමුදාවන් හිතකර ලෙස නිරූපණය කිරීම ය.

පුද්ගලයින් 269 දෙනෙකකු ඝාතනයට ලක් කළ 2019 පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාර සම්බන්ධයෙන් සාධාරණව කටයුතු කිරීමට රජය මැලිවීම නිසා, කතෝලික පූජක පක්ෂය සහ ඇතැම් ගිහියන් ප්‍රබල අන්දමින් කතා කිරීමටත්, පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාර ඇතැම් රාජ්‍ය බුද්ධි අංශ නිලධාරීන් සමඟ එක්ව ක්‍රියාත්මක වන ඉස්ලාම් අන්තවාදීන් විසින් ගෝඨාභය රාජපක්ෂගේ ජනාධිපති අපේක්ෂකත්වය ප්‍රවර්ධනය කිරීමට සංවිධානය කරන ලද බව තරයේ කියා සිටීමටත් හේතු වී තිබේ.[50] මාධ්‍යය විසින් කතෝලික විරෝධතා පිළිබඳව වාර්තා කර ඇති අතරම, ඇතැම් අන්තවාදී බෞද්ධයින් විසින් කතෝලික පූජකවරුන්ට තර්ජනය කරන විවරණ ද අසභ්‍ය ලෙස විකාශනය කරන ලදී.

තවද, මාධ්‍යය විසින් භීතිය හෝ මතවාදීය හේතූන් මත හමුදාව හා සම්බන්ධ වැරදි ක්‍රියාවන් විකාශනය කිරීමෙන් වැළකී සිට, ඉන්පසුව සිද්ධ වන්නේ සන්නද්ධ හමුදාවන් හිතකර ලෙස නිරූපණය කිරීම ය.[51] මෙය සිදුවූයේ දෙමළ ජනතාවගේ ඉඩම් මිලිටරිකරණයට ගොදුරු වී තිබියදීත්, සහ මෙතෙක් දෙමළ හා මුස්ලිම් වූ ප්‍රදේශ වල සිංහල බෞද්ධ පැවැත්මක් ප්‍රවර්ධනය කිරීම සඳහා හමුදාව අන්තවාදීන් සමග හවුල් වෙමින් සිටියදීත් ය. සුළුතර ජනතාවට හමුදාවට සම්බන්ධ අය විවේචනය කිරීමට නිදහස නොමැති බව හැඟීයාම අහඹුවෙන් සිදුවන්නක් නොවේ.[52] කෙසේවෙතත්, හමුදා නායකත්වයෙන් යුත් රජයක් සඳහා ශ්‍රී ලංකාව තුළ කිසිදු සහයෝගයක් නොමැත.[53]

බහුත්වවාදී ස්වරූපයක් ප්‍රවර්ධනය කිරීමේදී ශ්‍රී ලාංකීය මාධ්‍යය ඉතා ඛේදජනක ලෙස අඩු තත්ත්වයක සිටී. දිගුකල් පැවති සිවිල් යුද්ධය පැහැදිලිවම මෙයට දායක විය. නමුත්, විශේෂයෙන් 2005 දී රාජපක්ෂ පවුල දේශපාලන ආධිපත්‍යය දැරීම ආරම්භ කිරීමෙන් පසු සිදු වූ, ප්‍රජාතාන්ත්‍රික වශයෙන් පැරණි වැරදි වලට යළිත් වසර ගණනාවක් පුරා යොමුවීම ද, මෙයට දායක විය. එහි ප්‍රතිඵලය වනුයේ, බහුතරවාදය නව උච්චස්ථාන දක්වා පැමිණ ඇති අතරම, දූෂණය සහ බියවැද්දීම් ඇතැම් මාතෘකා පිළිබඳව ස්වයං-වාරණයකට තුඩුදී තිබීම ය. මෙම සන්දර්භය තුළ බහුත්වවාදයට අනුග්‍රහය දැක්වීම කිසිසේත්ම ප්‍රවණතාවක් නොවේ. කෙසේවෙතත්, පවතින ආර්ථික අර්බුදය වඩාත් සම්මුතිවාදී දේශපාලනයකට මඟපෑදීමට ඉඩ තිබේ.

සමාජයට අහිතකරව බලපාන ඕනෑම දෙයකින් වඩාත්ම පැහැදිලිව බලපෑමට ලක්වන්නේ සුළුතර ප්‍රජාව සහ පහත් පන්තිවල ජනතාව යි. එබැවින්, කාන්තාවෝ, විශේෂයෙන් සුළුතර කාන්තාවෝ, බහුත්වවාදය තුළ මුල් බැසගත් ගැටළු ගැන සලකා බලන ඕනෑම අවස්ථාවක අමතර බාධක වලට මුහුණ දෙති. බහුත්වවාදී සමාජයක් පුද්ගල අයිතීන් පිළිබඳ ස්වරූපයක් මධ්‍යයේ කොන්කිරීමට ලක්වූවන්ට යම් ආරක්ෂාවන් සපයයි. මෙය මාධ්‍යයට පහසුවෙන් සාකච්ඡාවට ලක් කළ හැකි දෙයකි. එසේ කිරීමට අපොහොසත් වීමෙන් සිදුවන්නේ බහුතරවාදය තවදුරටත් ඉදිරියට ගෙන යාම පමණක් නොව, එය ස්ත්‍රී පුරුෂ සමාජභාවය පාදක කොටගත් වෙනස්කොට සැලකීමට සහ කොන්කිරීමට ලක්කිරීමට ද දායක වීමයි.

# 9. සිවිල් සමාජය

## සමස්ත ලකුණු: 6

ආගම | **සමස්ත ලකුණු: 6**

ජනවාර්ගිකත්වය | **සමස්ත ලකුණු: 6**

ශ්‍රී ලංකාව තුළ සංගම් හා සම්බන්ධ ජීවිතය යටත්විජිත වාදයට පෙරාතුව පැවති අතර, එය ප්‍රධාන වශයෙන් සංවිධානය වූයේ ආගමික පදනම් ඔස්සේ ය. දිවයිනේ විවිධත්වය පැතිරී යාමත් සමඟ, සංගම් හා සම්බන්ධ ජීවිතය ජනවාර්ගික පදනම් ඔස්සේ වර්ධනය වූ අතර, මෙය රටේ පැරණිතම ක්‍රිකට් කණ්ඩායම් විසින් ග්‍රහණය කර ගන්නා ලද සංසිද්ධියකි. වෙනත් ඒවා අතර, සිංහල ක්‍රීඩා සමාජය, ද්‍රවිඩ සංගම් ක්‍රිකට් සහ මලල ක්‍රීඩා සමාජය, මුවර්ස් ක්‍රීඩා සමාජය, සහ බර්ගර් විනෝද ක්‍රීඩා සමාජය වැනි නම් මේවාට ඇතුළත් වේ. එහි ප්‍රතිඵලයක් ලෙස, නිදහසින් පසු, විශේෂයෙන් සිවිල් යුද්ධයෙන් පසු, ශ්‍රී ලංකාවේ සිවිල් සමාජය එහි වඩා විශාල දේශපාලනික සමාජය මෙන්ම ජනවාර්ගික-ආගමික පදනම් ඔස්සේ ධ්‍රැවීකරණය වී තිබීම කිසිසේත්ම පුදුමයක් නොවේ. කෙසේවෙතත්, සිවිල් සමාජයේ සමස්තය හරහා යන බලපෑමට ස්තුති වන්නට, මෙය මුළුමනින්ම

ශ්‍රී ලංකාව සතුව සාමය සහ මානව හිමිකම් වෙනුවෙන් කැප වූ කුඩා නමුත් බලගතු සිවිල් සමාජ සංවිධාන කණ්ඩායමක් ඇති අතර, මෙම රාජ්‍ය නොවන සංවිධාන නිත්‍ය වශයෙන් බහුත්වවාදය සහ ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රවර්ධනය කර මානව හිමිකම් වෙනුවෙන් පෙනී සිට ඇත.

ආන්තික නොවේ. නිදසුනක් වශයෙන්, දේශපාලන පක්ෂ සමඟ සම්බන්ධ නොවන වෘත්තීය සමිති, පාරිභෝගික සංගම් සහ පාරිසරික කණ්ඩායම් විවිධ සාමාජිකත්වයන්ගෙන් සමන්විත වීමට නැඹුරුවක් ඇත.[54] මෙය වෙනස්කම් වලින් සුරාකන සහ මැතිවරණ ව්‍යාපාර අතරතුරදී ප්‍රචණ්ඩත්වයට පවා පෙළඹිය හැකි දේශපාලන පක්ෂ (සහ ඒවායේ වෘත්තීය සමිති) වලට ප්‍රතිවිරෝධී වේ.[55]

සමස්ථයක් වශයෙන්, මෙම සිවිල් සමාජය තුළ සැලකිය යුතු බහුත්වවාදයක් ඉතිරිව ඇත. විවිධ ජනවාර්ගික, ආගමික සහ අභිලාෂයන් මත පදනම් වූ කණ්ඩායම් වලට අයත් අය, විශේෂයෙන් පෞද්ගලික අංශයේ සමාජ හා ආර්ථික ව්‍යවසායයන් තුළ නිදහසේ මිශ්‍ර වීමට නැඹුරු වෙති. මෙම ආයතන වල ශ්‍රම බලකාය බහු-ජනවාර්ගික වේ. එමෙන්ම ක්‍රීඩා සමාජ සහ සමාජ ශාලා, විශේෂයෙන් කොළඹ නගරයේ, සැලකිය යුතු තරම් මිශ්‍ර ඒවා වෙති. කෙසේවුවද, රාජ්‍ය අංශය තුළ සිංහල බෞද්ධයින් ඕනෑවට වඩා අධික ලෙස නියෝජනය වීම හේතුවෙන් ජනවාර්ගික ධ්‍රැවීකරණයට අනුබල දෙන වෘත්තීය සමිති පිහිටුවීමට දායක වී ඇත.[56]

සමස්ථයක් වශයෙන්, සමාජයේ විවිධත්වය පිළිගන්නා ආකාරය සහ බහුත්වවාදයෙහි හරය තුළ පවතින වෙනස්කම් පිළිගැනීමට මිනිසුන් සාමාන්‍යයෙන් නැඹුරු වන ආකාරය අනුව, බහුත්වවාදය සාදන මෘදුකාංග පැහැදිලි වේ.[57] බහුත්වවාදය සාදන්නා වූ දෘඪාංග ව්‍යවස්ථානුකූලව ආරක්ෂා කර ඇති සමානාත්මතාවය සහ සංගමයේ සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ආරක්ෂා කරන නීතිවල ද විදහා දක්වයි. කෙසේවුවද, බහුත්වවාදයේ මෘදුකාංග සහ දෘඪාංග යන දෙකම තිබියදීත්, මූලික ක්ෂේත්‍ර කිහිපයක් තුළම බහුත්වවාදයේ භාවිතාවෙහි ඌනතාවක් පෙන්වයි.

වත්මන් රජය ජාතික ගීය දෙමළ භාෂාවෙන් ගායනා කිරීමට ඉඩදීම ප්‍රතික්ෂේප කිරීම තුළින් බහුත්වවාදය භාවිතා කිරීමක් නොමැති බව පැහැදිලිව පෙන්වා දෙයි. ගෝඨාභය රාජපක්ෂගේ නායකත්වයෙන් යුත් පාලන තන්ත්‍රයට පෙර පැවති පාලන තන්ත්‍රය විසින් ජාතික ගීය සිංහල සහ දෙමළ යන භාෂා දෙකින්ම ගායනා කිරීමට ඉඩ ලබා දුන්නද, මහින්ද රාජපක්ෂ ප්‍රමුඛ රජය ද එයට ඉඩ නොදුනි. විශේෂයෙන්ම, නිදහස් දිනය සැමරීම වැනි ජාතික උත්සව වලදී දෙමළ ජනතාවට ඔවුන්ගේ භාෂාවෙන් ජාතික ගීය ගායනා කිරීම තහනම් කිරීම, 1950 ගණන් වල මැද භාගයේ සිට රටට වසංගතයක් වූ බහුතරවාදයේ හැඟීම තවදුරටත් ප්‍රවර්ධනය කරයි.

ශ්‍රී ලංකාව සතුව සාමය සහ මානව හිමිකම් වෙනුවෙන් කැප වූ කුඩා නමුත් බලගතු සිවිල් සමාජ සංවිධාන කණ්ඩායමක් ඇති අතර, මෙම රාජ්‍ය නොවන සංවිධාන නිත්‍ය වශයෙන් බහුත්වවාදය සහ ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රවර්ධනය කර මානව හිමිකම් වෙනුවෙන් පෙනී සිට ඇත. ඔවුන් විධානය කරන බලපෑම වෙනුවෙන් යහපාලනය සමඟ ගනුදෙනු කිරීමේ ඔවුන්ගේ න්‍යාය පත්‍ර වලට නිරන්තරව සහයෝගය ලබාදී ඇති ප්‍රදායක ප්‍රජාවට සහ විදේශීය රාජ්‍ය තාන්ත්‍රික පිරිස් වලට ස්තූතිවන්ත විය යුතු ය. එවැනි කණ්ඩායම් විසින් සිදු කර ඇති අධ්‍යාපනික සහ උද්දේශන වැඩසටහන් මඟින් දේශපාලන සහ පරිපාලන මට්ටම් වල තීරණ ගන්නන් මත සහ පොදුවේ සිවිල් සමාජය මත මෙන්ම අනෙක් අතට ද සැලකිය යුතු බලපෑමක් ඇති කර තිබේ.[58]

ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධයේදී සටන් වැදුණු දෙපාර්ශවයෙන්ම සාහසික ක්‍රියා සිදු කෙරුණි. යුද්ධය තීව්‍ර වීමත් සමඟ, රජය මඟින් විවේචන ඉවසීම ටිකෙන් ටික අඩු විය. විශේෂයෙන්ම 2005 දී මහින්ද රාජපක්ෂ ජනාධිපති වීමෙන් පසු මෙය සිදු විය. ස්ථානගත කර තිබුණු ආවේක්ෂණ සහ අධීක්ෂණ ක්‍රමවේදයන් යුද්ධයෙන් පසුව ද අඛණ්ඩව ක්‍රියාත්මක වූ අතර, පසුගිය පාලන තන්ත්‍රය යටතේ ඒවා එතරම් කැපී පෙනෙන ආකාර වලින් භාවිතා නොකෙරුණි. කෙසේ වෙතත්, ගෝඨාභය රාජපක්ෂ රජය, බියවැද්දීම් ඇති කිරීමට සහ සංවිධාන අසමතුලිත කර තබාගැනීමට සිවිල් සමාජයෙහි අධීක්ෂණය සහ ආවේක්ෂණය වේගවත් කළේය. නිදසුනක් වශයෙන්, විවිධ බුද්ධි අංශ වලින් යැයි පවසන පොලිස් හා හමුදා නිලධාරීහු මූල්‍යාධාර ලැබෙන ප්‍රභවයන් ගැන සහ සේවයේ යොදවා ඇති සේවක පිරිස් පිළිබඳව විමසා බැලීම සඳහා බොහෝ අවස්ථාවල සිවිල් සමාජ සංවිධාන වෙත ගොස් ඇත. සිවිල් සමාජ සංවිධාන විසින් පැවැත්විය යුතු අධික විගණන සංඛ්‍යාව හේතුවෙන් ඔවුන්ගේ ශක්තීන් ඔවුන්ගේ කාර්යය කෙරෙහි යොමු කිරීම වෙනුවට රජයේ විමසීම් කෙරෙහි යොමු කිරීමට බල කරයි. රාජ්‍ය නොවන සංවිධාන සඳහා වන ජාතික ලේකම් කාර්යාලය විටින් විට ආරක්ෂක අමාත්‍යංශය යටතට පත් කර ඇති අතර, රජය විසින් සිවිල් සමාජ සංවිධාන ජාතික ආරක්ෂාව කෙරෙහි ඇති තර්ජන ලෙස සලකන බවට හැඟීමක් ඇති කරයි.[59]

බොහෝ ශ්‍රී ලාංකීය රාජ්‍ය නොවන සංවිධාන, තමන්ව ආරක්ෂා කිරීමට සහ පෝෂ්‍ය කිරීමට උදව් දෙන යටිතල පහසුකම් නොමැතිකම හේතුවෙන්, විදේශ අරමුදල් මත යැපෙති. අනාගත අරමුදල්

බහුත්වවාදය ප්‍රජාතන්ත්‍රවාදයට දායක වන අතරම, ඒ හා සමානව ප්‍රජාතන්ත්‍රවාදය බහුත්වවාදයට දායක වනු ඇතැයි අපේක්ෂා කිරීමට හේතුවක් නැති ආකාරය දිවයින මේ අනුව ඉස්මතු කරයි.

ගැන අවිනිශ්චිතව, ඔවුහු වසරින් වසර සංවිධානය නොනැසී පවත්වා ගනිති. රට තුළ පවතින සාමාන්‍ය වාතාවරණය දේශීය අරමුදල් ලබාගැනීම සඳහා හිතකර නොවන අතර, කිසිදු රජයක් රාජ්‍ය නොවන සංවිධාන වලට සහය දීමට උත්සාහ කර නොමැත. රජයන් බොහෝ විට රාජ්‍ය නොවන සංවිධාන සලකන්නේ ප්‍රතිවාදීන් සහ විරුද්ධවාදීන් ලෙසට ය. ඇත්ත වශයෙන්ම, සියලුම රජයන් රාජ්‍ය නොවන සංවිධාන සඳහා වන අවකාශය සීමා කිරීමට උත්සාහ දරා ඇත. ජනගහනයෙන් වැඩි ප්‍රමාණයක් සම්බන්ධයෙන් ගත් කළ, බිම් මට්ටමේ මුලපිරීම් සැකය සහ අවිශ්වාසය ජනිත කරන්නේ, ඩොලර් ලබාගැනීම සඳහා විදේශීය වටිනාකම් ප්‍රවර්ධනය කරන ක්‍රියාකාරීන්ට සිවිල් සමාජ සංවිධාන සමාන කරන බැවිනි. මානව හිමිකම් සහ සුළුතරයින්ට බලපාන ගැටළු කෙරෙහි අවධානය යොමු කරන සිවිල් සමාජ සංවිධාන "ජාතික-විරෝධී" සහ ජාතිද්‍රෝහී ලෙස හංවඩු ගැසීමෙන් අර්ධ වශයෙන් මෙම දෘෂ්ටිකෝණය ප්‍රවර්ධනය කිරීමේදී විශේෂයෙන් රාජපක්ෂ රජයන්, සහ පොදුවේ සිංහල බෞද්ධ ජාතිකවාදීන් ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කර ඇත.[60] කෙසේවෙතත්, දැනට පවතින ආර්ථික අර්බුදය සහ විරෝධතා ව්‍යාපාරයේ සන්දර්භය තුළ, මෙම දෘෂ්ටිකෝණය මෑතකදී වෙනස්වෙමින් පැවතුණු බව සඳහන් කළ යුතු ය.

කොළඹ සහ ඒ අවට පිහිටි ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ සිවිල් සමාජ සංවිධාන වලට මාධ්‍ය අවධානයට පහසුවෙන් ප්‍රවේශ විය හැකි අතර, රට මුහුණ දෙන පශ්චාත්-COVID-19 ආර්ථික අර්බුද ග්‍රාමීය පෙදෙස් වල සංගම් හා සම්බන්ධ ජීවිත වල තරම ඉස්මතු කර ඇත. දිවයිනේ ජනගහනය ප්‍රධාන වශයෙන් බෞද්ධ වීමත්, ග්‍රාමීය බෞද්ධයන් ද දැඩි ලෙස ජාතිකවාදී වීමත්, සහ අනුප්‍රාප්තික රජයන් සිංහල බෞද්ධ අභිමතයන්හි ඕනෑ එපාකම් ඉටු කිරීමත් සමඟ, එවැනි කණ්ඩායම් වල මිනිසුන්ට මීට පෙර රජයට විරෝධය දැක්වීමට එතරම් හේතුවක් නොතිබිණි. නමුත් ආර්ථික අර්බුදය ඔවුන්ගේ හැසිරීම වෙනස් කර ඇති අතර, එම ක්‍රියාවලියේ දී ග්‍රාමීය පෙදෙස් වල ශ්‍රී ලංකාවේ සිවිල් සමාජයේ සාරවත් භාවය ඉස්මතු කර ඇත. රට පුරා බෞද්ධ හා හින්දු සිද්ධස්ථාන සහ මුස්ලිම් පල්ලි ආගමික ක්‍රියාකාරකම් සංගම් හා සම්බන්ධව කෙරෙන ක්‍රියාකාරකම් වලට ඒකාබද්ධ කර ඇති බැවින්, සමහර විට මෙය පුදුමයට පත් කළ යුතු දෙයක් නොවේ. තවද, මෙයින් පැහැදිලි වන්නේ සමාජ- ආර්ථික තත්ත්වයන් නොසලකා විවිධාකාර වූ සිවිල් සමාජයක් රට තුළ පවතින බවයි. කෙසේවෙතත්, ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයකම ජනවාර්ගික-ආගමික ජාතිකවාදය පැතිරී ඇති ආකාරයට අනුව, ඔවුන් සියලු දෙනාම බහුත්වවාදය ප්‍රවර්ධනය කරන බව මෙයින් අදහස් නොවේ.

කාන්තාවෝ සිවිල් සමාජය තුළ ක්‍රියාකාරී කාර්යභාරයක් ඉටු කර ඇති අතර, අඛණ්ඩව එය ඉටු කරති. කෙසේවෙතත්, ඔවුන්ගේ කාර්යභාරයන් සහ කාර්යයන් බොහෝ විට ඛණ්ඩනය වී ඇති අතර, වඩා හොඳින් සම්බන්ධීකරණය වූ ප්‍රවේශයක් අවශ්‍යව ඇත. කාන්තාවෝ ප්‍රධාන වශයෙන් සමාජ ගැටළු පිළිබඳව කටයුතු කිරීමට නැඹුරු වන අතර, දේශපාලන ක්‍රියාවාදය තුළ කටයුතු කරන්නේ අඩුවෙනි. දේශපාලන ක්‍රියාවාදයෙහි නියැලෙන කාන්තාවෝ ප්‍රධාන වශයෙන් දේශීය කවයන්ට වඩා ප්‍රභූ කවයන්ට අයත් වෙති. කෙසේවෙතත්, රට මුහුණු දී සිටින පශ්චාත්-COVID ආර්ථික අර්බුදය හේතුවෙන් විරෝධතා දැක්වීමට කාන්තාවන් ද තල්ලු කර ඇති අතර, ග්‍රාමීය මට්ටමින් සිවිල් සමාජ සංවිධාන සමඟ කාන්තාවන් සම්බන්ධ වී ඇති තරම පිළිබඳ වඩා ප්‍රබල ඇගයීමක් දැන් කෙනෙකුට ලැබෙමින් පවතී.

සමස්තයක් වශයෙන්, ශ්‍රී ලංකාව තුළ ප්‍රජාතන්ත්‍රවාදයට ගැති සිවිල් සමාජයෙහි හෝ සිවිල් සමාජ සංවිධාන වල අඩුවක් නැත. එහි අඩුව වන්නේ ප්‍රජාතන්ත්‍රවාදය සහ වඩා ඉවසිලිවන්ත (රිස්සීම ඇති) සමාජයක් සඳහා බහුත්වවාදය අවශ්‍ය වන්නේ කෙසේද යන්න පිළිබඳව අගය කිරීමකි. බහුත්වවාදය ප්‍රජාතන්ත්‍රවාදයට දායක වන අතරම, ඒ හා සමානව ප්‍රජාතන්ත්‍රවාදය බහුත්වවාදයට දායක වනු ඇතැයි අපේක්ෂා කිරීමට හේතුවක් නැති ආකාරය දිවයින මේ අනුව ඉස්මතු කරයි.

# 10. පෞද්ගලික අංශය
## සමස්ත ලකුණු: 6

ආගම | **සමස්ත ලකුණු: 6**
ජනවාර්ගිකත්වය | **සමස්ත ලකුණු: 6**

වඩා ඉහළ මට්ටම් වල සේවක පිරිස් බඳවා ගැනීමේ දී විශාල සමාගම් ප්‍රධාන වශයෙන් ක්‍රියාත්මක වන්නේ කුසලතා-තාන්ත්‍රික පදනමක් මත වුවත්, සාමාන්‍යයෙන් වඩා පහළ මට්ටම් වල සේවක පිරිස් සියලුම ප්‍රජාවන්ට අයත් කොන්කිරීමට ලක්වූ කොටස් වලින් නියෝජනය කිරීමට නැඹුරු වෙති.

බහුතර ප්‍රජාවේ අය බඳවා ගැනීමට පැහැදිලිවම නැඹුරු වන ශ්‍රී ලංකා රාජ්‍යය හා සංසන්දනය කරන විට, ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයට ජනවාර්ගික-ආගමික වෙනස්කොට සැලකීම වළක්වන බවට අයිතිවාසිකම් කිව හැකිය. කෙසේවෙතත්, පෞද්ගලික අංශය කිසිසේත් බහුත්වවාදයෙහි වාචික ආධාරකරුවෙකු නොවේ. ව්‍යාපාර සඳහා ගැටුම් අයහපත් බව පෞද්ගලික අංශය පිළිගන්නා අතර, බහුත්වවාදී ස්වරූපයක් ප්‍රවර්ධනය කරන ප්‍රබල ස්ථාවරයන් ගැනීමට එය සාමාන්‍යයෙන් අකමැති ය.

ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශය සාමාන්‍ය කණ්ඩායම් දෙකකට බෙදිය හැකිය, එනම් කුඩා වෙළඳුන් සහ විශාල සමාගම් ලෙස ය. කුඩා වෙළෙන්දෝ වඩා විශ්වාසය යුතු තනතුරු සඳහා පවුලේ සාමාජිකයන් හෝ ඔවුන්ගේ පවුල් දන්නා හඳුනන අය සේවයට බඳවා ගැනීමට නැඹුරු වෙති. නිදසුනක් ලෙස, දෙමළ භෝජනාගාරයක වැඩ කිරීමට දෙමළ ජාතිකයින් පමණක් සිටීමට ඉඩ ඇති අතර, සිංහල වෙළෙන්දන් හට බොහෝ විට රැකියා සඳහා සෙසු සිංහලයින් (බොහෝ විට තමන්ගේම ගමෙන්, නගරයෙන් හෝ ප්‍රජාවෙන්) සිටිය හැක. සෙසු මුස්ලිම්වරුන් බඳවා ගැනීමට වැඩි කැමැත්තක් දක්වන මුස්ලිම් ආයතන සඳහා ද මෙය සත්‍ය වේ. විශාල වෙළඳ ආයතන හැර, මුස්ලිම් නොවන අය අතර ඇති එක් පොදු පැමිණිල්ලක් වනුයේ, මුස්ලිම් ව්‍යාපාර තමන්ගේම සම-ආගම් භක්තිකයන් බඳවා ගන්නවා පමණක් නොව, සෙසු මුස්ලිම්වරුන් සමඟ වඩාත් හිතකර කොන්දේසි මත වෙළඳාම් කරන බවයි.[61]

සිල්ලර වෙළඳසැල්, සන්නිවේදන සහ වීඩියෝ මධ්‍යස්ථාන, ස්වර්ණාභාරණ සාප්පු, කුඩා අවන්හල්, රෙදිපිළි වෙළඳසැල්, නිෂ්පාදන වෙළඳසැල්, කුඩා ඖසුසැල්, දෘඪාංග ගබඩා, සහ විවිධ අවිධිමත් සේවා කෙරෙහි අවධානය යොමු කරමින් වසර කිහිපයකට පෙර සිදු කරන ලද සමීක්ෂණයකින් සොයා ගනු ලැබුවේ, මෙම කුඩා ව්‍යාපාර වලින් සියයට 68 ක් සේවයට බඳවා ගන්නා ලද්දේ තමන්ගේම ජනවාර්ගික ප්‍රජාවේ සේවකයන් වන බවයි. සියයට 25 කට වෙනස් ජනවාර්ගික ප්‍රජාවන් දෙකකින් සේවකයන් සිටි අතර, ප්‍රධාන ජනවාර්ගික ප්‍රජාවන් තුනෙන්ම සේවකයන් බඳවා ගෙන තිබුණේ මෙම ව්‍යාපාර වලින් සියයට 7 ක් පමණි.[62] පසුගිය දශකයක පමණ කාලය තුළ වෙනත් කණ්ඩායම් වලට අයත් කුඩා ආයතන තුළ වතු දෙමළ ජාතිකයින් (හෙවත් ඉන්දියානු දෙමළ) වැඩියෙන් සේවයේ යොදවා සිටිනු දැකිය හැකි අතර, මෙය හොඳින් පිළිගත හැකි වර්ධනයකි. ඉහත සඳහන් කළ සමීක්ෂණයේ දී වතු දෙමළ ජනතාව දෙමළ කාණ්ඩයේ කොටසක් ලෙස සලකන ලද බව උපකල්පනය කෙරේ. සමස්තයක් වශයෙන්, තමාගේ ප්‍රජාවට අයත් අය බඳවා ගැනීමේ ප්‍රවණතාවය ජනවාර්ගික ආගමික පදනම් ඔස්සේ සමාජමය බෙදීම් ශක්තිමත් කරයි.

වඩා ඉහළ මට්ටම් වල සේවක පිරිස් බඳවා ගැනීමේ දී විශාල සමාගම් ප්‍රධාන වශයෙන් ක්‍රියාත්මක වන්නේ කුසලතා-තාන්ත්‍රික පදනමක් මත වුවත්, සාමාන්‍යයෙන් වඩා පහළ මට්ටම් වල සේවක පිරිස් - සාමාන්‍යයෙන් පිරිසිදු කරන්නන්, රියැදුරන් සහ ආරක්ෂක සේවකයන් ලෙස සේවයේ යොදවා ගන්නන් - සියලුම ප්‍රජාවන්ට අයත් කොන්කිරීමට ලක්වූ කොටස් වලින් නියෝජනය කිරීමට නැඹුරු වෙති.

ශ්‍රී ලංකාවේ විශාලතම සමාගම් සමහරක ඉහළම තලයේ සුළුතර ජාතීහු ගණනාවක් ක්‍රියාත්මක වෙති. මෙම සමාගම් බොහොමයක් රටට බෙහෙවින් අවශ්‍ය කරන විදේශ විනිමය අසමානුපාතික මට්ටමකින් උත්පාදනය කරති. සංචාරක, තේ සහ ඇඟලුම් කර්මාන්ත මේ සම්බන්ධයෙන් කැපී පෙනේ.

තේ සහ ඇඟලුම් අංශ තුළ කාන්තාවන් අසමානුපාතික සංඛ්‍යාවක් සේවයේ යොදවන අතර, ඔවුන්ට මෙම අංශ වල කර්මාන්තශාලා වල සේවය කරන පිරිමින් ලබන වැටුපට වඩා අඩු වැටුපක් ගෙවීමේ නැඹුරුවක් ඇත.[63] කෙසේවෙතත්, ශ්‍රී ලංකාව තුළ පිරිමින්ට වඩා කාන්තාවන් වැඩි ප්‍රමාණයක් සිටියදීත්, සහ සාමාන්‍යයෙන් කාන්තාවන් පිරිමින් මෙන්ම සහ බොහෝවිට පිරිමින්ට වඩා හොඳින් ප්‍රමුඛ පෙළේ විභාග වලදී දස්කම් දැක්වුවත්, කළමනාකරණයේ වඩා ඉහළ මට්ටම් වල කාන්තා නියෝජනය අඩු වේ.

වර්ගවාදී වයිරසයෙන් දිගු කලක් ගහණය වී පැවති රටක, පෞද්ගලික අංශය ආර්ථික සන්දර්භයක් තුළ ජාතිකවාදයෙහි කොටස්කරුවෙක් වන අන්දමෙහි නිදසුන් ලබා දී ඇත. මේ අනුව, සිංහල නොවන තරඟකරුවන්ට එරෙහිව ප්‍රචණ්ඩත්වයට ඉඩදීමට සහ එය ප්‍රවර්ධනය කිරීමට සුළු ඊර්ෂ්‍යාවන් මඟින් සිංහල කුඩා ව්‍යාපාරිකයින්ව තල්ලු කර ඇත. ඉස්ලාම් භීතිකාව ඇවිස්සීම සඳහා මෑතකදී පෙරමුණ ගෙන ඇති බොදු බල සේනා ඇතැම් සිංහල ව්‍යාපාර වල අවශ්‍යතා සමඟ සම්බන්ධ වී ඇතැයි කියනු ලබන අතර, මුස්ලිම්වරුන්ට අයත් ආයතන වලට අනුග්‍රහය දැක්වීමෙන් වළකින ලෙස පාරිභෝගිකයන් දිරිමත් කර ඇත.[64] නැගෙනහිර පළාතේ දෙමළ ජාතික කුඩා ව්‍යාපාරිකයන් මුස්ලිම් ජාතික කුඩා ව්‍යාපාරිකයන්ට එරෙහිව නැඟී සිටින අතර, අනෙක් අතට ද එය එසේම සිදුවේ. මෙම සන්දර්භය තුළ, වාර්ගික ප්‍රචණ්ඩත්වය ඇති වන අවස්ථාවලදී ව්‍යාපාර ඉලක්ක බවට පත්වීම පුදුමයට කරුණක් නොවේ.

මෑත කාලයේ රජය විසින් සේවානියුක්ති විශ්‍රාම වැටුප් මුදල් පෞද්ගලික සමාගම් වල (විශේෂයෙන් මූල්‍ය අංශයේ) කොටස් මිලදී ගැනීම සඳහා යොදවා ඇති අතර, එමඟින් තම සාමාජිකයින් සමාගම් වල අධ්‍යක්ෂ මණ්ඩල වලට අධිස්ථාපනය කර ඇත. බොහෝ විශාල පෞද්ගලික සමාගම් දීර්ඝ කාලයක් ජනවාර්ගික ආගමික ප්‍රචණ්ඩත්වයට එරෙහිව කතා කිරීමට පසුබට වූ අතර, ඔවුන්ගේ ඇතැම් අධ්‍යක්ෂ මණ්ඩල වල රජයේ නියෝජිතයින් සිටීමෙන් සිදුව ඇත්තේ ඔවුන්ගේ නොහික්මුණු බව වැඩිකිරීම පමණි.[65]

අවසාන වශයෙන්, පෞද්ගලික අංශය තුළ ඇති විශාල සමාගම් බහුත්වවාදය ප්‍රවර්ධනය කරන බලවේගයක් වීමට අපොහොසත් වී ඇත්නම්, කුඩා පෞද්ගලික ව්‍යාපාර බහුත්වවාදය දුර්වල කිරීමට දායක වී ඇත.

# IV වන කොටස.
# කණ්ඩායම් පදනම් කොට ගත් අසමානාත්මතාවන්

# 11. දේශපාලනික අසමානාත්මතාවන්
## සමස්ත ලකුණු: 6.5

ආගම | **සමස්ත ලකුණු: 7**
ජනවාර්ගිකත්වය | **සමස්ත ලකුණු: 6**

කෙටියෙන් කිවහොත්, ශ්‍රී ලංකාවේ දේශපාලන සමාජය තුළ දේශපාලන සහභාගිත්වය සහ තරඟ වැදීම ඇතිවන්නේ, ශ්‍රී ලංකාව තුළ සුළුතර ජනයා ජීවත් වන්නේ සිංහල බෞද්ධයින්ගේ ඉවසා දරා සිටීමට පින් සිදුවන්නට බවත්, ප්‍රකාශ කරන හොඳින් මුල් බැසගත් සිංහල බෞද්ධ ජාතිකවාදී මතවාදයක් මධ්‍යයේ ය.

ශ්‍රී ලංකාව නිදහස දිනාගත් වහාම, දිවයිනේ සිංහලයන් සහ සමහර ඉහළ කුල වලට අයත් දෙමළ නායකයන් විසින් තේ වතු වල සේවය කළ දිවයිනේ බොහෝ ඉන්දියානු දෙමළ ජනතාවගේ ඡන්ද අයිතිය අහිමි කරන ලදි. මේ අනුව, 1931 දී සර්වජන ඡන්ද බලය හඳුන්වා දුන් අතර, රටේ ප්‍රථම ප්‍රජාතන්ත්‍රවාදී නොවන ක්‍රියාකාරිත්වයන් අතර වූයේ, රටේ වැඩියෙන්ම කොන්කිරීමට ලක්ව සිටි ප්‍රජාවගේ ඡන්ද බලය අහෝසි කිරීම ය. මෙය පසුව නිවැරදි කළ නමුත්, එය ඉදිරි වසර වල රට පා තබන ජනවාර්ගික-ආගමික ගමන් පථය ගැන ඇඟවීමක් කළේය.

කෙසේවෙතත්, ශ්‍රී ලාංකිකයින් තම ඡන්දය අගය කරන අතර, ඉහළ සංඛ්‍යාවක් ඡන්දය ප්‍රකාශ කරති (විශේෂයෙන් ජනාධිපති මැතිවරණ වලදී බොහෝ විට ඡන්දය ප්‍රකාශ කිරීමේ ප්‍රතිශතය සියයට 80 කට ආසන්නව හෝ එය ඉක්මවා යයි).[66] මෙම ඡන්දය ප්‍රකාශ කිරීම ජාතික, පළාත් සහ ප්‍රාදේශීය මට්ටමින් සිදුවේ (නමුත් පළාත් සහ ප්‍රාදේශීය ඡන්ද විමසීම් විවිධ අවස්ථා වලදී විවිධ හේතූන් මත කල් දමා ඇත). විරුද්ධ පක්ෂ වල අය වෙත ප්‍රචණ්ඩ තර්ජන යොදා ගනිමින් ඡන්දය ප්‍රකාශ කිරීම අධෛර්යමත් කළ අවස්ථා තිබී ඇත. උතුරු නැගෙනහිර වේගවත් මිලිටරීකරණය සමහර දෙමළ ජනයා ඔවුන්ගේ ඡන්ද බලය භාවිතා කිරීමෙන් වැළැක්විය හැකිය. නමුත් සමස්තයක් වශයෙන් ගත් කළ, රට ප්‍රධාන වශයෙන් නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම් පවත්වන අතර, සියලු ප්‍රජාවෝ සාපේක්ෂ නිදහසකින් ඡන්දය ප්‍රකාශ කරති.

ශ්‍රී ලංකාවේ දැනට දේශපාලන පක්ෂ 100 කට අධික සංඛ්‍යාවක් ඇති නමුත්, බොහොමයක් අක්‍රීය හා කුඩා ඒවා වෙති. 1950 ගණන් වල මැදභාගයේ ආරම්භ වූ ජනවාර්ගිකව එකිනෙකා දිනාගැනීම - එමඟින් බහුතර සිංහල බෞද්ධයින් සඳහා හොඳම වැඩසටහන් සැපයිය හැක්කේ කාටද යන්න පිළිබඳව ප්‍රධාන පක්ෂ දෙක තරඟ කිරීමට උත්සාහ කිරීම - දෙමළ ජනතාව ප්‍රධාන වශයෙන් දෙමළ අපේක්ෂකයින්ට ඡන්දය ප්‍රකාශ කිරීමට හේතු විය. පාර්ලිමේන්තු මැතිවරණ වලදී මෙය අඛණ්ඩව සිදුවන අතර, ජනාධිපතිවරණ පවතින විට, දෙමළ ජනතාව සාමාන්‍යයෙන් ඡන්දය ප්‍රකාශ කරන්නේ සිංහල බෞද්ධ ජාතිකවාදයට අවම වශයෙන්ම දායක වන අපේක්ෂකයාට ය. විශේෂයෙන්ම සිය ප්‍රජාවගේ අවශ්‍යතා සපුරාලීම සඳහා පසුගිය දශක හතරක කාලය තුළ මුස්ලිම් පක්ෂ ක්‍රියාත්මක වීමත් සමඟම, මුස්ලිම් ජනතාව ද දැන් පාර්ලිමේන්තු මැතිවරණයේදී තම සම-ආගමික භක්තිකයන්ට ඡන්දය ප්‍රකාශ කරන අතර, ජනාධිපතිවරණ පවතින විට, ඔවුහු අවම වශයෙන්ම සිංහල බෞද්ධ ජාතිකවාදී වන අපේක්ෂකයාට ඡන්දය ප්‍රකාශ කරති.

තරඟ කිරීමට සහ තරඟ වැදීමට ඇති හැකියාව ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික අංග වන අතර, මේ සම්බන්ධයෙන්, ශ්‍රී ලංකාව ඉතා ඉහළ ස්ථානයක සිටී. එහෙත් අබෞද්ධයෙකු රටේ ජනාධිපති වීම ගැන කෙනෙකුට සිතීමට වත් නොහැකිය. ඇත්ත වශයෙන්ම, චන්ද්‍රිකා කුමාරතුංග ජනාධිපතිනියගේ පාලන සමයේ දී - විදේශ ඇමතිවරයා ලෙස බෙදුම්වාදී එල්ටීටීඊයට එරෙහිව රටවල් ඉමහත් සේ උනන්දු කිරීමේ ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළ - ලක්ෂ්මන් කදිරගාමර් හට අගමැතිවරයා විය හැකිය යන මතයට බොහෝ බෞද්ධ ජාතිකවාදීන් විරුද්ධ වූයේ ඔහු දෙමළ ජාතිකයෙකු වීම හේතුවෙනි.[67] කෙටියෙන් කිවහොත්, ශ්‍රී ලංකාවේ දේශපාලන සමාජය තුළ දේශපාලන සහභාගිත්වය සහ තරඟ වැදීම ඇතිවන්නේ, ශ්‍රී ලංකාව තුළ සුළුතර ජනයා ජීවත් වන්නේ සිංහල බෞද්ධයින්ගේ ඉවසා දරා සිටීමට පින් සිදුවන්නට බවත්, සිංහල බෞද්ධ ආධිපත්‍යයට අභියෝග කරන අනවශ්‍ය ඉල්ලීම් නොකළ යුතු බවටත්, ප්‍රකාශ කරන හොඳින් මුල් බැසගත් සිංහල බෞද්ධ ජාතිකවාදී මතවාදයක් මධ්‍යයේ ය.

සියයට 90 ට වඩා පහසුවෙන්ම සිංහලයින් වන ශ්‍රී ලාංකීය නිලධාරි තන්ත්‍රය දෙස බලන විට මෙම බහුතරවාදී ස්වරූපය පැහැදිලි වේ. එමෙන්ම ශ්‍රී ලාංකීය හමුදාව ද සියයට 96 කට ආසන්නව සිංහල වෙති.[68] සිංහල සිවිල් සේවකයින් දෙමළ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් යටතේ සේවය කිරීම ප්‍රතික්ෂේප කළ අවස්ථා තිබේ.[69] එමෙන්ම රජයේ සේවයේ යෙදෙන විට, සුළුතරයින්ට රජයේ ඉතාමත් වැදගත් අමාත්‍යංශ ධූරයන් භුක්ති විඳීමට ලැබෙන්නේ කලාතුරකිනි. මේ අනුව ගත් කළ, රජය තුළ තීරණ

ගැනීම පැහැදිලිවම බහුතර ප්‍රජාව විසින් ආධිපත්‍යය දරන්නකි. විශේෂයෙන්ම රාජපක්ෂ පාලන තන්ත්‍රයන් යටතේ සිදුව ඇති ඉහළ ගිය මිලිටරීකරණය ද උතුරු සහ නැගෙනහිර පළාත් (සිංහල බහුතරයක් නොමැති එකම පළාත් දෙක) පාලනය කරන ආකාරය පිළිබඳව වැඩි බලතල හමුදාවට ලබාදීමට හේතු වී ඇත.[70] මෙම ප්‍රදේශ වල සුළුතරයන් සමාජ-ආර්ථික වශයෙන් වඩාත් කොන් කිරීමට ලක්වූවන් අතර වීමත් සමඟ, ආණ්ඩුකරණයෙහි අසමාන නියෝජනයෙන් මතු වන බලරහිත වීම ඔවුන්ගේ වත්මන් අසමානාත්මතාව තවත් සංකීර්ණ කරයි.

ලොව ප්‍රථම කාන්තා අගමැතිනිය බිහිකර තිබියදීත්, ජනාධිපතිනියක් තෝරා පත්කර ගෙන තිබියදීත්, වරින්වර රජයේ විවිධ මට්ටම් වලට ප්‍රමුඛ පෙළේ කාන්තාවන් රැසක් පත්කර තිබියදීත්, දේශපාලන ජීවිතය තුළ කාන්තාවන් සිටින්නේ අඩු නියෝජනයක් සහිතව ය. වත්මන් පාර්ලිමේන්තුවේ (225 අතරින්) කාන්තාවන් 12 දෙනෙකු පමණක් අඩංගු වන අතර, එය සියයට හයකට වඩා අඩු ය. කැබිනට් අමාත්‍යවරුන් 27 දෙනාගෙන් එක් අයෙක් පමණක් කාන්තාවක් වන්නීය. පළාත් පාලන මට්ටමින්, ආසන වලින් සියයට 25 ක් කාන්තාවන් සඳහා වෙන්කිරීමට නියමිතව තිබියදීත්, නාමයෝජනා ක්‍රියාවලියෙන් ඔබ්බට මෙය බලාත්මක කිරීම සඳහා මැතිවරණ කොමිසමට කිසිදු යාන්ත්‍රණයක් නොමැත. තේරී පත්වූවන් හට වඩා ඵලදායී නියෝජිතයන් වීමට හැකිවන පරිදි පහසුකම් සහ පුහුණුව නොමැති වීම පමණක් නොව, දේශපාලන පක්ෂ පාලනය කරන පිරිමි ද කාන්තාවන් (තේරී පත්වූවන් සහ ඔවුන්ගේ මැතිවරණ කොට්ඨාශ වල අය) සවිබල ගැන්විය හැකි ආකාරයෙන් කෝටාව භාවිතා කිරීමට ද උත්සාහ නොකරති. ඇත්ත වශයෙන්ම, නිලය සඳහා තරඟ කිරීම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය වෙනස්කොට සැලකීම - කාන්තාවන්ට නාම යෝජනා දීම වෙනුවෙන් පිරිමි දේශපාලනඥයින් “ලිංගික අල්ලස්” ඉල්ලා සිටින තැනට පත්වීම - කාන්තාවන් මුහුණ දෙන බාධක අතර වේ.[71]

# 12. ආර්ථික අසමානාත්මතාවන
## සමස්ත ලකුණු: 5

ආගම | **සමස්ත ලකුණු: 5**
ජනවාර්ගිකත්වය | **සමස්ත ලකුණු: 5**

ලෝක බැංකුවට අනුව, ශ්‍රී ලංකාවේ ජිනී දර්ශකයේ අගය 1990 දී 32.40 ක් වූ අතර, 2016 දී එය 39.80 ක් ලෙස සටහන් විය.[72] මෙය ආර්ථික විෂමතා පුළුල් වී ඇති බවට යෝජනා කරන හොඳම දර්ශකය වන අතර, මෙයට විශාල හේතුවක් වූයේ 1977 දී හඳුන්වා දුන් විවෘත වෙළඳපොළ ප්‍රතිපත්ති ය. සමාජ ආර්ථික කරුණු රජය මඟින් පාලනය කිරීම සහ ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමයකින් සමෘද්ධිමත් වීම යන මේවායින් එසේ ඈත්වීම, සමස්ත දළ දේශීය නිෂ්පාදනය වැඩිකර දිවයිනට පහළ මධ්‍යම-ආදායම් තත්ත්වයට ළඟා වීමට ඉඩ සැලසූ අතර (2019 දී ඇමෙරිකානු ඩොලර් 3852 ක ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදනයක් සමඟ),[73] එසේ සිදුවූයේ ආර්ථික විෂමතාව පුළුල් කිරීමට එය දායක වන අතර ය. කෙසේවෙතත්, නිදහසින් පසු සමාජවාදී-ගැති ප්‍රතිපත්ති අඛණ්ඩව යම් ලාභාංශ ගෙවා ඇති අතර, මානව සංවර්ධන දර්ශකයේ ශ්‍රේණිගත කිරීම් වල දිවයින සාපේක්ෂ ඉහළ ස්ථානයක් දැරීම මෙයට සාක්ෂියකි. 2019 වසර සඳහා ශ්‍රී ලංකාවේ මානව සංවර්ධන දර්ශකයෙහි අගය 0.782 ක් වූ අතර, එය රටවල් සහ දේශභූමි 189 න් 72 වන ස්ථානයෙහි තබමින් (දළ දේශීය නිෂ්පාදනය ශ්‍රේණිගත කිරීම වන 113 ට සාපේක්ෂව) ශ්‍රී ලංකාව ඉහළ මානව සංවර්ධන කාණ්ඩයට ඇතුළත් කරයි.

2021 සහ 2022 වසර වලදී දිවයිනට බලපෑ COVID-19 සහ විදේශ මුදල් අර්බුදයන් අසමානාත්මතාව තවදුරටත් පුළුල් කිරීම නියත වුවත්,[74] ශ්‍රී ලංකාවේ විශේෂිත ජනවාර්ගික- ආගමික කණ්ඩායම් එවැනි අසමානාත්මතාවකින් වෙනස් අන්දමින් බලපෑමට ලක්වන්නේ කෙසේද යන්න පැහැදිලි නැත. කොරෝනා වයිරස වසංගතයට පෙර සිට පවා රට තුළ මෙම පදනම් ඔස්සේ දත්ත නොතිබුණි. එබැවින්, නිශ්චිත සමීක්ෂණ සිදු නොකළහොත්, ජනවාර්ගික-ආගමික ප්‍රජාවන් අතර ආර්ථික අසමානාත්මතාවන් කෙතරම් දුරට පුළුල් වී ඇත්දැයි නිර්ණය කිරීම අභියෝගාත්මක වනු ඇත. පුවත් විවරණ සහ රටේ නිරීක්ෂණය කළ හැකි සාමාන්‍ය තත්ත්වය අනුව, පශ්චාත්-කොවිඩ් යුගයේ

> **ප්‍රමාණවත් අධ්‍යාපන, සෞඛ්‍ය සහ යටිතල පහසුකම් නොමැතිවීම, සහ ප්‍රධාන වශයෙන් ග්‍රාමීය දිස්ත්‍රික්ක වල පවතින අවස්ථා නොමැතිකම බස්නාහිර සහ අනෙකුත් පළාත් අතර ආර්ථික අසමානාත්මතාවට ප්‍රධාන හේතු වේ.**

ආර්ථික අසමානාත්මතාව පුළුල් වී ඇති අතර, දැනටමත් සමාජ-ආර්ථික වශයෙන් කොන් කිරීමට ලක්ව ඇති අය එවැනි අසමානාත්මතාවන්ගෙන් ඇතිවන පීඩාවන්ට මුහුණ දෙමින් සිටිති.[75]

ඇත්ත වශයෙන්ම, මෑතකදී කළ සමීක්ෂණයකින් පෙන්නුම් කරන්නේ සියලුම ප්‍රජාවන්ට අයත් තරුණ තරුණියන් තමන්ට හැකි නම් විදේශගත වීමට කැමති බවයි.[76] COVID-19 ශ්‍රම වෙළඳ පොළට බොහෝ ආකාර වලින් අහිතකර ලෙස බලපා ඇත. 2020 මාර්තු 20 දින ආර්ථිකය වසා දැමීමත් සමඟ අවිධිමත් අංශය තුළ සිය දහස් ගණනක් ක්ෂණිකවම රැකියා විරහිත බවට හෝ හැකියාවන්ට අනුව රැකියා නොමැති තත්ත්වයට පත් වූහ. පෞද්ගලික අංශයේ සේවකයින්ට විරැකියාවෙන්/හැකියාවට අනුව රැකියා නොමැතිකමේ රැල්ලෙන් පහර වැදුණි. කෙටියෙන් කිවහොත්, ආපසු පැමිණෙන සහ අපේක්ෂාවෙන් සිටින සංක්‍රමික සේවකයින් ගැන සලකා බැලීමෙන් තොරව පවා, ශ්‍රී ලාංකීය ශ්‍රම වෙළඳපොළ ඒ වනවිටත් COVID-19 හේතුවෙන් ආරවුල් තත්ත්වයක පැවතුණි.[77]

සමාජය තුළ පන්ති පිළිබඳ දෘෂ්ටිකෝණයකින් ගත් කළ, ධනවත්ම සියයට විස්ස මුළු ගෘහස්ත ආදායම් උත්පාදනයෙන් අඩකට වඩා ප්‍රමාණයක් භුක්ති විඳින අතර, දුප්පත්ම සියයට 20 ලබාගන්නේ සියයට 5 ක් පමණි. කුටුම්බයන්ගෙන් දුප්පත්ම සියයට 10 ඉතාමත් නරක අන්දමින් කල දවස ගෙවන්නේ, ඔවුන්ගේ කොටස සියයට 1.8 කට වඩා අඩුවෙන් පවතින අතර ය.[78] මෙය සියයට 53 ක් අවිධිමත් අංශය, සියයට 29 ක් විධිමත් පෞද්ගලික අංශය සහ සියයට 18 ක් රාජ්‍ය අංශය නියෝජනය කරන ශ්‍රම බලකායක් තුළ ය. මෙහි සියයට 18 ක රාජ්‍ය අංශය තුළ සේවක පිරිස මිලියන 1.5 ක් පමණ වෙති.[79]

එමෙන්ම ප්‍රාදේශීය/පළාත් මට්ටමින් ද අති විශාල වෙනසක් ඇත. කොළඹ නගරය පිහිටා ඇති බස්නාහිර පළාත, රටේ ජනගහනයෙන් සියයට 29 කට රැකවරණය සපයන අතර, දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 39 කට වැඩි ප්‍රමාණයක් උත්පාදනය කරයි. ප්‍රමාණවත් අධ්‍යාපන, සෞඛ්‍ය සහ යටිතල පහසුකම් නොමැතිවීම, සහ ප්‍රධාන වශයෙන් ග්‍රාමීය දිස්ත්‍රික්ක වල පවතින අවස්ථා නොමැතිකම බස්නාහිර සහ අනෙකුත් පළාත් අතර ආර්ථික අසමානාත්මතාවට ප්‍රධාන හේතු වේ. සාමාන්‍යයෙන්, සමස්ත ආර්ථික දෘෂ්ටිකෝණයකින් ගත් කළ, සුළුතරයින් ප්‍රමුඛව වෙසෙන පෙදෙස් වල ජනතාව, ජීවත්වීමේ අපහසුතා වලට වැඩියෙන් මුහුණ දෙති. එහෙත්, ඌව පළාතේ ප්‍රධාන වශයෙන් සිංහලයන් වෙසෙන පෙදෙස් ද ආර්ථිකව පීඩාවට පත්ව සිටින තත්ත්වයන් අත් විඳිති. රාජ්‍ය රැකියා සම්බන්ධයෙන් ගත් කළ, බහුතර ප්‍රජාවේ ඕනෑකම් පිරිමැසීමට අනුප්‍රාප්තික රජයන් දක්වන කැමැත්ත මත මෙම තත්ත්වය වඩාත් නරක අතට පත් වේ. සිංහල බෞද්ධයන් බඳවාගැනීම සඳහා වන මෙම වැඩි මනාපය විශේෂයෙන් හමුදාව තුළ ප්‍රබල ලෙස කැපී පෙනේ.[80]

සිවිල් යුද්ධය ප්‍රධාන වශයෙන් සටන් කෙරුණේ දෙමළ ජනතාව ප්‍රමුඛව වෙසෙන උතුරු නැගෙනහිර වන අතර, මෙම කලාපය ශුෂ්ක වීමත් සමඟ, එහි ආර්ථිකය වඩාත්ම දුක්ඛිත තත්ත්වයට පත්වීම කිසිසේත් පුදුමයට කරුණක් නොවේ. උතුරු පළාතේ දළ දේශීය නිෂ්පාදනය සියයට 5 ක් පමණ වන අතර, ශ්‍රී ලංකාවේ කුටුම්බයන් ගෙන් දුප්පත්ම කණ්ඩායමට වැටෙන ඉහළම ප්‍රතිශතය ජීවත්වන්නේ මුලතිව් (ජනගහනයෙන් සියයට 71), කිලිනොච්චි (සියයට 60 ක්) සහ මඩකලපුව (සියයට 65 ක්) යන උතුරු නැගෙනහිර දිස්ත්‍රික්ක තුළ ය.

පශ්චාත්-යුද සිංහල බෞද්ධ විජයග්‍රාහීත්වය සහ මිලිටරීකරණය හේතුවෙන් හමුදාව විසින් පවත්වා ගෙන යන සංචාරක පහසුකම් පිහිටුවීමත් සමඟ, එමඟින් ප්‍රදේශයේ සුළුතරයින් සඳහා ව්‍යවසායකත්ව අවස්ථා අවම වී ඇත. බොහෝ දේශපාලනඥයින්ගේ කඳවුරු රටේ වෙනත් ප්‍රදේශ වල පවතින බැවින් අනුප්‍රාප්තික සිංහල ආධිපත්‍ය දරන රජයන් ද උතුරු නැගෙනහිරට අවධානය යොමු කර ඇත්තේ අඩුවෙන් ය. සිවිල් යුද්ධයෙහි ප්‍රතිඵලයක් වූ මෙම නොසලකා හැරීම, උතුරු නැගෙනහිර පළාත් ආර්ථික වශයෙන් පසුබෑමට ලක්කිරීම සඳහා ඉටු කර ඇති කාර්යභාරය සුළු පටු නොවේ.

කඳුකරයේ ප්‍රධාන වශයෙන් ඉන්දියානු දෙමළ ජනතාව වන තේ වතු කම්කරුවන් දුගී තත්ත්වයන් යටතේ දිවි ගෙවන අතර, ඔවුන්ගේ පීඩාකාරී වැටුප් නිසි අධ්‍යාපනය හෝ සෞඛ්‍ය පහසුකම් වෙත ප්‍රවේශ වීම සඳහා ඔවුන්ට ඇති ඉඩප්‍රස්තා වළක්වයි. බොහෝ වතු දෙමළ තරුණ තරුණියන් නාගරික පෙදෙස් වල කුඩා සාප්පු සහ ආපනශාලා වල රැකියා සොයාගැනීමට සමත් වී ඇතත්, ලාභ ශ්‍රමය ලබාගැනීම සඳහා ස්ථිර සංචිතයක් පවත්වා ගැනීම සහතික කිරීමට මෙම ප්‍රදේශ සම්පත් වලින් දියුණු නොකිරීමට සමහර රජයේ බලධාරීන් අධිෂ්ඨාන කරගෙන සිටින බව පෙනේ.

මෙය කෙසේවෙතත්, කාන්තාවන්ට ගෙවන වැටුප අඩුවන අතර, ඔවුන්ට ඇත්තේ ශ්‍රම බලකායෙහි අඩු නියෝජනයකි. මෙසේ සිදුවන්නේ ද පිරිමින් සහ කාන්තාවන් ආසන්නව සමාන සාක්ෂරතා අනුපාතයන් භුක්ති විඳින අතර ය.

ඉන්දියානු දෙමළ සහ ශ්‍රී ලාංකීය දෙමළ ජනයාගේ දරිද්‍රතා අනුපාතිකයන් පිළිවෙලින්, සිංහල ජනයාගේ අගයට වඩා සියයට 3.3 ක් සහ 5.3 ක් වැඩිවේ. සමස්ත දරිද්‍රතා ශීර්ෂ අනුපාතය වන සියයට 32.1 සමඟ සංසන්දනය කිරීමේදී, ඉන්දියානු දෙමළ ජනතාව සඳහා දරිද්‍රතා ශීර්ෂ අනුපාතය සියයට 46.3 ක් සහ ශ්‍රී ලාංකීය දෙමළ ජනතාව සඳහා එම අගය සියයට 44.4 ක් වේ.[81]

උතුරු පළාතේ කාන්තා ගෘහ-මූලික කුටුම්බයන් විශාල සංඛ්‍යාවක් තිබීමෙන් දෙමළ ජාතික කාන්තාවෝ විශේෂයෙන් අවදානමට ලක් වෙති. වතු අංශය ද දෙමළ කාන්තාවන් විශාල සංඛ්‍යාවක් තේ දළු නෙලන්නියන් ලෙස සේවයෙහි යොදවන අතර, මෙම ප්‍රජාව දිගු කලක් තිස්සේ ශ්‍රී ලංකාව තුළ වැඩියෙන්ම වෙනස්කොට සැලකීමට සහ කොන්කිරීමට ලක්වූවන් අතර වෙති. බෙහෝ ඇඟලුම් කම්හල් සේවිකාවන් ද කාන්තාවෝ වෙති - දකුණෙහි සිංහල සහ උතුරෙහි සිවිල් යුද්ධයෙන් පසු විවෘත කෙරුණු ඇතැම් කම්හල් වල දෙමළ කාන්තාවෝ - අනෙක් පෙදෙස්වල බොහෝ අඩු ආදායම්ලාභී කාන්තාවන්ට වඩා සංවිධානය වී සහ සවිබල ගැන්වී සිටිය ද,[82] ඔව්හු ද සූරාකෑමට ලක්වෙති.[83] ප්‍රධාන වශයෙන් මැද පෙරදිග සේවය කරන කාන්තාවන්ගෙන් ලැබෙන ප්‍රේෂණ සමග ඒකාබද්ධ කළ විට, ශ්‍රී ලංකාවේ ආර්ථිකය කාන්තාවන්ගේ පිටකොන්ද මත දුවන්නේ සුළු පටු අන්දමකින් නොවන බව කිව හැකිය.

මෙය කෙසේවෙතත්, කාන්තාවන්ට ගෙවන වැටුප අඩුවන අතර, ඔවුන්ට ඇත්තේ ශ්‍රම බලකායෙහි අඩු නියෝජනයකි. මෙසේ සිදුවන්නේ ද පිරිමින් සහ කාන්තාවන් ආසන්නව සමාන සාක්ෂරතා අනුපාතයන් භුක්ති විඳින අතර ය. ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදු කළ ශ්‍රම බලකාය සමීක්ෂණයෙන් පෙන්නුම් කරන්නේ 2019 වසරේ දී පිරිමින් සියයට 73 කට සාපේක්ෂව කාන්තාවන්ගෙන් සියයට 35 ක් පමණක් ශ්‍රම බලකායට සහභාගි වූ බවයි. කළමනාකරණ තනතුරු වල සිටින කාන්තාවන් සියයට 26 ක් වූ අතර, තීරණ ගැනීමේ තනතුරු වල ඔවුන්ගේ සංඛ්‍යාව අඩු බව මෙයින් පැහැදිලි වේ.[84] තවද, 2016 වසරේ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් පෞද්ගලික අංශය සඳහා පවත්වන ලද අධ්‍යයනයකට අනුව, එකම රැකියාව සඳහා කාන්තා සේවිකාවන් හට උපයා ගත හැකි වන්නේ සිය පිරිමි සගයන්ට වඩා සියයට 30 ත් 36 ත් අතර අඩු ප්‍රමාණයකි.

රට පුරා ශ්‍රී ලාංකිකයින්ට දේපල හිමි වන අතර, නිදහසේ දේපල මිලදී ගැනීමට සහ විකිණීමට හැකියාව ඇත. මුස්ලිම් ප්‍රජාව ගත් කළ, මෙය සැමවිටම එසේ නොවීමට ඉඩ ඇත. මන්දයත්, මුස්ලිම්වරුන්ට විකිණීමට අකමැති අය හෝ මුස්ලිම්වරුන්ට නොවිකුණන ලෙස වඩා ජාතිකවාදී පුද්ගලයන් යටතේ බලපෑමට ලක්වන අය සිටින බැවිනි. මෙයින් අදහස් කෙරෙන්නේ, බොහෝවිට මුස්ලිම්වරුන්ට අතරමැදියන් භාවිතා කර දේපළ මිලදී ගැනීමට වැඩි මුදලක් ගෙවීමට සිදුවන බවයි. උතුරු නැගෙනහිර දිගින් දිගටම සිදුකෙරෙන මිලිටරීකරණය ද දෙමළ ජනයාට (යම්තාක් දුරට මුස්ලිම් ජනයාට ද) සිය පාරම්පරික ඉඩම් වෙත ප්‍රවේශ වීම වළක්වා ඇත. දේශපාලන බලපෑම් ඇති අය රාජ්‍ය ඉඩම් අත්පත් කරගන්නා ඉඩම් කොල්ලය සාමාන්‍ය දෙයක් බවට පත්ව ඇති අතර, එය දිවයිනේ නීතියේ ආධිපත්‍යය පිරිහීම පිළිබඳව හඬ නඟයි. විශේෂයෙන්ම, දෙමළ ජනතාව, සිවිල් යුද්ධය අවසන් වූ තැන් පටන් මෙම පුරුද්දෙහි ගොදුරු බවට පත්ව ඇත.[85]

## 13. සමාජීය අසමානාත්මතාවන්

## සමස්ත ලකුණු: 7

ආගම | **සමස්ත ලකුණු: 7**

ජනවාර්ගිකත්වය | **සමස්ත ලකුණු: 7**

ශ්‍රී ලංකාවේ පුළුල් සමාජ සුබසාධන වැඩසටහන - බෙහෙත් ශාලා, ආරෝග්‍යශාලා, වැඩිහිටි රැකවරණ නිවාස, පාසල්, විශ්වවිද්‍යාල සහ අනාථ නිවාස දක්වා දිවෙන රාජ්‍ය ආයතන වල නිදහස් සෞඛ්‍ය සහ අධ්‍යාපන පහසුකම් - රට මානව සංවර්ධන දර්ශකයෙහි සාපේක්ෂව ඉහළ ශ්‍රේණිගත

මේ අනුව, රට සෞඛ්‍යය හා අධ්‍යාපනයට වඩා හමුදා වියදම් කෙරෙහි සම්පත් වැඩියෙන් බෙදා වෙන් කිරීම අඛණ්ඩව කරගෙන යන අතර, COVID-19 වසංගතය තිබියදීත් එසේ සිදුවිය.

කිරීමක තැබීමට උපකාරී වී ඇත. සිවිල් යුද්ධය අතරතුර දී කැරලිකරුවන් අත්පත් කරගෙන සිටි ප්‍රදේශ වල ආයතන වලට අරමුදල් සැපයීමට රජය වෙහෙසවීමෙන් සමාජ සුබසාධන වැඩසටහන් කෙරෙහි වූ අතිමහත් කැපවීම ඉස්මතු කරයි (එල්ටීටීඊය පාලනය කල ප්‍රදේශ වල දෙමළ ජනතාව වෙනුවෙන් ද රජය කැපවී සිටින බවට කළ ප්‍රකාශය නිත්‍යානුකූල කළ අතරම). මෙම කැපවීම ජනගහනයෙහි බොහෝ දෙනා අතර හිමිකමක් ලෙස දැන් සලකනු ලබන අතර, කිසිවෙකු විසින් සමාජ වැඩසටහන් කපා හැරීමට හෝ පෞද්ගලිකකරණය කිරීමට උත්සාහ දරන සෑමවිටකම විරෝධතා පැන නඟී.

කෙසේවෙතත්, එවැනි වැඩසටහන් හා සම්බන්ධ ගුණාත්මකභාවය අඩාල වී ඇති අතර, සම්පත් හිඟවීම, දූෂණය සහ යුද්ධයෙන් පසුව පවා උද්ධමනය වූ හමුදා අයවැය මෙයට අර්ධ වශයෙන් හේතු වී ඇත. නිදසුනක් වශයෙන්, සිවිල් යුද්ධය අවසන් වීමෙන් පසු ශ්‍රී ලංකාව සිය හමුදාව සේවයෙන් මුදාහැරීම ප්‍රතික්ෂේප කළ අතර, සන්නද්ධ සේවාවන් ප්‍රධාන වශයෙන් සිංහල බෞද්ධයන් සේවයේ යොදවා තිබීම සහ හමුදාව දැන් රැකියා වැඩසටහනක් ලෙස සැලකීම මෙයට අර්ධ වශයෙන් හේතු විය හැක. මේ අනුව, රට සෞඛ්‍යය හා අධ්‍යාපනයට වඩා හමුදා වියදම් කෙරෙහි සම්පත් වැඩියෙන් බෙදා වෙන් කිරීම අඛණ්ඩව කරගෙන යන අතර, COVID-19 වසංගතය තිබියදීත් එසේ සිදුවිය.[86] දිවයින මුහුණ දී තිබෙන විදේශ මුදල් අර්බුදය හේතුවෙන් රජයට ආනයන කප්පාදු කිරීමට සිදුවී ඇති අතර, මෙයට අත්‍යවශ්‍ය ඖෂධ ද ඇතුළත් වේ. මේ අනුව, රටේ පවතින ආර්ථික ගැටලු හේතුවෙන් සෞඛ්‍ය ක්ෂේත්‍රය වැඩියෙන්ම නරක අතට හැරීමට ඉඩ තිබේ.

කොරෝනා වයිරසය අධ්‍යාපනයේ ඇති නාගරික-ග්‍රාමීය බෙදීම විශේෂයෙන් ඉස්මතු කර ඇත. ග්‍රාමීය පෙදෙස්වල පාසැල් වල ගුණාත්මක බවින් යුතු ගුරුවරුන් සහ පහසුකම් නොමැති වුවද, ශ්‍රී ලංකාවේ දරුවන් සියල්ලෝම පාහේ ප්‍රාථමික පාසැල් වලට පැමිණෙති. විශ්වවිද්‍යාල අධ්‍යාපනය නොමිලේ පවතින අතර, ග්‍රාමීය සිසුහු විශ්වවිද්‍යාල තුළ හොඳින් නියෝජනය කෙරෙති (අර්ධ වශයෙන් බර තැබීමේ ක්‍රමවේදය (weightage system) හේතුවෙන්). නමුත් සියලුම ඉගැන්වීම් බලහත්කාරයෙන් මාර්ගගතව සිදු කළ විට, පරිගණක හෝ ස්මාර්ට් දුරකථන ප්‍රවේශයක් නොමැති ග්‍රාමීය ප්‍රදේශ හෝ දුප්පත් පවුල් සිය දරුවන් පාඩම් සමඟ රැඳී සිටීම සහතික කිරීම සඳහා අතිශය බේදජනක අභියෝග වලට මුහුණ දුන්හ. ග්‍රාමීය ප්‍රදේශ වල සිසුන් අන්තර්ජාල සංඥා ලබා ගැනීම සඳහා වහල, ගස්, ගල් මත නැඟ සිටීම පිළිබඳව මාධ්‍ය නිරන්තරයෙන් වාර්තා කළේය. පුවත් වාර්තා මත පදනම්ව, අන්තර්ජාල ප්‍රවේශය ඇත්තේ සිසුන්ගෙන් සියයට 50 කට අඩු සංඛ්‍යාවකට ය. කුඩා පාසැල් වල සිසුන්ගෙන් මාර්ගගත අධ්‍යාපනයට ප්‍රවේශය ලබාගත හැක්කේ සියයට අටකට පමණ වේ. වඩා විශාල, වඩා හොඳ සම්පත් සහිත පාසැල් වල පවා, අන්තර්ජාලයට පහසු ප්‍රවේශයක් තිබුණේ, සිසුන්ගෙන් සියයට 59 ක් හට පමණි. රට තුළ දුර්වල අන්දමින් සැලසුම් කර ඇති මාර්ගගත අධ්‍යාපනය හේතුවෙන් සිසුන්ගෙන් සියයට 60 ක් පාසැල් හැර යාමට නියමිත බව ඇස්තමේන්තු ගත කර ඇත.[87]

නාගරික-ග්‍රාමීය අසමානකම් අධ්‍යාපනයට පමණක් නොව සංවර්ධනය ඇතුළු සියළු සාධක වලට ද බලපායි. කොළඹ නගරය පිහිටා ඇති බස්නාහිර පළාත දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 40 කට වඩා උත්පාදනය කරයි. 2015 දත්ත වලට අනුව, මධ්‍යම සහ දකුණු යන එක් එක් පළාත දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 10 කට වඩා දායක වී ඇති අතර, (ප්‍රධාන වශයෙන් දෙමළ වන) උතුරු පළාත දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 5.4 ක දායකත්වයක් ලබා දී ඇත. සිංහලයන්ට වඩා වැඩි දෙමළ හා මුස්ලිම් ජාතිකයින් සංඛ්‍යාවක් වෙසෙන නැගෙනහිර පළාත ද දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 6 ක් පමණක් දායක විය.[88] ජනගහන සාන්ද්‍රණය අනුව ගතහොත්, ප්‍රධාන වශයෙන් සුළුතරයින් වෙසෙන ග්‍රාමීය පෙදෙස් වලට සම්පත් අඩුවෙන් ඇති අතර, ඒවා වඩා විශාල සමාජීය අසමානාත්මතාවන් ගෙන් පීඩා විඳියි.

දිවයිනෙහි සාක්ෂරතා අනුපාතය සියයට 92 ක පමණ ඉහළ අගයක් ගැනීමට හේතු වන්නේ අධ්‍යාපනය සඳහා ඇති නිදහස් ප්‍රවේශයයි. නමුත් ඉහත සඳහන් කළ පරිදි, මෙය පළාත් හරහා පවතින විවිධ ප්‍රමිතීන් පිළිබිඹු නොකරයි. කොළඹ සහ විශාල නගර වල ඉතා හොඳ පෞද්ගලික සහ රජයේ පාසල් දිගින් දිගටම පවත්වා ගෙන යනු ලබයි. පසුගිය දශක හතර තුළ ඉහළ ගොස් ඇති ජාත්‍යන්තර පාසල් සංඛ්‍යාව ප්‍රධාන වශයෙන් වඩා ඉහළ-ආදායම් ලබන සමාජ පන්ති වලට ඉංග්‍රීසි භාෂාවෙන් සේවා සපයන අතර, ඒවායේ ව්‍යාප්තිය ආර්ථික බෙදීම ඉස්මතු කර ඇත. මෙම සියලුම ආයතන වලට ගැහැණු සහ පිරිමි ශිෂ්‍ය ශිෂ්‍යාවන් දෙවර්ගයටම අධ්‍යාපනය සඳහා ප්‍රවේශය ඇත. සැබවින්ම, ද්විතියික අධ්‍යාපනය සඳහා කාන්තාවන් ඇතුළත් කර ගැනීම පිරිමින් ඇතුළත් කර ගැනීම මෙන්ම,

ස්ත්‍රී පුරුෂ සමාජභාවීය විසමතාවන් පැවතීමෙන් කාන්තාවෝ වඩා පහළ නිපුණතා සමඟ සිටීමේ ප්‍රතිඵලයක් ලෙස අඩු වේතන සහිත රැකියා කරති.

හොඳ මට්ටමක පවතින අතර,[89] තෘතීයික අධ්‍යාපනය සඳහා කාන්තාවන් ඇතුළත් කර ගැනීම පිරිමින් අභිබවා යයි.[90]

කෙසේවෙතත්, බඳවා ගැනීම් ඉහළ මට්ටමක තිබියදීත්, ස්ත්‍රී පුරුෂ සමාජභාවීය විසමතාවන් පැවතීමෙන් කාන්තාවෝ වඩා පහළ නිපුණතා සමඟ සිටීමේ ප්‍රතිඵලයක් ලෙස අඩු වේතන සහිත රැකියා කරති. රටේ තවමත් පවතින ප්‍රධාන වශයෙන් පීතෘමූලික සමාජයට අනුකූලව (අනෙකුත් දකුණු ආසියාතික රාජ්‍යයන් හා සසඳන විට ශ්‍රී ලංකාව මේ සම්බන්ධයෙන් වඩා හොඳ ස්ථානයක සිටිය ද) පිරිමින් සලකනු ලබන්නේ පවුලේ තීරණ ගන්නන් ලෙස ය. මෙම සම්මතයන් කුටුම්බය තුළ සබඳතා හැඩගස්වන අතර, සමාජීය අසමානාත්මතාවන්ට දායක වන ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ශ්‍රම විභාජනයට සහ කාන්තා සේවානියුක්තීන් හට වඩා පහළ ශ්‍රේණිවල රැකියා සඳහා ඒවා දායක වෙයි.

ශ්‍රී ලංකාවේ ආගමික කණ්ඩායම් වලට ඔවුන්ගේම පාසල් අධීක්ෂණය කළ හැකි වේ. මෙය බහුත්වවාදයට දායක වන අතරම, විවිධ ආගම් පසුබිම් වලින් පැමිණෙන සිසුන් ඔවුනොවුන් අතර මිශ්‍ර වීම ද වළක්වා ඇත. මෑතකදී, මද්‍රාසා පාසල් ඉහළ යාම (විශේෂයෙන් ලියාපදිංචි නොවූ ඒවා) වර්ගවාදී හැඟීම් ඇවිස්සීමට වුවමනා අය විසින් ගැටළුවක් කර ගෙන ඇත.

විශ්වවිද්‍යාල මට්ටමින් ගත් කළ, බොහෝ සිසුන් කලා විෂය ධාරාවේ නවතින අතර, මෙය ග්‍රාමීය පෙදෙස් වලින් එන සිසුන් සඳහා විශේෂයෙන් සත්‍ය වේ. මෙයට අර්ධ වශයෙන් හේතු වී ඇත්තේ, විද්‍යාව පදනම් කරගත් ක්ෂේත්‍රයන් හා සම්බන්ධ වඩා දුෂ්කර විෂයමාලා සහ ග්‍රාමීය පෙදෙස් වල විද්‍යාව පදනම් කරගත් අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමේ ප්‍රමාණවත් පහසුකම් නොමැති වීම ය. මෙහි ප්‍රතිඵලය වනුයේ, මෙම සිසුන් තමන්ට අවශ්‍ය අලෙවි කරගත හැකි කුසලතා වලින් තොරව උපාධි ලබාගෙන, සාමාන්‍යයෙන් රජයේ රැකියා සඳහා ඉල්ලා සිටීමේ දී ඉදිරියෙන්ම සිටීම ය. ශ්‍රී ලංකාව සතුව පිම්බුණු රාජ්‍ය අංශයක් තිබීමට මෙය එක් හේතුවකි. COVID මගින් ප්‍රේරණය වුණු ආර්ථික අභියෝග සමඟ ශ්‍රී ලංකාවේ දුර්වල ආණ්ඩුකරණය, විදේශ රැකියා සෙවීමට උත්සාහ කිරීමට තරුණ තරුණියන් විශාල පිරිසක් පොළඹවා ඇත. වසංගතය සම්බන්ධයෙන් මහජන මතය තක්සේරු කිරීම සඳහා දියත් කරන ලද ශ්‍රී ලංකා මතය විමසීමේ සමීක්ෂණයෙහි ප්‍රතිඵල සෞඛ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ ආයතනය (IHP) විසින් නිකුත් කළ විට මෙය විශේෂයෙන් පැහැදිලි විය. ශ්‍රී ලාංකිකයන්ගෙන් සියයට 27 ක් පමණ විදේශගත වීමට කැමැත්තක් දක්වන බවට එය සාක්ෂි දරයි.[91] වැඩිපුරම සංක්‍රමණය වීමට අවශ්‍යව ඇත්තේ තරුණ තරුණියන්ට සහ උගතුන්ට වන අතර, දෙදෙනෙකුගෙන් එක් අයෙකු පමණ තමන්ට රට හැරයාමට අවශ්‍ය බව පවසයි. සිදුවිය හැකි මෙම බුද්ධි ගලනය ගැන රජය සැලකිලිමත් වන බවක් නොපෙනේ; ඒ වෙනුවට, මෙය බෙහෙවින් අවශ්‍ය වන විදේශ මුදල් උත්පාදනය සඳහා විභවීය විසඳුමක් ලෙස දකින බව පෙනේ. ඇත්ත වශයෙන්ම, රටේ ආර්ථික තත්ත්වය කෙතරම් භයානක ද කිවහොත්, අයදුම් කරන සියල්ලන්ට විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීමට රජය බලවත් පරිශ්‍රමයක යෙදෙන අතරම,[92] රජයේ සේවකයින්ට තම රැකියාවෙන් නිවාඩු අවසර ලබාගෙන රැකියා සඳහා විදේශගත වීමට පවා ඔවුන්ව දිරි ගන්වයි.[93]

## 14. සංස්කෘතික අසමානාත්මතාවන

## සමස්ත ලකුණු: 7

ආගම | **සමස්ත ලකුණු: 7**

ජනවාර්ගිකත්වය | **සමස්ත ලකුණු: 7**

ජනවාර්ගික ආස්ථානයකින් බලන කල, ශ්‍රී ලංකාව ප්‍රධාන වශයෙන් සිංහල (සියයට 75) සහ ආගමික ආස්ථානයකින් බලන කල එය ප්‍රධාන වශයෙන් බෞද්ධ (සියයට 70) වේ. රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බුද්ධාගමට "ප්‍රමුඛස්ථානය" ලබාදෙයි. එයින් අදහස් කරන්නේ අනෙකුත් ආගමික ප්‍රජාවන්ට අයත් වන්නන් වඩා පහත් මට්ටමක සිටින බවයි. මේ සියල්ල ගොඩනැඟෙන්නේ ශ්‍රී ලංකාව සිංහද්වීපය (සිංහලයන්ගේ දිවයින) සහ ධම්මදීපය (බුද්ධ ධර්මය සඳහා සුරක්ෂිතාගාරයක් වන දිවයින)

සියලුම ප්‍රධාන ආගමික උත්සව ජාතික නිවාඩු දිනයන් වන අතර, ප්‍රමුඛ පෙළේ බෞද්ධ දේශපාලන නායකයන් මුස්ලිම්, හින්දු සහ ක්‍රිස්තියානි භක්තිකයින් සමඟ ආගමික උත්සව වලදී සම්බන්ධ වීම සාමාන්‍ය දෙයකි.

යනුවෙන් දැනට ගැබ් වී ඇති මතය පදනම් කර ගෙන ය.[94] මෙයින් පැන නඟින ජාතිකවාදී මතවාදය ප්‍රකාශ කරන්නේ සිංහල බෞද්ධයන්ට ඇත්තේ ශ්‍රී ලංකාව පමණක් බවත්, ආගමික සුළුතරයින්ට වෙනත් තැන් වල (හින්දු භක්තිකයින් ඉන්දියාවේ, මුස්ලිම්වරුන් මැද පෙරදිග සහ කතෝලිකයින් බටහිර රටවල) ස්ථාන ගත විය හැකි බවත් ය. තවද, අබෞද්ධයින්ට රට තුළ ජීවත්විය හැකි නමුත්, සිංහල බෞද්ධයන්ගේ අධිපති තත්ත්වයට අභියෝග කරන අනවශ්‍ය ඉල්ලීම් නොකළ යුතු බවත් ය. මෙම සන්දර්භය තුළ, දිවයින එයට හිමි පංගුවටත් වඩා සංස්කෘතික අසමානාත්මතාවන් අත්විඳීම කිසිසේත් පුදුමයට කරුණක් නොවේ.

එක් අතකින්, සියලුම තරාතිරම් වල ශ්‍රී ලාංකිකයෝ තම තමන්ගේ සංස්කෘතීන් විවෘතව සමරති. කෙටියෙන් කිවහොත්, අබෞද්ධයින් සිය අසමසම අනන්‍යතාවන් රහසිගතව සමරන්නේ නැත. සියලුම ප්‍රධාන ආගමික උත්සව ජාතික නිවාඩු දිනයන් වන අතර, ප්‍රමුඛ පෙළේ බෞද්ධ දේශපාලන නායකයන් මුස්ලිම්, හින්දු සහ ක්‍රිස්තියානි භක්තිකයින් සමඟ ආගමික උත්සව වලදී සම්බන්ධ වීම සාමාන්‍ය දෙයකි. උඩරට නීතිය, තේසවලාමේ සහ මුස්ලිම් නීතිය වැනි විවිධ ප්‍රජාවන්ට විශේෂිත වූ පුද්ගලික නීති රට තුළ බහුත්වවාදී හැඟීමට එකතු කරයි. සියයට 90 කට ආසන්න පිරිසකට තම ආගම නිදහසේ ඇදහීමට හැකිය යන්න හැඟී ඇති බව 2019 දී සිදුකළ සමීක්ෂණයකින් පෙන්නුම් කළේ හොඳ හේතු සහිතවය.[95] ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ බලයෙන් පහ කරන ලෙස ඉල්ලමින් පැවති ජනහමු වලදී පෙන්නුම් කළ සර්ව-ආගමික සුහදකම මඟින් මෙය තවත් ශක්තිමත් කර ඇත.

කෙසේවෙතත්, ජාතිකවාදී කොටස් පෞද්ගලික හෝ දේශපාලන වාසි තකා වාර්ගවාදී හැඟීම් අවුලුවා ලීමට කලින් කලට උත්සාහ දරා ඇත. සිවිල් යුද්ධය පැවති සමයේ, සහ වඩා මෑතකදී පවා, එල්ටීටීඊය ඇතැම් අවස්ථා වලදී බෞද්ධ භික්ෂූන් වහන්සේලා ඝාතනය කර, රටේ අති පූජනීය බෞද්ධ විහාරස්ථානයට පහර දුන් අතරම, ඇතැම් සිංහල රැඩිකල්වාදීහු හින්දු කෝවිල් වලට පහර දුන්හ.[96] මෙසේ සිදුවූයේ සිවිල් යුද්ධය ප්‍රධාන වශයෙන් ජනවාර්ගික ගැටුමක් මිස ආගමික ගැටුමක් නොවී තිබියදීත් ය.[97] තවද එල්ටීටීඊය නැගෙනහිර පළාතේ මුස්ලිම් පල්ලි වලට පහරදී මුස්ලිම් බැතිමතුන් ඝාතනය කළේය.[98] 2000 ගණන් වල මුල් භාගයේ දී රැඩිකල් බෞද්ධ භික්ෂූන් ද කතෝලික දේවස්ථාන ඉලක්ක කර ගත් අතර,[99] විශේෂයෙන් රටේ ග්‍රාමීය පෙදෙස් වල ශුභාරංචි දේශකයින් දිගු කලක් තිස්සේ හිරිහැර කිරීම් වලට ලක්ව ඇත. ආගම මිනිසුන්ගේ අනන්‍යතාවන්ට වෙන් කල නොහැකි ලෙස සම්බන්ධ වී ඇති ආකාරය සැලකිල්ලට ගන්නා විට, මේ සියල්ල සංස්කෘතික රිස්සීම අඩපණ කළේය.

සිවිල් යුද්ධයෙන් පසු, සංස්කෘතික වශයෙන් සම්බන්ධ වෙනස්කොට සැලකීමේ පීඩාවට මුහුණ දී ඇත්තේ මුස්ලිම් ප්‍රජාවයි. බුර්කාව සහ නිකාබය පළඳින කාන්තාවන්ගේ සංඛ්‍යාව ඉහළ යාමෙන්, ප්‍රමුඛ බෞද්ධ සංස්කෘතිය විපර්වර්තනය වන බවට හැඟීමක් ඇති කිරීමට හේතු වූ අතර, එය ජාතිකවාදීන් විසින් මුස්ලිම්-විරෝධී සිත්ගන්නාසුළු කතා උග්‍ර කිරීමට හේතු වී ඇත.[100] දකුණු ආසියාවට ආගන්තුක ලෙස සලකනු ලැබූ මෙම ඇඳුම සිවිල් යුද්ධය අවසන් වනතුරු ගැටළුවක් කරගෙන නොතිබුණු අතර, මුස්ලිම්වරුන් දිවයිනේ සංස්කෘතික උරුමයට තර්ජනයක් බව පවසමින් සිංහල බෞද්ධ ජාතිකවාදීහු ඒකරාශී වීමට තීරණය කළහ. කෙටියෙන් කිවහොත්, කාන්තා ඇඳුම් විශේෂයෙන් ජනවාර්ගික-ජාතික අරමුණු සඳහා ආයුධ බවට පත්විය. පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාර 2021 අප්‍රේල් මාසයේ දී සම්පූර්ණ මුහුණු ආවරණය තහනම් කිරීම සඳහා නීති කෙටුම්පත් කිරීමට කැබිනට් මණ්ඩලයේ ඡන්දය ප්‍රකාශ කිරීමට හේතු වූ පෙළඹවීමක් විය. මුස්ලිම් ප්‍රභූන් වඩාත් ගතානුගතික හා නම්‍යශීලී නොවූ කාන්තාවන් වර්ණයෙන් යුතු (කළු පාටට වෙනස්ව) බුර්කාවන් ඇඳීම සඳහා පෙළඹවීමට උත්සාහ දරා ඇතත්, මේ දක්වා, බුර්කාව හෝ නිකාබය ඇඳීමට තෝරා ගන්නා බොහෝ මුස්ලිම් කාන්තාවෝ කළු වර්ණයෙන් යුතු ඇඳුම් ඇඳීමට පෙළඹෙති.

කෙටියෙන් කිවහොත්, ශ්‍රී ලාංකිකයන්ට ඔවුන්ගේ සංස්කෘතීන් සාපේක්ෂ වශයෙන් නිදහසේ පරිචයනය කළ හැකි වුවද, මෙය අඩුවීමට හේතු වන්නේ රාජ්‍යය විසින් විවිධත්වය උද්යෝගයෙන් ප්‍රවර්ධනය කරන බැවින් සහ මෙය වැඩිවීමට හේතු වන්නේ සුළුතරයින් විසින් තමන්ට අදාළ සංස්කෘතික සැමරුම් මූලික අයිතිවාසිකමක් ලෙස සලකන බැවිනි. ඒ අතරම, බහුතර හැඟීම් වලට හානි නොකර සිය උරුමය සැමරිය යුතු බව සුළු ජාතීහු දනිති. දිවයිනේ සියලුම සංස්කෘතීන් සඳහා එක හා සමාන ගෞරවයක් නොමැති බව මෙසේ සුපරීක්ෂාකාරී වීම මඟින් පෙන්වා දෙයි.

# 15. යුක්තියට ඇති ප්‍රවේශය
# සමස්ත ලකුණු: 5

ආගම | **සමස්ත ලකුණු: 5**
ජනවාර්ගිකත්වය | **සමස්ත ලකුණු: 5**

යුක්තියට ඇති ප්‍රවේශය ශ්‍රී ලංකාවේ ආණ්ඩුකරණයේ දුර්වලම ක්ෂේත්‍රයන් අතර වේ. නඩු මඟට බැසීම හා සම්බන්ධ ඉතා අධික වියදම්, නඩු ප්‍රමාදවීම් හේතුවෙන් සිදුවන නෛතික ප්‍රමාදවීම්, දේශපාලන ඇඟිලි ගැසීම් සහ දූෂණය යන මේ සියල්ල මෙම ප්‍රතිඵලයට දායක වේ. ශ්‍රී ලංකාවේ අධිකරණය විශේෂයෙන් වඩා පහළ මට්ටම් වලදී අපකීර්තියට පත්ව ඇත, මෙය අර්ධ වශයෙන් උසස්වීම් ලබාගැනීමට ඇති පීඩනය සහ එවැනි උසස්වීම් විශේෂයෙන් පසුගිය දශක තුන තුළ දේශපාලනීකරණය වීම හේතුවෙනි.[101] එය තරමක් විෂම අධිකරණ පද්ධතියකට තුඩු දී ඇති අතර, ඉහළ උසාවි මඟින් නිර්භීත සහ හොඳින් ප්‍රකාශිත අදහස් බොහෝවිට ඉදිරිපත් කරනු ලබන අතර, පහළ මට්ටම් වල සමහර විනිසුරුවරු මූලික ප්‍රඥප්ති අවබෝධ කර ගැනීමට බලවත් පරිශ්‍රමයක යෙදෙති.

රටේ නෛතික තන්ත්‍රය පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් ආරක්‍ෂා කරයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, සංගම් ගතවීමේ නිදහස, ජාතිය, ආගම, සහ දේශපාලනික මතය අනුව වෙනස්කොට සැලකීමට ලක්වීමට එරෙහි තහනම් කිරීම තහවුරු කරයි. එය හොඳින් සැකසූ අපරාධ යුක්ති පද්ධතියක් ද සහතික කරයි. මෙය, මානව හිමිකම් උල්ලංඝනයන්හි වින්දිතයන්ට කිසිදු හෝ වියදමකින් තොරව සහ පද්ධතියේ විධිමත් දැඩි බවට යටත් නොවී සහන ලබා ගැනීමට මාර්ග සලසන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වැනි ආයතන වලට අමතරව ය.

නීතිය යොදා ගැනීම, විශේෂයෙන්ම රටේ විවිධ ජනවාර්ගික-ආගමික ස්වභාවය සැලකිල්ලට ගන්නා විට, එහි ව්‍යවස්ථාපිත නීති වලට හාත්පසින්ම වෙනස් වේ. මෙයට අර්ධ වශයෙන් හේතු වී ඇත්තේ, අනෙකුත් ආගම් වලට අවාසි වන ආකාරයට වසර ගණනාවක් පුරා අධිකරණය විසින් බුද්ධාගමේ වරප්‍රසාද ලත් තත්ත්වය තහවුරු කරමින්, නීති අර්ථකථනය කර ඇති ආකාරයයි. නිදසුනක් වශයෙන්, රාජ්‍යයට කළ හැක්කේ ව්‍යවස්ථානුකූලව බුද්ධාගම ආරක්‍ෂා කිරීම පමණක් බව 2003 දී ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කළ අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් කෙනෙකුගේ ආගම ප්‍රචාරය කිරීමේ අයිතිය ආරක්‍ෂා නොකරන බව එම අධිකරණයම 2017 දී තීන්දු කළේය.[102]

අධිකරණයේ ඉහළම තල වලට පත්කර ඇති දෙමළ භාෂාව කතා කරන විනිසුරුවරුන් සංඛ්‍යාව ද අල්ප ය.[103] අපරාධ නඩු කටයුතු ආරම්භ කරන පොලීසියට ප්‍රමාණවත් දෙමළ භාෂාව කතා කරන පිරිස් නොමැත. ප්‍රදේශය තුළ සිංහල ජනතාව වැඩිවන තරමට, දෙමළ කතා කරන්නෙකුට සිංහලෙන් ලියා ඇති පොලිස් වාර්තාවකට/පැමිණිල්ලකට/චෝදනා පත්‍රයකට අත්සන් කිරීමට අවශ්‍ය වන අවස්ථා වැඩි විය හැකිය. නීතිපති කාර්යාලයේ ද දෙමළ භාෂාව කතා කරන රජයේ නීතිඥවරුන් ඇත්තේ ස්වල්ප දෙනෙකි. තවත් අඩුපාඩුවක් වනුයේ ඉහළ අධිකරණ වල සිටින කාන්තාවන් සංඛ්‍යාව කුඩා වීම[104] සහ අධිකරණය හා සම්බන්ධ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය වෙනස්කොට සැලකීමට මෙය බලපා හැකි ආකාරයයි.[105] අධිකරණ පද්ධතියේ ධූරාවලියේ ඉහළට යන විට, අවශ්‍ය කරන විවිධත්වය අඩු වේ.

බහුත්වවාදය සඳහා වූ ගෝලීය කේන්ද්‍රය (කේන්ද්‍රය) මඟින් පැවැත්වූ බහුත්වවාදයෙහි අවබෝධයන් පිළිබඳ සමීක්‍ෂණයෙහි ප්‍රතිචාරකයින්ගෙන් යුක්තිය සහ නීතිය බලාත්මක කරන රාජ්‍ය ආයතන වල අවංකකම ගැන තමන්ට විශ්වාසයක් ඇති බව පවසනු ලැබුවේ හතරෙන් එකක් පමණකි. එයට හේතුව වූයේ යුක්තිය පසිඳලීම හා සම්බන්ධ වියදම සහ ප්‍රමාදය යි.[106] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සිදු කරන ලද වෙනම සමීක්‍ෂණයකින් ද පැහැදිලි වූයේ ශ්‍රී ලාංකිකයන්ගෙන් සියයට 60 කට ආසන්න ප්‍රමාණයක් දිවයිනේ නීතිය හා සාමයෙහි තත්ත්වය පිළිබඳව සෑහීමකට පත් නොවන බවයි.[107] 2017 දී, දණ්ඩ නීති සංග්‍රහය සහ අපරාධ නඩු විධාන සංග්‍රහය සංශෝධන කිරීම පිළිබඳව වූ විශේෂ කමිටුවක් වාර්තා කළේ අපරාධ නඩු විභාගයක් අවසන් කිරීමට වසර 10.2 ක් සහ අභියාචනා ක්‍රියාවලියක් පැවැත්වීමට තවත් වසර හතක් ගත වූ බවයි.[108]

**ත්‍රස්තවාදී ක්‍රියාවල නිරත වූ බවට සැක කරන අය ඇප නොමැතිව දින නියමයක් නොමැතිව රඳවා තබාගැනීමට අවසර දෙන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත, සුළු ජාතීන්ට බලපා ඇති ඉතාමත් කුරිරු ආඥාපනත් අතර වේ.**

බලයේ සිටින රජය මත අධිකරණයේ ස්වාධීනත්වය වෙනස් වී ඇත. අධිකරණයේ ස්වාධීනත්වය සහ ඒ ආශ්‍රිත ආයතන අයුතු දේශපාලන බලපෑම් වලින් මුදවාගැනීමට ප්‍රයත්නයන් දරා ඇති අතර, මේ සඳහා පිළිවෙලින්, 2000 සහ 2015 වසර වල 17 වැනි සහ 19 වැනි ව්‍යවස්ථා සංශෝධනයන් හරහා මෑතකදී උත්සාහ දරා ඇත. කෙසේවෙතත්, 20 වැනි සංශෝධනය (සහ ඊට පෙර 18 වැනි සංශෝධනය) ඉහළ අධිකරණයට, රාජ්‍ය පරිපාලනයට සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වැනි අධීක්ෂණ ආයතන වලට පවා ඒකපාර්ශවික පත්වීම් කිරීමට ජනාධිපතිවරයාට ඉඩ සලසයි, මෙය ද නීතිපති කාර්යාලය විධායක ජනාධිපති ක්‍රමයේ උපාංගයක් ලෙස ක්‍රියා කරන අතර (ජනතාවගේ අවශ්‍යතා මත ස්වාධීනව ක්‍රියාත්මක කිරීමට විරුද්ධ අන්දමින්) ඊටත් ඉහළින් ය. තත්ත්වය වඩාත් නරක අතට හරවමින්, නීතිපති කාර්යාලයේ බොහෝ දෙනෙකු ඉහළ අධිකරණ වලට පත් කර ඇත්තේ අධිකරණයේ ඉහළ තරාතිරම් වල විධායක මානසිකත්වයකට දායක කරමිනි.[109] ඔවුන් රජයේ සාමාජිකයන් කිහිප දෙනෙකු අල්ලස් හා දූෂණ සම්බන්ධ නඩු වලින් නිදහස් කර ඇති ආකාරය සැලකිල්ලට ගන්නා විට, 20 වැනි ව්‍යවස්ථා සංශෝධනය සම්මත වීමෙන් පසු ගත් තීරණ කිහිපයක්ම, විශේෂයෙන් අධිකරණයේ ස්වාධීනත්වය කෙරෙහි මහජන විශ්වාසය කෙලෙසා ඇත. ඉවත දැමූ නඩු අතර සාපරාධී ක්‍රියාවන් සිදුකළ බව පැවසෙන ආරක්ෂක සේවක පිරිස් සම්බන්ධ නඩු ද වේ.[110]

ත්‍රස්තවාදී ක්‍රියාවල නිරත වූ බවට සැක කරන අය ඇප නොමැතිව දින නියමයක් නොමැතිව රඳවා තබාගැනීමට අවසර දෙන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත, සුළු ජාතීන්ට බලපා ඇති ඉතාමත් කුරිරු ආඥාපනත් අතර වේ. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මුලින් සම්මත කරන ලද්දේ දෙමළ බෙදුම්වාදයට ප්‍රතිචාරයක් වශයෙනි. නමුත් එතැන් පටන්, ඉතාමත් සුළු සැකයක් සඳහා පවා (2019 පාස්කු බෝම්බ ප්‍රහාර වලින් පසුව) 300 කට අධික මුස්ලිම්වරුන් සංඛ්‍යාවක් අත්අඩංගුවට ගෙන ඇත.[111] එල්ටීටීඊ සාමාජිකයන් බවට සැක කෙරෙන පුද්ගලයන් වසර 10 සිට 20 දක්වා කාලයන් තුළ කිසිදු චෝදනා කිරීමකින් තොරව හෝ අධිකරණයට ඉදිරිපත් කිරීමකින් තොරව රඳවා තබාගෙන ඇත. විවිධ ස්ථාන වල මුස්ලිම්-විරෝධී ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් සිංහලයන්ව ඇප මත මුදා හැරීමට ඉඩ සලසන ආඥාපනත් භාවිතා කරමින් චෝදනා එල්ල කර ඇති අතර, සුළුජාතීන්ට එරෙහිව විනිසුරුවරයෙකු විසින් ඇප ලබාදීම වළක්වන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත භාවිතා කිරීම උපදේශාත්මක වේ.[112]

සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICCPR) යනු සුළුතර ප්‍රජාවන් ඉලක්ක කර ගැනීම සඳහා භාවිතා කර ඇති තවත් නීතියකි. විශේෂයෙන්ම වෛරී කථනය සම්බන්ධයෙන් ක්‍රියා කරන මෙම නීතිය, දේශපාලනමය වශයෙන් රජයට විරුද්ධ වූ අයට එරෙහිව දණ්ඩනීය ලෙස භාවිතා කර ඇත. මෙහිදී අසමානුපාතිකව ඉලක්ක කිරීමට නැඹුරු වන්නේ ජනවාර්ගික සහ ආගමික සුළුතරයන් ය. මෙය පවා සිදුවන්නේ බහුතර ප්‍රජාව තුළ සිටින අයගේ ඉතාමත් නීච වෛරී ප්‍රකාශ රජය විසින් නොසලකා හරින අතර ය.[113]

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ඉවත් කරන ලෙස ජාත්‍යන්තර ප්‍රජාව සාධාරණව රජයෙන් ඉල්ලා ඇත. කෙසේවෙතත්, රජය වැඩි කැමැත්තක් දක්වන්නේ, යළි යළිත් වාරණයට ලක්ව තිබියදීත්, එහි යම් අනුවාදයක් ලිඛිතව ඉතිරි කර ගැනීමට ය. අර්ථවත් ජනවාර්ගික සංහිඳියාවක් සහ වගවීමක් නොමැතිකම සමඟ ඒකාබද්ධව, දෙමළ ජනතාව සහ ජාත්‍යන්තර ප්‍රජාවේ බොහෝදෙනෙක්, රටේ ආරක්ෂක හමුදා විසින් සිදු කරන ලදැයි කියන යුද අපරාධ විමර්ශනය කිරීම සඳහා ජාත්‍යන්තර විනිසුරුවරුන්ගෙන් සමන්විත මඬුල්ලක් ඉල්ලා සිටින්නේ මේ හේතුවෙනි. මෙම දිගුකාලීන ඉල්ලීම පමණක්ම ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියෙහි ස්වාධීනත්වය කෙරෙහි විශ්වාසයක් නොමැති කම ඉස්මතු කරයි. පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාර වලින් පසුව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත භාවිතා කරමින් මුස්ලිම්වරුන් ද ගොදුරු බවට පත්වූ අතර, බෝම්බකරුවන් සමඟ සමහරවිට අහිංසක ලෙස සම්බන්ධ වී සිටි මුස්ලිම් කාන්තාවෝ ද මෙයට ඇතුළත් වෙති.[114]

# V වන කොටස.
# අන්තර්කණ්ඩායම් සබඳතා සහ අයිතිවීම

# 16. අන්තර්කණ්ඩායම් ප්‍රචණ්ඩත්වය
## සමස්ත ලකුණු: 5

ආගම | **සමස්ත ලකුණු: 5**
ජනවාර්ගිකත්වය | **සමස්ත ලකුණු: 5**

මුස්ලිම්වරුන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය දේපල ඉලක්ක කිරීමට සැලසුම් කර ඇති බව පෙනේ. මන්දයත්, සෑම අවස්ථාවකදීම ඝාතනය කර ඇත්තේ මුස්ලිම්වරුන් කිහිප දෙනෙක් වන නමුත්, නිවාස, ව්‍යාපාරික ස්ථාන, මුස්ලිම් පල්ලි සහ වාහන වලට විශාල හානියක් සිදුකර ඇත.

නිදහසින් පසු ශ්‍රී ලංකාවේ පළමු වසර අට සාපේක්ෂ වශයෙන් සන්සුන් විය. මින් පසු, 1956 දෙමළ-විරෝධී කෝලාහල වලින් ආරම්භ වී, දිවයින කෝලාහල වල සිට සංහාර සහ කැරලි දක්වා වරින් වර ප්‍රචණ්ඩත්වය අත් විඳ ඇත. අවසානයේ සඳහන් කළ කැරලි ප්‍රධාන වශයෙන් සිංහලයන් පදනම් වූ ඒවා වූ අතර, 1971, සහ 1988 සහ 1990 අතර ජනතා විමුක්ති පෙරමුණ රජය පෙරළා බලය අල්ලා ගැනීමට උත්සාහ දැරූ විට සිදුවිය. ඇස්තමේන්තු වෙනස් වුවද, ඝාතනය වූ සංඛ්‍යාව දහස් ගණනින් විය. ඉතිරි ප්‍රචණ්ඩත්වය ප්‍රධාන වශයෙන් සිංහල සහ දෙමළ ජනතාව අතර අන්තර්-ජනවාර්ගික වූ අතර, දශක තුනකට ආසන්න සිවිල් යුද්ධයකින් (1983-2009) අවසානයකට එළඹිණි. මුස්ලිම්වරුන්ට එරෙහි කෝලාහල සහ කිතුනුවන්ට එරෙහිව විටින් විට පැවති තර්ජනාත්මක හැසිරීම් ඇතුළත් කළ විට, ශ්‍රී ලංකාවේ සෑම ප්‍රජාවකටම පසුගිය වසර 60 තුළ යම් ආකාරයක ප්‍රචණ්ඩ තර්ජන සහ සිද්ධීන්ට මුහුණදීමට සිදුව ඇත.

ප්‍රථම දෙමළ-විරෝධී කෝලාහල ඇති වූයේ 1956 දී සිංහල භාෂාව එකම රාජ්‍ය භාෂාව කිරීමට රජය ගත් උත්සාහයට දෙමළ ජනයා සාමකාමීව විරුද්ධ වීම හේතුවෙනි. මෙයින් පසුව, 1958 දී දෙපිරිස අතර භාෂා සම්බන්ධ කෝලාහල වැඩියෙන් ඇති විය. 1977 දී එක්සත් ජාතික පක්ෂය බලයට පත්වීමෙන් පසු දෙමළ-විරෝධී ප්‍රචණ්ඩත්වය යළිත් ඇවිලුණේ, උතුරු පළාතේ දෙමළ තරුණයන් වෙන්වී යාමේ අපේක්ෂාවෙන් විවිධ කණ්ඩායම් වලට ඒකරාශී වීම හේතුවෙන් අර්ධ වශයෙන් එයට ප්‍රතිචාරයක් ලෙස ය.[115] 1983 දී සිදුවූ දෙමළ- විරෝධී ප්‍රචණ්ඩත්වය, දෙමළ ජනතාවගේ ව්‍යාපාරික ස්ථාන සහ නිවාස ඉලක්ක කරගත් කලහකරුවන් පොලීසිය සහ හමුදාව විසින් දිරිමත් කිරීම මෙන්ම දින ගණනාවක් තිස්සේ ප්‍රචණ්ඩත්වය නැවැත්වීමට රජය කිසිවක් නොකිරීමත් සමඟ, සත්‍ය වශයෙන්ම සංහාරයක් විය. එය දහස් ගණනක් දෙමළ ජනයා දිවයිනෙන් පලා යාමටත්, තවත් අය විවිධ කැරලිකාර කණ්ඩායම් වලට එකතු වී වෙනම රාජ්‍යයක් සඳහා සටන් කිරීමටත් හේතු විය. ශ්‍රී ලංකාව, සියලු ප්‍රජාවන් බලපෑමට ලක් කළ 1983 ප්‍රචණ්ඩත්වයෙහි ප්‍රතිවිපාක සමඟින් දිගින් දිගටම ජීවත් වෙයි.

මෙයට දිවයින පුරා සිටින, විශේෂයෙන් උතුරු නැගෙනහිර මුස්ලිම් ප්‍රජාව ද ඇතුළත් වේ. එල්ටීටීඊය 1990 දී උතුරු පළාතෙන් සියලුම මුස්ලිම් ජනතාව පිටමං කළේ, බොහෝ දෙනා එක් රැයකින් සරණාගතයින් බවට පත් කරමිනි. වෙනම රාජ්‍යයක් බිහිකිරීමේ එල්ටීටීඊ ප්‍රයත්නයට මුස්ලිම් ජනතාව විරුද්ධ වූ බැවින් මෙම කණ්ඩායම නැගෙනහිර පළාතේ මුස්ලිම්වරුන්ට ද පහර දුන්හ.[116]

2009 වසරේ යුද්ධය අවසන් වූ තැන් පටන්, බෞද්ධ ජාතිකවාදී කණ්ඩායම් මුස්ලිම්වරුන් ඉලක්ක කරමින් 2014 දී දර්ගා නගරයේ කෝලාහල සිදු ක, 2018 සහ 2019 දී අමතර මුස්ලිම්-විරෝධී ප්‍රචණ්ඩත්වයන් සිදු විය. මුස්ලිම්වරුන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය දේපල ඉලක්ක කිරීමට සැලසුම් කර ඇති බව පෙනේ. මන්දයත්, සෑම අවස්ථාවකදීම ඝාතනය කර ඇත්තේ මුස්ලිම්වරුන් කිහිප දෙනෙක් වන නමුත්, නිවාස, ව්‍යාපාරික ස්ථාන, මුස්ලිම් පල්ලි සහ වාහන වලට විශාල හානියක් සිදුකර ඇත. එවැනි ප්‍රචණ්ඩත්වය වෙනුවෙන් අත්අඩංගුවට ගෙන ඇත්තේ ස්වල්ප දෙනෙකු වන අතර, ඉස්ලාම් භීතිකාව ප්‍රවර්ධනය කර කෝලාහල සාධාරණීකරණය කළ කිසිදු බෞද්ධ භික්ෂුවකට අන්තර්කණ්ඩායම් ප්‍රචණ්ඩත්වය උසිගැන්වීම වෙනුවෙන් චෝදනා එල්ල වී නොමැත.

2019 පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාර හෝටල් ද ඉලක්ක කර ගත් නමුත්, මියගිය වැඩිදෙනා ප්‍රහාර වලට ලක්වූ දේවස්ථාන තුළේ සිටි අය වූහ. ගෝඨාභය රාජපක්ෂගේ ජනාධිපති අපේක්ෂකත්වය ප්‍රවර්ධනය කිරීමට මෙම මිනිස් සංහාරය භාවිතා කිරීමට හැකිවීම පිණිස රාජපක්ෂ පවුලට සම්බන්ධ ඇතැම් බුද්ධි අංශ සේවක පිරිස් බෝම්බ ප්‍රහාර එල්ල කිරීමේ දී යම් කාර්යභාරයක් ඉටු කර ඇති බවට අනුමාන කිරීමට බෝම්බ ප්‍රහාර වලට සම්බන්ධ විමර්ශන දායක වී ඇත.[117]

ශ්‍රී ලංකාවේ අන්තර්කණ්ඩායම් ප්‍රචණ්ඩත්වය ප්‍රධාන වශයෙන් ජනවාර්ගික-ආගමික ජාතිකවාදය සහ සිය වෘත්තීන් ඉදිරියට ගෙන යාම සඳහා ජනවාර්ගික-ආගමික බෙදීම් අවස්ථාවාදී ලෙස

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳව මෑතකදී සිදු කළ ජාතික සමීක්ෂණයකින් හෙළි වූයේ කාන්තාවන් පස්දෙනෙකු ගෙන් එක් අයෙකු තම ජීවිත කාලය තුළ සමීප සහකරුවෙකු වෙතින් ශාරීරික සහ/හෝ ලිංගික ප්‍රචණ්ඩත්වය අත්විඳ ඇති බවයි.

භාවිතා කිරීමට උත්සාහ දරන දේශපාලනික ව්‍යවසායකයින් විසින් උසිගන්වා ඇති අතර, කිසිදු ප්‍රතිපත්තියක් නොමැති ව්‍යාපාරික අභිලාෂයන් එවැනි ප්‍රචණ්ඩත්වය තුළ යම් කාර්යභාරයක් ඉටු කර ඇත. 1983 දෙමළ-විරෝධී සංහාරයේදී නිසැකවම සිදුවූයේ මෙයයි. එමෙන්ම, 2012 වසරේ පටන් ඇති වූ බොහෝ මුස්ලිම්-විරෝධී ප්‍රචණ්ඩත්වයන් සම්බන්ධයෙන් ද එය සත්‍ය වන බව පෙනේ. එවැනි අවස්ථාවන්හිදී, දේශපාලනඥයින් ප්‍රචණ්ඩත්වයෙන් ලාභ ලබන අතර, ජාතිය ආරක්ෂා කිරීම සඳහා යැයි පවසන න්‍යාය පත්‍රයක කොටසක් ලෙස වෛරී කථනය උසිගන්වන ජාතිකවාදී කණ්ඩායමකට ව්‍යාපාරික කණ්ඩායම් විසින් අරමුදල් ලබාදීම සිදු කළ හැකිය. බොදු බල සේනා යනු ව්‍යාපාරික අවශ්‍යතා මඟින් අරමුදල් සපයා, දේශපාලනඥයින්ගේ අනුදැනුම ඇතිව ක්‍රියාත්මක වූ බව පෙනෙන බෞද්ධ භික්ෂූන් විසින් නායකත්වය ලබාදුන් ජාතිකවාදී කණ්ඩායමක උදාහරණයකි. අන්තර්-ජනවාර්ගික ප්‍රචණ්ඩත්වය උසිගැන්වීම සම්බන්ධයෙන් එහි කිසිදු නායකයෙකුට එරෙහිව නඩු පවරා නැත.

ප්‍රචණ්ඩත්වය ක්‍රියාවට නංවන සෑම අවස්ථාවකම, සහ විශේෂයෙන් එය දඬුවම් විරහිතව සිදු කරන විට, වැඩිපුර පාඩු විඳීමට නැඹුරුවන්නේ වැඩියෙන්ම කොන්කිරීමට ලක්වූවන් ය. ශ්‍රී ලංකාව තුළ ද එය එසේම වේ. දුගී සුළුතර ජනයාට තමන් වෙනුවෙන් යම් ආරක්ෂාවක් ලබාගැනීම සඳහා සම්බන්ධකම් මත යැපීමට හෝ ප්‍රචණ්ඩත්වය අවසන් කිරීමට කෝලාහල කරුවන්ට අල්ලස් දීමට ඇති හැකියාව අඩු බැවින්, ප්‍රචණ්ඩත්වයට සමාජ-ආර්ථික මානයක් ද ඇත. බොහෝ දෙමළ-විරෝධී කෝලාහල වලදී කොළඹ නගරයේ කිසිදු දෙමළ ස්වර්ණාභරණ සාප්පුවක් ඉලක්ක කර නොතිබීම උපදේශාත්මක වන අතර, සාමාන්‍ය අවබෝධය වන්නේ බලගතු දේශපාලනඥයින්ට සහ පොලිස් නිලධාරීන්ට අල්ලස් ලබා දී කැරලිකරුවන්ට එරෙහිව මෙම ආයතන වලට අවශ්‍ය ආරක්ෂාව ලබා දුන් බවයි.

තවද, ප්‍රචණ්ඩත්වය විවිධාකාර වලින් කාන්තාවන්ට බලපෑම් කිරීමට නැඹුරු වන අතර, ලිංගික අපයෝජනය සම්බන්ධයෙන් මෙය විශේෂයෙන් සත්‍ය වේ. 1983 දෙමළ-විරෝධී කෝලාහල වලදී ඇතැම් ස්ත්‍රී දූෂණ වලට සාක්ෂි පැවති නමුත් කිසිම වින්දිතයෙක් තම අත්දැකීම් සාකච්ඡා නොකළේය. සිවිල් යුද්ධය අතරතුර දෙමළ කාන්තාවන් බොහෝ දෙනෙකුට අතවර කිරීම් සිදුවූ බව පවසනු ලබන නමුත්, චෝදනා එල්ල කිරීමට උත්සාහ දැරුවේ ටික දෙනෙකි. කෙසේවෙතත්, ශ්‍රී ලංකාව තුළ සහ විශේෂයෙන් විදේශයන්හි මනෝ-සමාජීය උපදේශනයෙහි නිරතව සිටින අය පුළුල් ලිංගික ප්‍රචණ්ඩත්වය (බොහෝ විට පිරිමින්ට එරෙහිව ද) පැවති බව සටහන් කර ඇත.[118] පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාර වලින් පසු අත්අඩංගුවට ගත් මුස්ලිම් කාන්තාවන් ලිංගික අපයෝජනයට ලක්වූ බවට වාර්තා ඇතත්, යළිත් වරක්, කෙලෙසීමට ලක්වීම හා සම්බන්ධ නින්දා සහගත හැඟීම මඟින් පුද්ගලයන් ඉදිරියට පැමිණීම වළක්වා ඇත.[119]

සහජීවනය ප්‍රවර්ධනය කරන අන්තර්-ආගමික කණ්ඩායම් රාශියකින් ශ්‍රී ලංකාව සමන්විත වේ. අන්තර්කණ්ඩායම් ආතතීන් ප්‍රචණ්ඩත්වය දක්වා වර්ධනය වීම වැළැක්වීම සඳහා ඔවුහු ඉමහත් සේවයක් ඉටු කරති. කෙසේවෙතත්, ඔවුන්ගේ සාර්ථකත්වය රඳා පවතින්නේ රාජ්‍ය බලධාරීන් නීතියේ ආධිපත්‍යයට ගරු කිරීම මත ය. බොහෝවිට, බෞද්ධ පූජ්‍ය පක්ෂයට හෝ ප්‍රමුඛ දේශපාලනඥයින්ට අදාළව මෙය සත්‍ය නොවේ. මෙම තත්ත්වය නිවැරදි කෙරෙන තුරු රට වරින් වර අන්තර්කණ්ඩායම් ප්‍රචණ්ඩත්වය අත් විඳිනු ඇත.

පොදුවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ප්‍රචණ්ඩත්වය ආමන්ත්‍රණය කිරීමේ දී සහ කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට අභිමානයෙන් යුතු සහ ගෞරවනීය ජීවිතයක් ගත කළ හැකි බව සනාථ කිරීමේ දී බොහෝ අභියෝග පවතී. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳව මෑතකදී සිදු කළ ජාතික සමීක්ෂණයකින් හෙළි වූයේ කාන්තාවන් පස්දෙනෙකු ගෙන් එක් අයෙකු තම ජීවිත කාලය තුළ සමීප සහකරුවෙකු වෙතින් ශාරීරික සහ/හෝ ලිංගික ප්‍රචණ්ඩත්වය අත්විඳ ඇති බවයි.

එවැනි සහකරුවන් සමඟ ජීවත් වන විට කාන්තාවන් විසින් ඒවා සාර්ථකව හසුරුවා ගැනීමේ ක්‍රමෝපායයන් විශ්ලේෂණය කිරීමේ දී අධ්‍යයනයෙන් හෙළි වූයේ, ලිංගික ප්‍රචණ්ඩත්වය අත්විඳින ලද කාන්තාවන්ගෙන් අඩකට ආසන්න (සියයට 49. 3) සංඛ්‍යාවක් නින්දාව, අපහසුතාවට පත්වීම, දෝෂාරෝපණයට ලක්වීමේ හෝ විශ්වාස නොකරනු ඇතැයි යන බිය, සහ/හෝ ප්‍රචණ්ඩත්වය සාමාන්‍ය දෙයක් හෝ උපකාර පැතීමට තරම් බරපතළ නොවේ යැයි සිතීම, වැනි හේතු නිසා විධිමත් උපකාරයක් ලබාගැනීමට උත්සාහ නොදැරූ බවයි. සමීක්ෂණය සඳහා සම්මුඛ සාකච්ඡාවට ලක් කළ සියලුම කාන්තාවන්ගෙන් අඩකට ආසන්නව (සියයට 47.5) "පිරිමියෙකු තමා ප්‍රධානියා බව පෙන්විය

යුතුයි” යන්නට එකඟ වූ බවත්, අඩකට ආසන්නව “හොඳ බිරිඳක් එකඟ නොවූවත්, තම සැමියාට කීකරු වන්නීය” යන්නට එකඟ වූ බවත්, සමීක්ෂණයෙන් හෙළි විය. කාන්තාවන් පස්දෙනෙකුගෙන් දෙදෙනෙක් “කාන්තාවක් හට වුවමනාවක් ඇතැයි හැඟෙන්නේ නැති විට පවා සිය සැමියා සමඟ ලිංගිකව හැසිරීමට ඔවුහු බැඳී සිටිති” යන ප්‍රකාශය සමඟ එකඟ වූහ. පසුගිය ශ්‍රී ලංකා සංගණනයට අනුව, රටේ දීර්ඝකාලීන සබඳතාවල සිටින සහ/හෝ විවාහ වී සිටින කාන්තාවන්ගෙන් සියයට 40 ක් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය අත්විඳ ඇත.[120] විවිධ ජනවාර්ගික-ආගමික ප්‍රජාවන් අතර කාන්තාවන්ට එරෙහි ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය දැඩි ලෙස වෙනස් වන බව උපකල්පනය කිරීමට හේතු නොමැත.

## 17. අන්තර්කණ්ඩායම් විශ්වාසය

## සමස්ත ලකුණු: 5

ආගම | **සමස්ත ලකුණු: 5**

ජනවාර්ගිකත්වය | **සමස්ත ලකුණු: 5**

නිදසුනක් වශයෙන් විශේෂයෙන් ඉහළ ආදායම් ලබන සහ වඩා උගත් පන්ති අතර, තවමත් අන්තර්කණ්ඩායම් විවාහ සිදුවන අතර, එය පෙරට වඩා අඩු ය.

රාජ්‍ය බලධාරීන් දණ්ඩ මුක්තියෙන් ක්‍රියා කිරීම (සහ ක්‍රියාකිරීමට හැකිවීම) සමඟ ඒකාබද්ධව, නොයෙකුත් ජනවාර්ගික-ආගමික කෝලාහල සහ කැරලි අත්විඳ ඇති රටක, අන්තර්කණ්ඩායම් විශ්වාසය ඉහළ මට්ටමක භුක්ති විඳීමට අපේක්ෂා කළ නොහැක. ශ්‍රී ලංකාව ආරම්භ කළ ජනවාර්ගික තන්ත්‍රය ශ්‍රී ලාංකීය පුරවැසිභාවයට වඩා සිංහල බෞද්ධ ජනවාර්ගික තත්ත්වය වරප්‍රසාද සහිත වීමට හේතු වූ අතර, බහුතරවාදය සමාජ-දේශපාලන ක්ෂේත්‍රයේ ආධිපත්‍යය දැරීමට පැමිණි ආකාරය මඟින් මෙය පැහැදිලි විය. මෙම බහුතරවාදය සාධාරණීකරණය කරන ලද්දේ බොහෝ සිංහල බෞද්ධයන් විසින් අති පූජනීය ලෙස පිළිගනු ලබන (ශ්‍රී ලංකාව බුදුන්ගේ ඉගැන්වීම් සඳහා නම් කරන ලද ශුද්ධ භූමිය බවටත්, සිංහල ජනතාව බුදුන්ගේ උරුමය ආරක්ෂා කිරීමට තෝරා ගත් ජනතාව බවටත්) මිථ්‍යා ඉතිහාසයක් භාවිතා කරමිනි.[121] ජනවාර්ගික-ජාතික වාදය අනන්‍යතා දැඩි කරන අතර, එය අනෙක් අතට, කණ්ඩායම් තුළ (අන්තඃ-කණ්ඩායම්) අන්තර්ක්‍රියා කිරීම සහ විශ්වාසය දිරිමත් කරන අතරම, අන්තර්-කණ්ඩායම් (කණ්ඩායම් අතර) අන්තර්ක්‍රියා හා විශ්වාසය අවම කරයි. මෙයින් දෙවැන්න තවමත් සිදුවන අතර, ප්‍රධාන වශයෙන් සිංහල බෞද්ධ රාජ්‍යය සහ දෙමළ කැරලිකරුවන් අතර පැවති සිවිල් යුද්ධය සහ ඉස්ලාම් භීතිකාව දිවයිනේ විවිධ කණ්ඩායම් අතර විශ්වාසය කෙලෙසා ඇත.

නිදසුනක් වශයෙන් විශේෂයෙන් ඉහළ ආදායම් ලබන සහ වඩා උගත් පන්ති අතර, තවමත් අන්තර්කණ්ඩායම් විවාහ සිදුවන අතර, එය පෙරට වඩා අඩු ය. මුස්ලිම්වරයෙකු සමඟ විවාහ වීමේදී ඉස්ලාම් ආගමට හැරිය යුතු බවට අවධාරණය කිරීම නිසා විශේෂයෙන් මුස්ලිම්වරු අපකීර්තියට පත් වෙති - මෙම ඉල්ලීම අනෙකුත් ප්‍රජාවන් අතර එතරම් දැඩි ඉල්ලීමක් නොවේ. මෙම මුස්ලිම් මනාපය ආගමික සම්බාධක මත පදනම් විය හැකි නමුත්, වඩාත් දැඩි සහ සම්මුති විරහිත වහාබි ඉස්ලාමයේ ව්‍යාප්තිය මධ්‍යයේ ඉහළ මුස්ලිම් සශ්‍රීකත්ව අනුපාත තිබිය හැකි යැයි සැලකිලිමත් වන සිංහල ජාතික බෞද්ධවාදීන්ට මෙම ප්‍රජාව කිසිසේත් ප්‍රිය නොවේ. මෙම කේන්ද්‍රය විසින් සිදුකළ බහුත්වවාදයෙහි අවබෝධය පිළිබඳ සමීක්ෂණය පෙන්වා දෙන්නේ දිවයිනේ අනෙකුත් කණ්ඩායම් හා සසඳන විට, අන්තර්කණ්ඩායම් විවාහ සම්බන්ධයෙන් මුස්ලිම් ප්‍රජාවට ඇත්තේ අඩු විශ්වාසයක් සහ එතරම් විවෘත නොවන ආකල්පයක් වන බවයි.[122]

අනෙකුත් දකුණු ආසියාතික රටවලට වඩා බොහෝ අඩුවෙන් වුවද, ශ්‍රී ලංකාව පීතෘමූලික සමාජයක් ලෙස පවතී. මෙයින් අදහස් කෙරෙන්නේ යමෙකු තමාගේ ප්‍රජාවෙන් පිටත විවාහවීම හා සම්බන්ධ චෝදනාත්මක විවේචනයන් අනිවාර්යයෙන් වැඩියෙන් බලපාන්නේ කාන්තාවන්ට බවයි.

ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශය සියලුම ජනවාර්ගික කණ්ඩායම් වලට අයත් සේවකයින් පාලනය කරන සියලුම ජනවාර්ගිකත්වයන්ට අයත් විධායක නිලධාරින්ගෙන් සමන්විත වේ. කුඩා ව්‍යාපාර සම්බන්ධයෙන් මෙය අවශ්‍ය වශයෙන්ම සිදු නොවේ. කුඩා ව්‍යාපාර නැඹුරුවන්නේ තම ඥාතීන් සහ අයිතිකරුවන් හඳුනන අය බඳවා ගැනීමට යි. රාජ්‍ය අංශයෙහි තත්ත්වය අර්ධ වශයෙන් වෙනස් වන්නේ, රජයේ සේවකයින්ගෙන් සියයට 94 කට ආසන්න ප්‍රමාණයක් (මෙය ඇස්තමේන්තුවකි)

කෙටියෙන් කිවහොත්, සිංහල බෞද්ධ ජාතිකවාදයට ස්ථාවර පදනමක් සකසන මූලික ඇදහිල්ල පෙරට වඩා සුවිශේෂී හිමිකම් සහිත විය යුතු අතර, එසේ වනුයේ බහුත්වවාදයට අවාසි වන පරිදි ය.

බහුතර ප්‍රජාවට අයත් වන බැවිනි.[123] රාජ්‍ය අංශයේ සිංහලයින් සුළු ජාතික ප්‍රධානීන් යටතේ සේවය කිරීමට සිදුවීම ගැන කිපෙන අවස්ථා තිබී ඇත. දෙමළ සහ මුස්ලිම් ජනතාව බොහෝවිට, භාෂාව සම්පූර්ණයෙන් ඔවුන්ට නොතේරෙන විට පවා, සිංහල භාෂාවෙන් ආකෘති පිරවීමට හෝ රජයේ නිලධාරීන් සමඟ කටයුතු කිරීමේ දී සිංහලෙන් කතා කිරීමට සිදුවීම ගැන මැසිවිලි නඟති. මෙය විශේෂයෙන් බලපාන්නේ සමාජ-ආර්ථික හිණිපෙත්තෙහි වඩා පහළ මට්ටම් වල සිටිය අයට ය. මන්දයත්, වඩා උගත් දෙමළ භාෂාව කතා කරන අයට ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කිරීමට හැකියාව තිබිය හැකි බැවිනි. සිංහල රජයේ නිලධාරීන් අතින් තමන්ව හෑල්ලුවට ලක් කරමින් සැලකීම ගැන ද සුළු ජාතීහු බොහෝ විට මැසිවිලි නඟති.[124] මේ සියල්ලටම හේතු වී ඇත්තේ බහුත්වවාදය සඳහා අවශ්‍ය වන අන්තර්-ජනවාර්ගික ගරුත්වය සහ විශ්වාසය අඩපණ කරන දශක ගණනාවක් පුරා ගැබ් වී ඇති බහුතරවාදී ජනවාර්ගිකත්වය කේන්ද්‍රකොට ගත් සංස්කෘතිය යි.[125]

පශ්චාත්-යුද සමය තුළ, අවස්ථාවාදී පිරිස්, දුර්ලභ සම්පත් භාවිතා කර උතුරු නැගෙනහිර දෙමළ සහ මුස්ලිම් ජනතාව අතර අසමගිය වැපිරීමට උත්සාහ දරා ඇත. සමහර හමුදා පුද්ගලයන් එවැනි අසමගිය අවුළුවාලන ආකාරය සැලකිල්ලට ගන්නා විට, දිවයිනෙහි විශාලම සුළු ජාතීන් දෙක අතර අවිශ්වාසය සහ ගැටුම් අවුළුවා ලීමට දරන උත්සාහය පෙනෙනවාට වඩා ක්‍රමානුකූලව සිදුකරන්නක් විය හැකිය.[126] මේ අන්දමින් හැසිරවීමට ලක්වන අය බොහෝවිට සමාජ-ආර්ථික බෙදීම් වල වඩා පහළ කෙළවර සිටින්නන් බැවින්, මෙසේ කෘතිම වශයෙන් ඇති කරන අසමගියට සමාජයේ පන්ති හා සම්බන්ධ ලක්ෂණයක් ඇත.

සිංහල බෞද්ධ ලෝකදෘෂ්ටිය මුල්බැස ඇත්තේ, ලෝකයේ සිංහල භාෂාව කතා කරන එකම ස්ථානය ශ්‍රී ලංකාවය යන මතය තුළ සහ සිංහල භාෂාව සිංහද්වීප සහ ධම්මදීප යන පාලි (බෞද්ධ ධර්ම ග්‍රන්ථ වල භාෂාව) සංකල්ප වලින් ව්‍යුත්පන්න වී ඇති ආකාරය මත ය යන්න, බලගතු මතවාදයකට දායක කරයි. මෙය සියලුම ආගමික සුළුතරයන් ඔවුන්ගේ ආගමික පෙළපත් ශ්‍රී ලංකාවෙන් පිටත ස්ථානගත කිරීම හා සම්බන්ධ වේ - හින්දු භක්තිකයන් සඳහා ඉන්දියාව, කතෝලිකයින් සඳහා රෝමය (විශේෂයෙන්), අනෙකුත් නිකායන්හි ක්‍රිස්තියානීන් සඳහා මැද පෙරදිග සහ බටහිර, සහ මුස්ලිම්වරුන් සඳහා මක්කම, මෙඩිනා සහ ජෙරුසලම යනුවෙනි. කෙටියෙන් කිවහොත්, සිංහල බෞද්ධ ජාතිකවාදයට ස්ථාවර පදනමක් සකසන මූලික ඇදහිල්ල පෙරට වඩා සුවිශේෂී හිමිකම් සහිත විය යුතු අතර, එසේ වනුයේ බහුත්වවාදයට අවාසි වන පරිදි ය. සිංහලයන්, ජාතිය තුළ බහුතරයක් වුවද, කලාපය තුළ ඔවුන් වටා සිටින විශාල දෙමළ ජනගහනයෙන් තර්ජනයට ලක්ව සිටින බව හැඟේ. සිංහලයන්ගේ මෙම “සුළුතර මනෝග්‍රස්තිය” (minority complex) න්‍යායගත කර ඇත්තේ ඔවුන්ගේ දේශපාලන බලය සඳහා වන අවශ්‍යතාවයට දායක වීමට ය.[127]

කෙසේවෙතත්, ශ්‍රී ලංකාව එහි පොහොසත් සංස්කෘතික විවිධත්වය මත ගොඩනැඟීමෙන් පමණක්, රටට එහි විභවය ළඟා කරගත හැකි බව විශ්වාස කරන කණ්ඩායම් ශ්‍රී ලංකාව තුළ නොමැති බව මෙයින් පවසන්නේ නැත. මේ අනුව, සියලුම ප්‍රජාවන්හි සාමාජිකයෝ එසේ එකට වැඩ කිරීම සඳහා සංසද සපයා දෙන විට එසේ කිරීමට කැමැත්තක් ප්‍රකාශ කරති.[128] සිවිල් සමාජ සංවිධාන ද දිස්ත්‍රික් සහ උප දිස්ත්‍රික් මට්ටම් වල අන්තර්-ප්‍රජා කණ්ඩායම් පිහිටුවීම මඟින් අන්තර්-ප්‍රජා සබඳතා පෝෂ්‍ය කිරීමට උත්සාහ දරති. සියලුම ප්‍රජාවන්හි සාමාජිකයින් විශේෂයෙන් COVID වසංගතය අතරතුර දී මෙම ප්‍රයත්නයන්හි දී සහභාගි වී ඇත. COVID-19 මඟින් වැඩියෙන්ම බලපෑමට ලක්වූවන්ට මානුෂීය සැපයුම් ලබාදීම සඳහා අන්තර්-ප්‍රජා කණ්ඩායම් ඒකරාශී වූ ආකාරය, බෙදුණු අතීතයක් ජයගෙන හවුල් අනාගතයක් කරා ගමන් කිරීමට ඇති සාක්ෂාත් කර නොගත් විභවය පෙන්නුම් කරයි.

# 18. රාජ්‍ය ආයතන කෙරෙහි විශ්වාසය
## සමස්ත ලකුණු: 5

ආගම | **සමස්ත ලකුණු: 5**
ජනවාර්ගිකත්වය | **සමස්ත ලකුණු: 5**

> කෙසේවෙතත්, දූෂණය, අදක්ෂකම, සහ ජනවාර්ගික තන්ත්‍රය ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතන වල වෘත්තීය සහ කාර්යක්ෂම ස්වභාවය හීන කර ඇත.

දිවයිනේ පූර්ව-යටත්විජිත ඉතිහාසය අර්ධ වශයෙන් මුල්බැස තිබුණේ යහපත් රජෙකු යනු ජනතාව සඳහා අවශ්‍ය දේ හොඳින් සැපයෙන බව සහතික කරන කෙනෙකු වේ යන මතය තුළ ය. නිදහසින් පසු යුගයේ දී ආරම්භ කරන ලද සමාජ සුබසාධන වැඩසටහන් මඟින් රජු වෙනුවට රාජ්‍යය පත්වීමත් සමඟ මෙම මතය ව්‍යාප්ත කෙරුණි. මෙම වැඩසටහන් වලට නිදහස් සෞඛ්‍යය, අධ්‍යාපනය, වියළි සලාක (1970 ගණන් වල අග භාගය දක්වා) සහ පෙට්‍රල්, ආහාර පිසීමට ගෑස් සහ පොහොර යන මේවායේ සිට විවිධ සහනාධාර භාණ්ඩ ඇතුළත් විය. අත්‍යවශ්‍ය භාණ්ඩ තිබීම සහතික කිරීමට රජයේ නොහැකියාව සම්බන්ධයෙන් පවතින විරෝධතා සහ විරුද්ධ පක්ෂ විසින් බලයට පත්වුවහොත් ඔවුන් කරන්නේ මෙයම බවට දෙන ලද පොරොන්දු, මහජන යහපැවැත්ම රාජ්‍ය කාර්යසාධනය සමඟ කෙතරම් දුරට සම්බන්ධ වී ඇත්ද යන්න ඉස්මතු කරයි.

කෙසේවෙතත්, දූෂණය, අදක්ෂකම, සහ ජනවාර්ගික තන්ත්‍රය ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතන වල වෘත්තීය සහ කාර්යක්ෂම ස්වභාවය හීන කර ඇත. බහුතරවාදී මතය සොයා යාම හේතුවෙන් රාජ්‍ය සේවය දුර්වල කිරීමටත්, ඒ වෙනුවට රජයේ ඇමතිවරුන් සවිබල ගැන්වීමටත් ඇතැම් රජයන් තල්ලු විය.[129] ඉන් අනතුරුව ඇතිවූ රටේ දේශපාලනඥයන්ගේ ගුණාත්මකභාවය සහ හැකියාවන් පහත වැටීමෙන් රාජ්‍ය ආයතන දේශපාලනීකරණය වීම සහ අමාරුවට පත්කිරීම සහතික විය. අමාත්‍යංශ අධීක්ෂණය කළ දේශපාලනඥයින් තම ඡන්දදායකයන්ට සහ පාක්ෂිකයන්ට අනුග්‍රහය දැක්වූවා පමණක් නොව, ඔවුහු දිනෙන් දින පැතිරී ගිය දඬුවම් නොලබා යන සංස්කෘතියක් තුළ ක්‍රියාත්මක වීමට ද පටන් ගත්හ. ජලය, විදුලිය සහ ඉඩම් ලියාපදිංචි කිරීම වැනි මහා පරිමාණ මහජන සේවාවන් සපයන රජයේ දෙපාර්තමේන්තු ද මන්දගාමී හා අකාර්යක්ෂම වන බවට ප්‍රත්‍යක්ෂ වී ඇති අතර, දූෂණය හේතුවෙන් පොලීසිය සහ ගම් මට්ටමේ නිලධාරීහු අඩුවෙන්ම විශ්වාස කරන අය වෙති. යුක්තිය පසිඳලීමේ දී අධිකරණය සැලකිය යුතු ලෙස මන්දගාමී වන අතර, නීතිය බලාත්මක කිරීම සහ යුක්තිය කෙරෙහි ඇති විශ්වාසය විශේෂයෙන් දුර්වල බව මෙම කේන්ද්‍රය විසින් සිදුකළ බහුත්වවාදයෙහි අවබෝධයන් පිළිබඳ සමීක්ෂණය මඟින් පෙන්වා දෙන්නේ මේ හෙයිනි.[130]

කෙසේවෙතත්, ජනතාව රාජ්‍ය ආයතන වල රැකියා ඉල්ලා කෑ ගසති. මෙය අර්ධ වශයෙන් රාජ්‍ය අංශයේ රැකියා ආශ්‍රිතව ඇති තත්ත්වය සහ සුරක්ෂිතතාව සමඟ සම්බන්ධ වේ. සාපේක්ෂව අඩු ආදායම් තිබියදීත්, (සන්නද්ධ හමුදා වල කොටසක් නොවන අයට) රජයේ සේවය විශ්‍රාම වැටුපක් සහතික කරන හෙයින්, එය විශ්‍රාම ගැනීමෙන් පසු කෙනෙකුගේ සුරක්ෂිතාව පිළිබඳ හැඟීමට එක් කරයි. පොලීසියේ සහ වෙනත් වෘත්තීන් තුළ සිටින සමහරුන්ට, රාජ්‍ය අංශයේ රැකියා තුළින් දූෂණයෙන් සහ අයුතු ලාභ සලසා දීම වෙනුවෙන් ප්‍රතිලාභ ලබාගැනීමට ඉඩ සලසයි.[131] මෙය ද මිනිසුන් රාජ්‍ය අංශයේ රැකියා සඳහා ගිජු වීමට හේතුවකි.

17 වැනි සංශෝධනය මඟින් ස්වාධීනව සහ අපක්ෂපාතීව ක්‍රියා කළ හැකි ඉහළ පෙළේ රාජ්‍ය නිලධාරීන් තෝරාගැනීමේ යාන්ත්‍රණ හඳුන්වා දුන් නමුත්, 18 වැනි ව්‍යවස්ථා සංශෝධනයෙන් එම උත්සාහය අඩපණ විය. 19 වැනි සංශෝධනය මූලික වශයෙන් 17 වැනි සංශෝධනයට යළි පණ දුන්නේ 20 වැනි සංශෝධනය මඟින් එය ඉවත දැමීමට පමණි. ජනාධිපති ක්‍රමය යටතේ විධායක ශාඛාව පාර්ලිමේන්තුවට අවාසි වන අන්දමින් බලතල පවරා ගැනීමට උත්සාහ දරා ඇත. විශේෂයෙන්ම 20 වැනි සංශෝධනය සම්බන්ධයෙන් මෙය සත්‍ය වේ.[132]

ගජමිතුරුකම සහ නීතියේ ආධිපත්‍යය අකාරුණික ලෙස හෑල්ලුවට ලක්වීම ඒකාබද්ධ කිරීමෙන් පසුව ඇතිවන දඬුවම් නොලබා යාමේ වාතාවරණය විශේෂයෙන් සමාජය තුළ අවම වශයෙන් සවිබලග න්වී ඇති අයට බලපායි. මෙයට දුප්පතුන්, කාන්තාවන් හා සුළුතරයින් ඇතුළත් වේ. රාජ්‍ය අංශය තුළ වෘත්තීයභාවය අඩු පසුබිම් තුළ නිදැල්ලේ සිදුවන ස්ත්‍රීභාවය නිසා කතුන් හෙලා දැකීම සියලු මට්ටම් වල කාන්තාවන්ට බලපාන්නේ නම්, උතුරු නැගෙනහිර මිලිටරීකරණය සහ විශේෂයෙන් දෙමළ කාන්තාවන් බලහත්කාරයෙන් ගොදුරු කරගන්නා බව කියන ලිංගික සම්බන්ධතා, තවදුරටත් රාජ්‍ය ආයතන වල කීර්තිය කෙලෙසයි.

මේ සමඟ අත්වැල් බැඳගත් දිවයිනේ රාජ්‍ය ආයතන වල ක්ෂයවීම සියල්ලන්ටම බලපා ඇති අතර, දිවයිනේ සුළුතරයින්ට විශේෂයෙන් බලපා ඇත.

රාජ්‍ය ආයතන වල, විශේෂයෙන්ම පොලීසිය සහ හමුදාව තුළ සුළුජාතීන් නියෝජනයෙහි කැපී පෙනෙන අඩුවක් ඇත. මෙය බහුතර ප්‍රජාවට අයත් වන නිලධාරීන් විසින් සුළුතරයින්ට පහත් ලෙස සැලකීම බවට පරිවර්තනය වේ. මීට අමතරව, බොහෝ දේශපාලනඥයින් සහ නිලධාරීන් බහුතර ප්‍රජාවට අයත් වීමත් සමඟ, රජය වෙත ප්‍රවේශය සහ රාජ්‍ය සම්පත් ලබාගැනීමට හැකියාව දෙන අනුග්‍රාහක ජාල බොහෝ අවස්ථා වලදී ප්‍රතිලාභ සලසන්නේ තමන්ගේම ජනවාර්ගිකයන් වන තමන්ගේ ඡන්දදායකයින්ට ය. ඇතැම්විට, අවමානයට ලක්වන සහ කම්පනයට පත්වන ආකාරයෙන් සුළුතරයින්ගේ මනාප මුළුමනින්ම නොසලකා හැරීම ද සිදුවේ. නිදසුනක් වශයෙන්, මෑතකාලීන ප්‍රසිද්ධ නිවේදනයක් (2021 ඔක්තෝබර්) හරහා ඉහළ රාජ්‍ය තනතුරු සඳහා පත් කරන ලද පුද්ගලයින් 26 දෙනෙකු ප්‍රකාශයට පත් කළ විට, එම කණ්ඩායම තුළ දෙමළ හෝ මුස්ලිම් එක් පුද්ගලයෙකු හෝ නොවීය. COVID-19 හේතුවෙන් මියගිය බවට සැලකෙන අය භූමදාන කිරීමට එරෙහිව රජය පැනවූ තහනම අභියෝගයට ලක් කරමින් මුස්ලිම් සංවිධාන කිහිපයක් මඟින් ඉදිරිපත් කරන ලද මූලික අයිතිවාසිකම් පෙත්සම ඉදිරියට ගෙන යාමට ඇති අයිතිය ප්‍රතික්ෂේප කිරීමෙන් ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රතිචාර දැක්වූ විට ද, සුළුතර හැඟීම් සඳහා ඇති නොසැලකිල්ල ප්‍රත්‍යක්ෂ විය. තවද, 2022 මැයි මස ගෝඨාභය රාජපක්ෂ නව අමාත්‍යංශ ලේකම්වරුන් 23 දෙනෙකු පත් කළ විට, සියල්ලෝම සිංහලයෝ වූහ.[133]

මෙහි ප්‍රතිඵලය වන්නේ බහුතරවාදය සොයා යාමෙන් ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය අනතුරේ හෙළා ඇති බවයි. මේ සමඟ අත්වැල් බැඳගත් දිවයිනේ රාජ්‍ය ආයතන වල ක්ෂයවීම සියල්ලන්ටම බලපා ඇති අතර, දිවයිනේ සුළුතරයින්ට විශේෂයෙන් බලපා ඇත. පැහැදිලිවම, රටේ ප්‍රජාතාන්ත්‍රික ප්‍රතිපත්ති කඩ කිරීම හීන වී ඇති බහුත්වවාදයට සෘජුවම සම්බන්ධ වේ.

## 19. අන්තර්කරණය සහ පිළිගැනීම

## සමස්ත ලකුණු: 5.5

ආගම | **සමස්ත ලකුණු: 6**

ජනවාර්ගිකත්වය | **සමස්ත ලකුණු: 5**

යමෙක් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව සලකා බලන්නේ නම්, බුද්ධාගමට ප්‍රමුඛ ස්ථානය ලබාදී තිබියදීත්, රට ජනවාර්ගික-ආගමික විවිධත්වය නියෝජනය කරයි. යාපනය අර්ධද්වීපයේ දෙමළ ජනයා ට විවාහය, දේපළ සහ උරුමයට අදාල සබඳතා නියාමනය කරන තේසවලාමේ නීතිය භාවිතා කළ හැකිය. ඒ හා සමානව, උඩරට රාජධානිය හා සම්බන්ධ අයට ඔවුන්ගේම චාරිත්‍රානුකූල නීතිය ඇති අතර, ඉස්ලාම් ආගම අදහන අයට මුස්ලිම් පුද්ගලික නීතිය අදාළ වේ. විශේෂයෙන්ම මුස්ලිම් පුද්ගලික නීතියට බලපෑ හැකි පොදු නීති මාලාවක් නිර්මාණය කිරීමට උත්සාහයක් දැන් පවතින අතර, මේ වන තෙක් ශ්‍රී ලංකාවේ ආගමික ප්‍රජාවන් ක්‍රියාත්මක වන්නේ දිගු කලක් තිස්සේ කළ ආකාරයට සාපේක්ෂව නිදහස් තත්ත්වයක ය. එබැවින්, ශ්‍රී ලාංකිකයන් ගෙන් ආසන්නව සියයට 75 ක් (2019 සමීක්ෂණයක දී) පැවසුවේ ඔවුන් අනෙකුත් ප්‍රජාවන් සමග සාමකාමීව ජීවත් වන බවයි.[134]

හින්දු දෙවිවරුන් සහ ඇතැම් හින්දු පිළිවෙත් බුදු දහම තුළට කාන්දු වී ඇති අතර, මෙම සංකලනය ආගම් දෙකටම එකට බැඳී සිටීමට හැකියාව ලබා දේ. උඩරට රාජධානිය හා සම්බන්ධ අවසාන රජවරුන් දකුණු ඉන්දියාවෙන් පැමිණි දෙමළ ජාතිකයන් වූ අතර, මීට පෙර සිංහල රජවරු දකුණු ඉන්දියාවෙන් භාර්යාවන් සෙවූ හ. මෙයින් සනාථ කෙරෙන්නේ, වෙනත් ආගමික කණ්ඩායම් බෞද්ධ ඇදහිල්ලට හානි කිරීමට උත්සාහ නොකළහොත් බෞද්ධයන් ඔවුන්ට අකැමැති නොවූ බවයි. යටත්විජිත සමයේදී ලන්දේසීන් කතෝලිකයින්ට හිංසා පීඩා කරන විට උඩරට රජවරු ඔවුන්ට ආරක්ෂාව සැපයූ අතර, ඒ හා සමානව යටත්විජිත හිංසා පීඩා මඟහරවා ගැනීමට ඔවුහු මුස්ලිම්වරුන්ට ද උදව් කළහ. මීට අමතරව, විවිධ ආගමික කණ්ඩායම් ආකර්ෂණය කරන පොදු සිද්ධස්ථාන කිහිපයක් තිබීමෙන් ඉස්මතු වන්නේ බහු-ආගමික පසුබිමක ශ්‍රී ලාංකිකයන්ට ගැටළුවක් නොමැති බවයි. සමාජයක් තුළ ග්‍රහණය කර ගන්නා කතාවස්තු මඟින් කණ්ඩායම් අතර සබඳතා වර්ධනය වන ආකාරය සකස් වන අතර, අවාසනාවකට මෙන්, ශ්‍රී ලංකාව තුළ විවිධ ජනවාර්ගික ව්‍යවසායකයින් අවස්ථාවාදීව ජනවාර්ගික සහ වාර්ගික ආතතීන් අවුළුවා ඇත.

සමාජයක් තුළ ග්‍රහණය කර ගන්නා කතාවස්තු මඟින් කණ්ඩායම් අතර සබඳතා වර්ධනය වන ආකාරය සකස් වන අතර, අවාසනාවකට මෙන්, ශ්‍රී ලංකාව තුළ විවිධ ජනවාර්ගික ව්‍යවසායකයින් අවස්ථාවාදීව ජනවාර්ගික සහ වාර්ගික ආතතීන් අවුළුවා ඇත.

මේ අනුව, බහුත්වවාදය දිවයිනේ සජීවී යථාර්ථය වන අතර, මැතිවරණ වාසි සඳහා ජනවාර්ගික සහ ආගමික අනන්‍යතා දේශපාලනීකරණය කිරීම හරහා අන්තර්-ජනවාර්ගික සහ අන්තර්-ආගමික සබඳතාවලට විෂ වද්දා ඇත. එකිනෙකා සමඟ සුහදව කටයුතු කරන විවිධ ජනවාර්ගික-ආගමික පසුබිම් වල පුද්ගලයන්, සමාජ-දේශපාලන ගැටළු මැදිහත් වන විට තමන්ගේ කණ්ඩායම් අනන්‍යතාවය වැළඳ ගෙන එයට වරප්‍රසාද ලබාදෙයි. වරින් වර ඇතිවන ජනවාර්ගික-ආගමික කෝලාහල සහ සිවිල් යුද්ධය බහුත්වවාදය දුර්වල කරන ආකාර වලින් කණ්ඩායම් අනන්‍යතා දැඩි කිරීමට දායක වී ඇත. ඇත්ත වශයෙන්ම බොහෝ සිංහලයින් (සියයට 71.8) හට දිවයිනෙහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ බුද්ධාගමට ප්‍රමුඛ ස්ථානය දීම හොඳයැයි හැඟෙන අතර, වතු දෙමළ ජනයාගෙන් සියයට 77.2 ක් සහ මුස්ලිම් වරුන්ගෙන් සියයට 76.3 ක් විශ්වාස කරන්නේ කිසිදු ආගමකට විශේෂ සැලකිල්ලක් නොදිය යුතු බවයි.[135]

ශ්‍රී ලංකාව ක්‍රියාත්මක වන්නේ බහුතරවාදී ස්වරූපයක් තුළ ය. බුද්ධාගම රජයේ ප්‍රතිපත්ති වලට අණ කරන ආකාරය සහ නිත්‍යානුකූල සුළුතර දුක්ගැනවිලි නොසලකා හරින ආකාරය සැලකිල්ලට ගන්නා විට, එය ජනවාර්ගික තන්ත්‍රයක් ලෙස හැඳින්වීමට සුදුසුකම් ලබයි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, බොහෝ සුළුතර ජාතීහු, සැකසුම මත රඳාපවතිමින් පිළිගැනීමට ලක්වූ/ඇතුළත් කෙරුණු හැඟීම් සහ ප්‍රතික්ෂේප වූ/බැහැර කිරීමට ලක්වූ හැඟීම් අතර දෝලනය වෙති. සිවිල් සමාජ සංවිධානයක, ආදි ශිෂ්‍ය සංගමයක හෝ බහුවිධ ආගම් අදහන සිද්ධස්ථානයක් සමඟ සම්බන්ධ වී සිටින විට වෙනත් කණ්ඩායමක කෙනෙකු සමඟ තමන් ද කෙනෙක් බව හැඟෙන පුද්ගලයාට, සිංහල භාෂාවෙන් පමණක් ක්‍රියාත්මක වන නිලබලධරයෙකු සමඟ කටයුතු කිරීමේ දී තමා නොවැදගත්ය යන හැඟීමක් ඇති විය හැකිය. පුද්ගලයා කොන්කිරීමට ලක්වීම වැඩිවන තරමට, වෙනස්ව සැලකීම හේතුවෙන් ඔවුන් වෙනස්කොට සැලකීමට ලක්වන බව හැඟීමට ඇති ඉඩකඩ වැඩි ය.

ශ්‍රී ලංකාව සිංහල බෞද්ධ බහුතරවාදී රාජ්‍යයක් වන අතරම, කලාපීය බහුතරයකින් යුක්ත වන සුළුතර ප්‍රජාවන් ද බහුතරවාදී මානසිකත්වයක් වැළඳ ගන්නා බව සත්‍යයක්ව පවතී. මෙය සිංහල බෞද්ධයන් ජාතික මට්ටමේ සමාජ-දේශපාලන වේදිකාවේ ආධිපත්‍යය දැරීමට දක්වන ප්‍රතිචාරයක් විය හැකිය. එහෙත්, කොළඹින් පිටත සීමාසහිත බලමණ්ඩල පැවතීම යටත්විජිත යුගයට පෙර සහ යටත්විජිත යුගය පැවති කාලවල දී ජීවිතයේ සත්‍යයක් විය. කෙනෙකුට කිව හැකි දෙය නම්, ඉතා සමීපව ජීවත් වන දිවයිනේ බහු-ජනවාර්ගික සහ බහු-ආගමික දේශපාලන සමාජය බෙදා වෙන්කිරීමට විවිධ හේතු ජේදනය වන බවයි.

# 20. සමාජයේ හවුල් හිමිකාරිත්වය

## සමස්ත ලකුණු: 5

ආගම | **සමස්ත ලකුණු: 5**
ජනවාර්ගිකත්වය | **සමස්ත ලකුණු: 5**

දෙමළ ජනයාට රට තුළ සමාන පුරවැසියන් ලෙස ඒකාබද්ධ විය හැකි යැයි හැඟුණේ නම් දශක තුනකට ආසන්න සිවිල් යුද්ධය සිදු නොවනු ඇත. සිවිල් යුද්ධයෙන් පසු, ජාතිකවාදී බලවේග වලට මුස්ලිම්වරුන් ඉලක්ක කිරීමට රජය ඉඩ දුන්නේය. සිංහල බෞද්ධ ජාතිකවාදය පදනම් වී ඇත්තේ බහුතර ප්‍රජාවගේ ඉවසීමට ස්තුතිවන්නට සුළුතරයින් රට තුළ ජීවත් වන්නේය යන සංකල්පනය මත ය. එවැනි සමාජ පරිසරයක් තුළ තමන් සමාජයේ සමාන කොටසක් යැයි සුළුතරයින්ට හැඟෙනු ඇතැයි යමෙකුට අපේක්ෂා කළ නොහැකිය. මෙහි ප්‍රතිඵලය නම්, අවම වශයෙන් රාජ්‍යය සමඟ අන්තර්ක්‍රියා කිරීමේදී ජනවාර්ගිකත්වය පුරවැසිභාවය අභිභවා යන තැනකට ශ්‍රී ලංකාව පත්ව තිබීමයි. මෙය තැනින් තැනට වෙනස් විය හැකි නමුත්, බහුතරවාදය සහ ජනවාර්ගික තන්ත්‍රය බලදායී කරන්නේ මෙයයි.

කෙසේවෙතත්, සුළු ජාතිකයෝ ද තමන් ආධිපත්‍ය දරන ප්‍රදේශ වල බහුතරවාදී මානසිකත්වයක් වැළඳ ගනිති. මේ අනුව, උතුරු පළාතේ (විශේෂයෙන් යාපනය අර්ධද්වීපයේ) දෙමළ ජනයා ක්‍රියාත්මක වන්නේ ඔවුන්ට එම ප්‍රදේශයේ වඩා විශාල හිමිකාරිත්වයක් ඇති ලෙස ය. මේ අතර,

කොළඹ සහ නැගෙනහිර පළාතේ තමන්ගේම කියා ගන්නා සමහර ප්‍රදේශ වල මුස්ලිම් ජනයා ද ප්‍රතික්‍රියා කරන්නේ මේ ලෙසටම ය. නැගෙනහිර පළාතේ කාත්තන්කුඩි නගරය සම්පූර්ණයෙන්ම මුස්ලිම් වන අතර, එය දකුණු ආසියාවේ වඩාත්ම ජනාකීර්ණ ප්‍රදේශ අතරට ශ්‍රේණි ගත වේ. එය බොහෝ විට පිටස්තරයන් සතුටින් පිළිගන්නේ නැත.[136]

මෑතකදී ඇති වූ මුස්ලිම්-විරෝධී උද්ඝෝෂණ සහ ප්‍රචාරයන් ක්‍රියාත්මක වීමට පෙර පවා, මුස්ලිම් නොවන ප්‍රදේශ වල දේපළ මුස්ලිම්වරුන්ට විකිණීමේ අකැමැත්තක් තිබුණි. මෙය බොහෝ මුස්ලිම්වරුන් අනෙක් කණ්ඩායම් අතර ජීවත් වීමට වඩා තම තමන් අතර ජීවත් වීමට වැඩි කැමැත්තක් දැක්වීම සමඟ සම්පාත වේ. කොළඹින් පිටත ප්‍රදේශ වල, ක්‍රිස්තියානි ශුභාරංචි දේශකයින් හට ද, ඔවුන්ගේ ක්‍රියාකාරකම් වලට බෞද්ධ භික්ෂූන් සහ පොලීසිය තර්ජනය කිරීමත් සමඟ, නිවාස හෝ වන්දනාමාන සේවා සඳහා ඉඩක් කුලියට ගැනීමේ හැකියාව ප්‍රතික්ෂේප වී ඇත.

ජනවාර්ගික-ආගමික අනන්‍යතාවන්ගේ සිත් ඇදගන්නා පාර්ශවයන් සාමූහික හිමිකාරිත්වය පිළිබඳ හැඟීම බිඳ දැමීමට උපකාර කර ඇත. සිංහල බෞද්ධ අවශ්‍යතා සහ ඉල්ලීම් සපුරාලීම 1950 ගණන් වල මැද භාගයේ දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට බලයට ඒමට ඉවහල් වූ අතර, එතැන් පටන්, තවත් බොහෝ පක්ෂ (පාලක ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ සමඟ) බහුතරවාදය උද්යෝග යෙන් වැළඳ ගෙන ඇත. ඇත්ත වශයෙන්ම, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ කිසිදු සුළුතර සහයෝග යක් නොමැතිව අධිපතිවාදී රජයක් නිර්මාණය කිරීම ගැන ආඩම්බර වෙයි.[137] දෙමළ සහ මුස්ලිම් පක්ෂ ද විශේෂයෙන් ප්‍රාදේශීය, පළාත් සහ පාර්ලිමේන්තු මැතිවරණ වලදී ඡන්ද දිනාගැනීම සඳහා ජනවාර්ගික-ආගමික ආස්ථානයන් වැළඳගන්නා අතර, එමඟින් හවුල් හිමිකාරිත්වයට හිතකර සමාජයක් ගොඩනැඟීමේ හැකියාව අඩපණ කිරීමට උදව් කරයි.

පාසැල් පද්ධතිය එකම ආගමකට හෝ ජනවාර්ගිකත්වයකට අයත් සිසුන්ට සේවා සැපයීම මඟින් ගැටළුව උග්‍ර කර ඇත. එක් අතකට, ආගමික සංවිධාන වලට තමන්ගේම අධ්‍යාපන ආයතන පවත්වා ගෙන යාමට ඉඩදීම බහුත්වවාදයේ වැදගත් සලකුණකි. නමුත්, අනෙක් අතට, මෙය සමාජය මගින් ශක්තිමත් කරන්නාවූ වෙනම පැවත්මක් ශක්තිමත් කරන, දරුවන්ට බාහිර ලෝකයෙන් වෙන්වූ හැදී වැඩීමකට මඟ පාදයි. මෙම අසමාන පුරවැසිභාවය පිළිබඳ හැඟීම පන්තිය හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවය නොසලකා, සියල්ලන්ටම බලපායි. එහි ප්‍රතිඵලයක් ලෙස බොහෝ ශ්‍රී ලාංකිකයෝ වැඩියෙන් එකට මිශ්‍ර වීමක් නොමැතිව සහජීවනයෙන් ජීවත් වෙති. රට තුළ කාවැද්දී ඇති බහුතරවාදය මධ්‍යයේ දිවයිනට බහුත්වවාදයේ පිටස්තර ව්‍යාජ පෙනුමක් පවත්වා ගෙන යාමට හැකි වීමට එය ප්‍රධාන හේතුවක් වේ.

# නිර්දේශ

1. රටක පුරවැසියන්ට පරස්පර මනාප තිබිය හැකි නමුත්, රාජ්‍යයන් පවතින්නේ එවැනි වෙනස්කම් වලට මැදිහත් වීමට සහ එමඟින් පුරෝකථනය කළ හැකි සහ සමාකාමී සබඳතා සහතික කිරීමට ය. කෙටියෙන් කිවහොත්, රාජ්‍යයට සහ එහි ආයතන වලට පුරවැසියන් බහුත්වවාදය හෝ බහුතරවාදය වැළඳගැනීම කෙරෙහි හුරුකිරීමේ දී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළ හැකි ය. ශ්‍රී ලංකා රජයට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හඳුන්වා දීමට අවශ්‍ය වන අතර, දිවයින ණීබහු-ජනවාර්ගික, බහු-භාෂාමය, බහු-ආගමික සහ බහු-සංස්කෘතිකා වන බව එම ලේඛනයේ නිශ්චිත වශයෙන් සඳහන් කිරීම අත්‍යවශ්‍ය වේ. 2020 පෙබරවාරි 20 වැනි දින පිහිටා හි පැවති එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 43 වැනි සැසි වාරයේදී විදේශ අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන විසින් මෙය සටහන් කරන ලදී. නමුත් ජාත්‍යන්තර ප්‍රේක්ෂකාගාරයක් සතුටු කිරීම සඳහා එසේ ප්‍රකාශ කිරීම රටේ වැදගත්ම ආයතනය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ එය අවධාරණය කිරීම හා සමාන නොවේ.

2. පුරවැසියන් සමඟ අන්තර්ක්‍රියා කරන සියලුම රාජ්‍ය පහසුකම් තුළ බහුත්වවාදය ප්‍රවර්ධනය කිරීම සඳහා නිශ්චිත නීති සහ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම මඟින් රාජ්‍යය එහි කැපවීම ශක්තිමත් කළ යුතු ය.

3. රජය විසින් රජයේ සේවකයින් සඳහා බහුත්වවාදය පිළිබඳව අධ්‍යාපනික සහ පුහුණු වැඩසටහන් පවත්වා, මෙම න්‍යාය පත්‍රය ප්‍රවර්ධනය කිරීම පිණිස රාජ්‍ය නොවන සංවිධාන සහ ජාත්‍යන්තර ප්‍රජාව සමඟ සහයෝගිත්වයෙන් කටයුතු කළ යුතු ය.

4. දිවයිනේ බහුත්වවාදයට ගරු කිරීමට සහ එය ආරක්ෂා කිරීමට ආගමික ආයතන ඇතුළු රාජ්‍ය නොවන සංවිධාන දිරිමත් කරන අතරම, රජය විසින් පාලනය කරන පාසැල් විෂය මාලාව තුළ බහුත්වවාදය ඇතුළත් කළ යුතු ය.

5. ජාතික ගීය රාජ්‍ය භාෂා දෙකෙන්ම ගායනා කිරීම සහ සියළුම රාජ්‍ය නිලධාරීන් ජාතික භාෂා දෙකම කථා කිරීමට දක්ෂ බව රජය විසින් සහතික කළ යුතු ය. සමාජයේ සෑම අංශයකම පුරවැසියන්ගේ ද්විභාෂාමය හැකියාවන් වැඩිදියුණු කිරීමට රාජ්‍යය කටයුතු කරන අතරම, යම් මට්ටමකින් ඔබ්බට නිලබලධරයන් සඳහා ද්විභාෂාත්වය අනිවාර්ය කළ යුතු ය.

6. රජයේ වැඩසටහන් මඟින් බහුත්වවාදය සමඟ සමෘද්ධිය හා සුරක්ෂිතතාව සම්බන්ධ කළ යුතු අතර, ශ්‍රී ලංකාවේ ගැටලු බොහොමයක් පැන නඟින්නේ බහුතරවාදයෙන් බවත්, සියලු පුරවැසියන්ට එක හා සමානව සලකන තුරු රටට තවදුරටත් සංවර්ධනය විය නොහැකි බවත් අවධාරණය කළ යුතු ය.

7. රට ප්‍රධාන වශයෙන් බහුතර ප්‍රජාව මඟින් සහ ඔවුන් වෙනුවෙන් පාලනය වන අඛණ්ඩ ජනවාර්ගික තන්ත්‍රයක් වීම වැළැක්වීම සඳහා, වැඩියෙන් කුසලතා මත පදනම් වූ භාවිතාවන් වෙතට රාජ්‍යය ආපසු යා යුතු ය.

8. ප්‍රජාවන් හරහා ක්‍රියාකාරී සම්බන්ධ වීම ප්‍රවර්ධනය කිරීම සඳහා, රජය විසින් දිස්ත්‍රික් සංහිඳියා කමිටු (DRCs) යළි සක්‍රීය කළ යුතු අතර, ජනවාර්ගික-ආගමික ආතතීන් අවම කර ගැටුම් නිරාකරණය ප්‍රවර්ධනය කිරීම සඳහා උප දිස්ත්‍රික් මට්ටමේ සංහිඳියා කමිටු පිහිටුවිය යුතු ය. දිස්ත්‍රික් සංහිඳියා කමිටු වල කැඳවුම්කරුවන් ලෙස දිස්ත්‍රික් (හෝ ප්‍රාදේශීය) ලේකම්වරුන් සිටින අතර, කැබිනට් මණ්ඩලය විසින් 2017 දී නියම කළ පරිදි ඒවා - විශ්‍රාමලත් විනිසුරුවරුන් ඇතුලුව - ආගමික පූජකවරුන්, පොලීසිය, පාසැල් ගුරුවරුන් සහ රජයේ නිලධාරීන් ගෙන් සමන්විත විය යුතු ය.

9. බහුත්වවාදය සහ සමාන අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාවක් පිහිටුවීම. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ හඳුනාගෙන ඇති ගැටලු සම්බන්ධයෙන් කොමිෂන් සභාව කටයුතු කළ යුතු ය. බහුත්වවාදය සහ සමාන අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාව සමාජය තුළ බහුත්වවාදය ප්‍රවර්ධනය කරන අතර, එයට තමන්ගේම පරීක්ෂණ පැවැත්වීමටත්, ක්‍රියාත්මක කිරීම සඳහා නියෝග ලබාදීමටත්, නීතිපතිවරයා හරහා අධිකරණයට ප්‍රවේශ වීමටත්

බලය තිබෙනු ඇත. ඕනෑම යෝජිත නීතියක් රට තුළ බහුත්වවාදය ප්‍රවර්ධනය කරන්නේ හෝ අවුල් කරන්නේ කෙසේද යන්න පිළිබඳව කොමිෂන් සභාවේ නිරීක්ෂණ සහිතව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමු කිරීමට එයට ඉඩ දිය යුතු ය.

10. ජාත්‍යන්තර ප්‍රජාව විසින් රජයට එහි සියලු ප්‍රයත්නයන්හි දී බහුත්වවාදය අන්තර්ගත කිරීමට බල කළයුතු අතර, එසේ කිරීමට අපොහොසත් වූ විට එය වග වන ලෙස තබා ගත යුතු ය.

# සදුවී

1 Department of Census and Statistics Sri Lanka, "Census of Population and Housing 2012," (Colombo: Department of Census and Statistics, 2012), http://www.statistics.gov.lk/Resource/en/Population/CPH_2011/CPH_2012_5Per_Rpt.pdf

2 CPA, *Values and Attitudes Survey on 70 Years of Independence in Sri Lanka*, 2019 පෙබරවාරි 4, 36, ප්‍රවේශ වූ දිනය 2022 අගෝස්තු 23, https://www.cpalanka.org/values-and-attitudes-survey-on-70-years-of-independence-in-sri-lanka/

3 CPA, *Values and Attitudes Survey*, 36–7.

4 CPA, *Confidence in Democratic Governance Index (Wave 2): Report*, 2022 මැයි 23, 22.

5 John Clifford Holt, ed., Buddhist Extremists and Muslim Minorities: Religious Conflict in Contemporary Sri Lanka (ඔක්ස්ෆර්ඩ්: ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාල මුද්‍රණාලය, 2016).

6 Ministry of Foreign Affairs, "Overview," n.d., https://mfa.gov.lk/overview/.

7 Neil DeVotta, "Sri Lanka's Prevention of Terrorism Act: An Anti-Minority Cudgel," ADRN Issue Briefing, 2021 ජූනි 14, http://adrnresearch.org/publications/list.php?cid=1&sp=%26sp%5B%5D%3D1%26sp%5B%5D%3D2%26sp%5B%5D%3D3&pn=1&sn=s1&st&acode&code=001001&at=view&idx=166&ckattempt=1.

8 European Parliament, Motion for a Resolution on The Situation in Sri Lanka, in Particular the Arrests Under the Prevention of Terrorism Act, 2021/2748 (RSP), 2021 ජූනි 8, https://www.europarl.europa.eu/doceo/document/B-9-2021-0361_EN.html.

9 *The Island Online*, "GL Urges UNHRC to Heed Situation in SL," 2022 ජූනි 14, https://island.lk/gl-urges-unhrc-to-heed-situation-in-sl/.

10 Freedom From Torture, "Sri Lanka's Withdrawal From UN Human Rights Council Resolution: What It Means for Survivors," 2020 පෙබරවාරි 26, https://www.freedomfromtorture.org/news/sri-lankas-withdrawal-from-un-human-rights-council-resolution-what-it-means-for-survivors#:~:text=The%20Sri%20Lankan%20government%20has,reconciliation%2C%20accountability%20and%20human%20rights.

11 Taylor Dibbert, "Sri Lanka: On Politics, Reform and International Engagement," *Huffington Post*, 2017 මැයි 14, https://www.huffpost.com/entry/sri-lanka-on-politics-reform-and-international-engagement_b_591878fbe4b00ccaae9ea40e.

12 *Colombo Gazette*, "EU GSP+ Monitoring Mission Concludes Key Visit to Sri Lanka," 2021 ඔක්තෝබර් 6, https://colombogazette.com/2021/10/06/eu-gsp-monitoring-mission-concludes-key-visit-to-sri-lanka/.

13 *Colombo Gazette*, "EU GSP+ Monitoring Mission."

14 *The Island Online*, "GL Urges UNHRC to Heed Situation in SL."

15 *The Morning*, "Sabry terms UNHRC resolution 'divisive,' 2022 සැප්තැම්බර්, https://www.themorning.lk/sabry-terms-unhrc-resolution-divisive/

16 A prominent instance of this pertained to Ramzy Razeek, who was charged using the ICCPR Act for a Facebook post. See, Amnesty International, "Drop Charges Against Sri Lankan Social Media Commentator," දිනය සඳහන් කර නොමැත, https://act.amnestyusa.org/page/79791/action/1?locale=en-US.

17 UNDP, "Sri Lanka: Gender Equality," https://www.undp.org/srilanka/gender-equality#:~:text=Women%20constitute%2052%25%20of%20Sri,36.6%25%20of%20the%20total%20population.

18 K.O.G.H.M.A. L. Herath, "CEDAW Implementation in Sri Lanka," 2019 මාර්තු 7, https://www.slideshare.net/AyeshaHerath1/cedaw-implementation-in-sri-lanka.

19 Javid Yusuf, "MMDA Reform Process: A Step Without Transparency and in the Wrong Direction," *Sunday Times*, 2021 ඔක්තෝබර් 3, https://www.sundaytimes.lk/211003/columns/mmda-reform-process-a-step-without-transparency-and-in-the-wrong-direction-457028.html.

20 Safia Khan, "Sri Lanka Restricts the Human Rights of Muslims," *Human Rights Pulse*, 2021 ඔක්තෝබර් 2, https://www.humanrightspulse.com/mastercontentblog/sri-lanka-restricts-the-human-rights-of-muslims.

21 Khan, "Sri Lanka Restricts the Human Rights of Muslims."

22 මෙය දෙමළ ජනතාව අතර, විශේෂයෙන් මහින්ද රාජපක්ෂ ජනාධිපතිව සිටි කාලයේ, සුලබව පැවති මැසිවිල්ලකි. දෙමළ ජනයාට ද්විත්ව පුරවැසිභාවය දැරීමට ඉඩදීමට රජය අකැමැති වූයේ, උතුරු නැගෙනහිර දෙමළ ඉඩම් පවරා ගැනීමට තිබූ එහි අධිෂ්ඨානයට සම්බන්ධ බව ද පෙනෙන්නට තිබුණ ද, අර්ධ වශයෙන් එය එල්ටීටීඊය යළි නැඟිටිනු ඇතැයි පැවති බිය නිසා ය. ද්විත්ව පුරවැසිභාවය ලබාගැනීමට උත්සාහ කළ බොහෝ දෙමළ ජනතාව ඔවුන් අත්හැර දමා ගිය (ඉන් බොහොමයක් ඊනියා අධි-ආරක්ෂිත කාලප තුළට වැටීමෙන් පසු හමුදාව විසින් පවරා ගන්නා ලද) ඉඩම් යළි අත්පත් කර ගැනීමට ද උත්සාහ දැරූහ. මෛත්‍රීපාල සිරිසේන යටතේ පැවති රජය දෙමළ ජනයාට ද්විත්ව පුරවැසිභාවය ලබාදීමට වැඩි කැමැත්තක් දැක් වූ බව පෙනුණි.

23 2019 ගෘහස්ථ ආදායම් හා වියදම් සමීක්ෂණයට අනුව, වතු අංශයේ පවුල් වල (පුද්ගලයින් 3.7 කින් සමන්විත) සාමාන්‍ය අගය මසකට රුපියල් 46,865 ක් (2019 දී ආසන්නව ඇමෙරිකානු ඩොලර් 265 ක්) වූ අතර, රටේ සාමාන්‍ය මාසික ගෘහස්ථ ආදායම රුපියල් 76,414 (2019 දී ආසන්නව ඇමෙරිකානු ඩොලර් 430 ක්) විය. බලන්න, *Daily Mirror*, "SL's Average Household Income Makes Shocking Revelation About Poverty Level," 2022 ජුනි 13, https://www.dailymirror.lk/business-news/SLs-average-household-income-makes-shocking-revelation-about-poverty-level/273-238959.

24 මෙම සංඛ්‍යා රජයේ සේවකයින් සමඟ පැවැත්වූ බොහෝ සම්මුඛ සාකච්ඡා මත පදනම් වූ ඇස්තමේන්තු වේ.

25 Shamindra Ferdinando, "Only Traitors Won't Accept Urgent Economic Reform Agenda Acceptable to IMF," *The Island Online*, 2022 ජුනි 1, https://island.lk/only-traitors-wont-accept-urgent-economic-reform-agenda-acceptable-to-imf/.

26 *Sunday Times*, "35 Years On We Are Still Pleading for Tamil as an Official Language: Sumanthiran," 2021 ජුනි 27, https://www.pressreader.com/sri-lanka/sunday-times-sri-lanka/20210627/281655373046289.

27 UNHRC, Report of the Special Rapporteur on Minority Issues on Her Mission to Sri Lanka, January 31, 2017, A/HRC/34/53/Add.3, 22 සහ 23 ඡේදයන්.

28 International Crisis Group, "Sri Lanka's Conflict-Affected Women: Dealing With the Legacy of War," Report No. 289, 2017 ජූලි 28, https://www.crisisgroup.org/asia/south-asia/sri-lanka/289-sri-lankas-conflict-affected-women-dealing-legacy-war.

29 US Department of State, 2020 *Report on International Religious Freedom: Sri Lanka*, 2021 මැයි 12, Office of Religious Freedom, https://www.state.gov/reports/2020-report-on-international-religious-freedom/sri-lanka/.

30 Annie Banerji, "Sri Lankan Center Condemns Ban on Female Circumcision as 'Affront,'" *Reuters*, 2018 ජූලි 11, https://www.reuters.com/article/us-sri-lanka-women-fgm/sri-lankan-islamic-center-condemns-ban-on-female-circumcision-as-affront-idUSKBN1K12OZ.

31 David Doyle, "Sri Lanka: Grim Up North for the Tamil Community," *4 News*, 2013 නොවැම්බර් 15, https://www.channel4.com/news/sri-lanka-tamil-north-vanni-human-rights-chogm-rajapaksa; Human Rights Watch, "'We Will Teach You a Lesson': Sexual Violence Against Tamils by Sri Lankan Security Forces," 2013 පෙබරවාරි 26, https://www.hrw.org/report/2013/02/26/we-will-teach-you-lesson/sexual-violence-against-tamils-sri-lankan-security-forces; International Crisis Group, "Sri Lanka's Conflict-Affected Women."

32 CPA, *Confidence in Democratic Governance Index (Wave2): Report*, 4.

33 Ravi P. Rannan-Eliya, "Increasing Numbers of Sri Lankans Want to Migrate, Especially Youth and Disenchanted Government Voters," Sri Lanka Opinion Tracker Survey 2021-01, Institute for Health Policy, 2021 නොවැම්බර් 17, 4, ප්‍රවේශ වූ දිනය 2021 නොවැම්බර් 21. http://ihp.lk/publications/publication.html?id=956.

34 මෙය විශේෂයෙන් ප්‍රාදේශීය මට්ටමින්, සහ සම්පත් බෙදා වෙන්කිරීම සම්බන්ධයෙන් වන පොදු පැමිණිල්ලකි. නිදසුනක් වශයෙන්, දෙමළ සහ මුස්ලිම් ජනතාව ඡන්දය ප්‍රකාශ නොකිරීම නිසා මහින්ද සහ ගෝඨාභය රාජපක්ෂගේ නායකත්වයෙන් යුත් රජයන්ට සුළුතර අවශ්‍ය සපුරාලීමට හේතුවක් නොතිබුණි. තවද, රාජපක්ෂ රජයන් තුළ පවුලේ සාමාජිකයින් තීරණ ගත් අතර (අමාත්‍යවරුන්ගේ තීරණ පවා පෙරළා දමමින්), මෙය දේශපාලන සලකා බැලීම් මත පදනම් ව සිදුවිය. නිදසුනක් ලෙස, බලන්න, R. Ramesh, "How Equal Is Access to Public Services? The Impact of Sociodemographic Background on Public Service Delivery in Sri Lanka," *Journal of Developing Societies* 37:1 (2020): 7–29.

35 Human Rights Watch, "Sri Lanka: Security Agencies Shutting Down Civic Space," 2020 මාර්තු 3, https://www.hrw.org/news/2020/03/03/sri-lanka-security-agencies-shutting-down-civic-space.

36 Neil DeVotta, "The Genesis, Consolidation, and Consequences of Sinhalese Buddhist Nationalism," *When Politics Are Sacralized: Comparative Perspectives on Religious Claims and Nationalism* තුළ, සංස්කරණය Nadim N. Rouhana iy Nadera Shalhoub-Kevorkian (කේම්බ්‍රිජ්: කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාල මුද්‍රණාලය, 2021), 187–212.

37 Neil DeVotta, "Sri Lanka's Ongoing Shift to Authoritarianism," *Asia Pacific Bulletin* no. 201 (2013), https://www.eastwestcenter.org/system/tdf/private/apb201_0.pdf?file=1&type=node&id=33932.

38 නිදසුනක් ලෙස, බලන්න, Benjamin Schonthal, "Environments of Law: Islam, Buddhism, and the State in Contemporary Sri Lanka," *The Journal of Asian Studies* 75:1 (2016): 137–56.

39 Nihal Jayawickrama, "Judicial Corruption," *Colombo Telegraph*, 2021 පෙබරවාරි 28, https://www.colombotelegraph.com/index.php/judicial-corruption/.

40 *Sri Lanka Brief*, "Militarized North-East Sri Lanka: Muslim and Tamil Women Systematically Crushed By Lawlessness and Expropriation," 2013 මාර්තු 12, https://srilankabrief.org/militarized-north-east-sri-lanka-muslim-and-tamil-women-systematically-crushed-by-lawlessness-and-expropriation/; International Crisis Group, "Sri Lanka's Conflict-Affected Women."

41 Neil DeVotta, *Blowback: Linguistic Nationalism, Institutional Decay, and Ethnic Conflict in Sri Lanka* (ස්ටැන්ෆර්ඩ්: ස්ටැන්ෆර්ඩ් විශ්වවිද්‍යාල මුද්‍රණාලය, 2004).

42 Jayadeva Uyangoda, "Sri Lanka in 2010 Regime Consolidation in a Post-Civil War Era," *Asian Survey* 51:1 (2011): 133; Daily FT, "President Vows to Finish Term, Tells Bloomberg Will Not Run for Re-Election," 2022 ජුනි 7, https://www.ft.lk/front-page/President-vows-to-finish-term-tells-Bloomberg-will-not-run-for-re-election/44-735842.

43 Neil DeVotta, "Politics and Governance in Post-Independence Sri Lanka," *Routledge Handbook of South Asian Politics: India, Pakistan, Bangladesh, Sri Lanka, and Nepal* තුළ, සංස්කරණය Paul R. Brass (නිව්යෝර්ක්: රවුට්ලෙජ්, 2010), 125.

44 Nirupama Subramanian, "When a Dynasty Read the Future," *The Hindu*, 2014 පෙබරවාරි 28, https://www.thehindu.com/opinion/op-ed/when-a-dynasty-read-the-future/article5733363.ece.

45 Tahir Kamran, "Dynastic Politics in South Asia – I," *The News on Sunday*, 2022 මැයි 8, https://www.thenews.com.pk/tns/detail/955902-dynastic-politics-in-south-asia-i; Angad Singh, "Dynasty and Democracy in South Asia," The Gate, 2015 දෙසැම්බර් 2, http://uchicagogate.com/articles/2015/12/2/dynasty-and-democracy-in-south-asia/.

46 *The Island Online*, "Restoring Dignity of Legislature," 2022 මැයි 17, https://island.lk/restoring-dignity-of-legislature/.

47 වර්තමාන දත්ත වලට අනුව, ශ්‍රී ලංකාවේ මිලියන 5.2 ක් වන කුටුම්බයන්ගෙන්, මිලියන 3.8 ක් සතුව රූපවාහිනී යන්ත්‍ර ඇත. රූපවාහිනී මධ්‍යස්ථාන වලින් අති මහත් බහුතරයක් දැන් පුද්ගලික හිමිකරුවන් සතු ය. බලන්න, file:///C:/Users/devottn/Downloads/SSRN-id2910307.pdf ; *Wikipedia*, "Television in Sri Lanka," දිනය සඳහන් කර නොමැත, https://en.wikipedia.org/wiki/Television_in_Sri_Lanka.

48 East-West Center, "Sri Lanka Media Minister Decries Profit-Driven Nationalistic Coverage in South Asia," *Huffington Post*, 2017 ජනවාරි 19, https://www.huffpost.com/entry/sri-lanka-media-minister_b_14270406.

49 Kamya Yadav සහ පිරිස, "Old Hatreds Fuel Online Misinformation About COVID-19 in South Asia – Bulletin of the Atomic Scientists," *Giant Oak*, 2020 නොවැම්බර් 30, http://blog.giantoak.com/blog/old-hatreds-fuel-online-misinformation-about-covid-19-in-south-asia; Haaris Mahmud, "Anti-Muslim Hatred: Clouding the Fight Against Corona!," *Colombo Telegraph*, 2020 අප්‍රේල් 2, https://www.colombotelegraph.com/index.php/anti-muslim-hatred-clouding-the-fight-against-corona/; International IDEA, "Taking Stock of Global Democratic Trends Before and During the COVID-19 Pandemic," The Global State of Democracy in Focus, 2020 දෙසැම්බර් 14, https://www.google.com/books/edition/Taking_Stock_of_Global_Democratic_Trends/t7gZEAAAQBAJ?hl=en&gbpv=1&dq=the+global+state+of+democracy+in+focus&printsec=frontcover.

50 *Vatican News*, "Sri Lanka Church Unhappy About Probe into Easter Bombings," 2021 අගෝස්තු 16, https://www.vaticannews.va/en/church/news/2021-08/sri-lanka-easter-church-bombings-government-probe-faulty-ranjith.html.

51 Sunanda Deshapriya, "National Mainstream Media and Regional Medias 'Contesting Hegemonies' – Trilateral (Linguistic) Media in Sri Lanka," පත්‍රිකාව ඉදිරිපත් කරන ලද්දේ SAFHR Regional Workshop, "Sensitizing Media Covering Internal and Inter-State Conflicts," 2002 නොවැම්බර් 29 - දෙසැම්බර් 1, චෙන්නෙයි, ඉන්දියාව, https://www.cpalanka.org/wp-content/uploads/2007/8/Hegemony_and_Media_in_Sri_Lanka.pdf.

52 CPA, *Confidence in Democratic Governance Index (Wave 2)*: Report, 16.

53 CPA, *Confidence in Democratic Governance Index (Wave 2)*: Report, 4.

54 OHCHR, "Committee on Economic, Social and Cultural Rights Examines Second to Fourth Periodic Report of Egypt," 2013 නොවැම්බර් 14, https://www.ohchr.org/en/taxonomy/term/1321?page=77.

55 Neil DeVotta, "Sri Lanka: Ethnic Domination, Violence, and Illiberal Democracy," *Civil Society and Political Change in Asia: Expanding and Contracting Democratic Space* තුළ, සංස්කරණය එම්ඇලයස් ඇලගප්පා (ස්ටැන්ෆර්ඩ්: ස්ටැන්ෆර්ඩ් විශ්වවිද්‍යාල මුද්‍රණාලය, 2004), 292–323.

56 Mahendran Thiruvarangan, "Some Reflections on the Trade Union Action by the FUTA," *Groundviews*, 2011 මැයි 20, https://groundviews.org/2011/05/20/some-reflections-on-the-trade-union-action-by-the-futa/.

57 CPA, *Values and Attitudes Survey*, 70–6.

58 ශ්‍රී ලංකා ජාතික සාම මණ්ඩලයේ ඒවියි චිද ඵඒජ මාසික පුවත් පත්‍රිකාව බලන්න (https://www.peace-srilanka.org/media-centre/newsletters).

59 US Department of State, *2020 Report on International Religious Freedom: Sri Lanka*; Civicus, "Sri Lanka: Civil Society Subjected to Intensified Military Surveillance and Other Restrictions," Joint Statement at the 44th session of the HRC, 2020 ජූලි 10, https://www.civicus.org/index.php/media-resources/news/united-nations/geneva/4518-sri-lanka-civil-society-subjected-to-intensified-military-surveillance-and-other-restrictions; OHCHR, Sri Lanka on Alarming Path Towards Recurrence of Grave Human Rights Violations – UN Report, press release, 2021 ජනවාරි 27, https://www.ohchr.org/en/press-releases/2021/01/sri-lanka-alarming-path-towards-recurrence-grave-human-rights-violations-un.

60 Lia Kent, *Sri Lankan Civil Society in the New Rajapaksa Era: Navigating the Victor's Space*, New Mandala Policy Briefing – SEARBO2, 2021 සැප්තැම්බර්, https://www.newmandala.org/wp-content/uploads/2021/09/Lia-Kent_SEARBO_Policy-brief-paper.pdf; Priyan Dias, "Of Patriots and Traitors," Groundviews, 2018 සැප්තැම්බර් 13, https://groundviews.org/2018/09/13/of-patriots-and-traitors/.

61 *World Politics Review*, "Why Sri Lanka's Government Is Turning a Blind Eye to Anti-Muslim Violence," 2018 මාර්තු 9, https://www.worldpoliticsreview.com/trend-lines/24333/why-sri-lanka-s-government-is-turning-a-blind-eye-to-anti-muslim-violence; Kalinga Tudor Silva, "Gossip, Rumor, and Propaganda in Anti-Muslim Campaigns of the Bodu Bala Sena," *Buddhist Extremists and Muslim Minorities: Religious Conflict in Contemporary Sri Lanka* තුළ, සංස්කරණය John Clifford (ඔක්ස්ෆර්ඩ්: ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාල මුද්‍රණාලය, 2016), 119–39.

62 International Alert, https://www.international-alert.org/sites/default/files/publications/29_section_2_Sri_Lanka.pdf.

63 Aphichoke Kotikula and Jennifer Solotaroff, "Gender Analysis of Labor in Sri Lanka's Estate Sector," 2006 සැප්තැම්බර් 22, https://paa2007.princeton.edu/papers/71572.

64 Ranga Jayasuriya, "Unapologetic Gnanasara Thero of Bodu Bala Sena Threatens to Lead Boycott of Muslim Businesses in Sri Lanka," *dbsjeyaraj.com*, 2014 ජුනි 22 [බ්ලොග්]. https://dbsjeyaraj.com/dbsj/archives/30994; Minority Rights Group International, "Islamaphobia and Attacks on Muslims in Sri Lanka: Incident Map," 2013 මාර්තු, https://minorityrights.org/publications/islamophobia-and-attacks-on-muslims-in-sri-lanka-march-2013/.

65 2012 සහ 2015 අතර ශ්‍රී ලංකාවේ බොහෝ ව්‍යාපාරිකයන් සමඟ පැවැත්වූ සම්මුඛ සාකච්ඡා මත පදනම්ව.

66 IFES, "Democratic Socialist Republic of Sri Lanka," දිනය සඳහන් කර නොමැත, https://www.electionguide.org/countries/id/201.

67 *News 1st*, "'Regret Not Allowing Lakshman Kadirgamar to Be Appointed as PM': Patali Champika," 2019 දෙසැම්බර් 25, https://www.newsfirst.lk/2019/12/25/i-am-sorry-for-not-allowing-lakshman-kadiragamar-to-be-appointed-as-pm-patali-champika/.

68 Country-data.com, "Sri Lanka: Ethnic Composition of the Armed Forces," දිනය සඳහන් කර නොමැත, http://www.country-data.com/cgi-bin/query/r-13282.html#:~:text=Christians%2C%20who%20comprised%20about%208,percent%20of%20the%20officer%20corps.

69 මෙය ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය තමන් පත් කරන ලද දෙමළ පරිපාලකයෙකු යටතේ වැඩකිරීම සිංහල නිලබලධරයන් විසින් ප්‍රතික්ෂේප කළ ආකාරය ගැන කණගාටුව පළ කරමින් පෙන්වා දුන් කරුණකි.

70 බලන්න OHCHR, Promoting Reconciliation, Accountability and Human Rights in Sri Lanka - Report of the Office of the High Commissioner for Human Rights, A/HRC/49/9, 2022 පෙබරවාරි 25; OHCHR, Sri Lanka on Alarming Path Towards Recurrence of Grave Human Rights Violations.

71 IFES, "Women's Political Representation in Sri Lanka: Electoral System Analysis and Recommendations," දිනය සඳහන් කර නොමැත, https://www.ifes.org/publications/womens-political-representation-sri-lanka-electoral-system-analysis-and-recommendations.

72 Index Mundi, "Sri Lanka – GINI Index (World Bank Estimate)," දිනය සඳහන් කර නොමැත, https://www.indexmundi.com/facts/sri-lanka/indicator/SI.POV.GINI.

73 World Bank, "The World Bank in Sri Lanka: Overview," දිනය සඳහන් කර නොමැත, https://www.worldbank.org/en/country/srilanka/overview#1.

74 CPA, *Confidence in Democratic Governance Index*, 6–10.

75 Madeleine Keck, "Sri Lanka Faces Acute Food Shortages and Starvation Amid Economic Crisis," *Global Citizen*, 2022 අප්‍රේල් 7, https://www.globalcitizen.org/en/content/sri-lanka-economic-crisis-hunger/.

76 Rannan-Eliya, "Increasing Numbers of Sri Lankans Want to Migrate."

77 Bilesha Weeraratne, "Repatriation and Replacement of Lost Foreign Jobs: Handling Labour Migration in Sri Lanka During COVID-19," *Talking Economics*, 2020 මැයි 14, ප්‍රවේශ වූ දිනය 2021 නොවැම්බර් 18. https://www.ips.lk/talkingeconomics/2020/05/14/repatriation-and-replacement-of-lost-foreign-jobs-handling-labour-migration-in-sri-lanka-during-covid-19/.

78 දෙමළ ප්‍රදේශ සිංහල ප්‍රදේශ වලට වඩා දුගී බවින් පෙළෙති. උතුරු නැගෙනහිර දෙමළ කාන්තා ගෘහ-මූලික කුටුම්බයන් දරිද්‍රතාවයෙන් වැඩිපුරම බලපෑමට ලක්වූවන් අතර සිටින අතර, ඔවුන්ට සිංහල කාන්තා ගෘහ-මූලික කුටුම්බයන්ට වඩා අයහපත් ලෙස කල දවස ගෙවීමට සිදුවී ඇත. වතු අංශයේ දෙමළ ජනතාව (ඊනියා වතු දෙමළ හෝ ඉන්දියානු දෙමළ), බොහෝ කලක සිට දරිද්‍රතාවය සහ ශ්‍රී ලංකාවේ පහළ පන්ති වල තත්ත්වය සමඟ සම්බන්ධව සිටිති. බලන්න, T. Ramakrishnan, "'Tamil Areas in Sri Lanka Are in the Pockets of Poverty,'" *The Hindu*, 2016 පෙබරවාරි 20, https://www.thehindu.com/news/international/tamil-areas-in-sri-lanka-are-the-pockets-of-poverty/article8258342.ece ; Maneka Jayasinghe, "Dynamic Trends in Household Poverty and Inequality in Sri Lanka: Do Gender and Ethnicity Matter?," *Journal of the Asia Pacific Economy* 24:2 (2019): 208–23; *The Economist*, "A Subset of Tamils Lags Other Sri Lankans by Almost Every Measure," 2017 සැප්තැම්බර් 30, https://www.economist.com/asia/2017/09/30/a-subset-of-tamils-lags-other-sri-lankans-by-almost-every-measure

79 Anila Dias Bandaranaike, "Budget 2021: Playing Ostrich or Parading in the Emperor's New Clothes?," Daily FT, 2021 ජනවාරි 19, http://www.ft.lk/columns/Budget-2021-Playing-ostrich-or-parading-in-the-Emperor-s-new-clothes/4-711788.

80 දිවයිනේ දරුණු මූල්‍ය අර්බුදය නොතකා, "අපට රාජ්‍ය සේවකයින් හෝ හමුදාවේ සංඛ්‍යාවන් කපා හැරිය නොහැක" යැයි ප්‍රකාශ කිරීමට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ ව පොළඹවන්නේ එවැනි බහුතරවාදය සඳහා වූ කැපවීමකි. *Daily FT*, "President Vows to Finish Term, Tells Bloomberg Will Not Run for Re-Election." හි උපුටා දක්වා ඇති පරිදි.

81 World Bank, *Sri Lanka: Ending Poverty and Promoting Shared Prosperity: A Systematic Country Diagnostic*, Report No. 103246 (වොෂිංටන්: ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර බැංකුව සහ ලෝක බැංකුව, 2015), https://documents1.worldbank.org/curated/en/363391467995349383/pdf/103246-SCD-P152526-PUBLIC-NON-BOARD-VERSION-SriLankaCompleteFinal-122515lr-2.pdf.

82 Sandya Hewamanne, *Restitching Identities in Rural Sri Lanka: Gender, Neoliberalism, and the Politics of Contentment* (ෆිලඩෙල්ෆියා, ජ්ඨ පෙන්සිල්වේනියා විශ්වවිද්‍යාල මුද්‍රණාලය, 2020).

83 Sandya Hewamanne, “Invisible Bondage: Mobility and Compulsion Within Sri Lanka’s Global Assembly Line Production,” Ethnography (2021): 1–21.

84 IFC, *Realizing Sustainability Through Diversity: The Case for Gender Diversity Among Sri Lanka’s Business Leadership* (වොෂිංටන්ඩ් ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව, 2019), https://www.ifc.org/wps/wcm/connect/c6cbb7b1-54e5-44f1-893f-6deae41440dd/The_Case_Gender_Diversity_Among_Sri_Lanka_Business_Leadership.pdf?MOD=AJPERES.

85 Sarah Thanawala, “An Epidemic of Land Grabs in Sri Lanka,” *Global Human Rights Defence*, 2022 පෙබරවාරි 15, https://ghrd.org/an-epidemic-of-land-grabs-in-sri-lanka/?utm_source=rss&utm_medium=rss&utm_campaign=an-epidemic-of-land-grabs-in-sri-lanka; C.V. Wigneswaran, “Land Grabbing – The Real Pandemic for the Tamils in Sri Lanka,” *Colombo Telegraph*, 2021 සැප්තැම්බර් 25, https://www.colombotelegraph.com/index.php/land-grabbing-the-real-pandemic-for-the-tamils-in-sri-lanka/.

86 ICRA Lanka, “2022 SL Budget Appropriation Bill: Initial Observations,” 2021 ඔක්තෝබර් 13, https://www.icralanka.com/research/2022-sl-budget-appropriation-bill-initial-observations/#:~:text=Covid%20Disease%20Control.-,Total%20expenditure%20allocation%20on%20education%20contracts%20by%20LKR%206%20Bn,by%20nearly%20LKR%203%20Bn.

87 Methmalie Dissanayake, “Dilemma in Online Education Exposes Sri Lanka’s Social Inequality,” *ULearn*, 2021 ජූනි 20, https://www.ulearn.life/Dilemma-in-Online-Education-Exposes-Sri-Lankas-Social-Inequality.php

88 Nishan Sakalasooriya, “Regional Development Disparities in Sri Lanka,” *Open Journal of Social Sciences* 9:7 (2021): 62–91, https://www.scirp.org/journal/paperinformation.aspx?paperid=110557.

89 EPDC, “Sri Lanka: National Education Profile 2018 Update,” 2018, https://www.epdc.org/sites/default/files/documents/EPDC_NEP_2018_SriLanka.pdf.

90 Statista, “Female to Male Ratio in Tertiary Education in Sri Lanka from 2011 to 2020,” 2021 සැප්තැම්බර්, https://www.statista.com/statistics/696320/sri-lanka-female-to-male-ratio-in-tertiary-education/#:~:text=In%202020%2C%20there%20were%20approximately,tertiary%20education%20in%20Sri%20Lanka.

91 Rannan-Eliya, “Increasing Numbers of Sri Lankans Want to Migrate, ” 4.

92 *Sunday Times*, Pandemonium at Passport Office,” 2022 ජූනි 12, https://www.sundaytimes.lk/220612/news/pandemonium-at-passport-office-485742.html.

93 *Sunday Times*, “Five Years Leave for Public Servants to Work Overseas,” 2022 ජූනි 12, https://www.sundaytimes.lk/220612/news/five-years-leave-for-public-servants-to-work-overseas-485812.html.

94 Harsha Senanayake, “Religion, Religious Textbooks and Territorialisation of Sinhala Buddhist Ethno-nationalism in Sri Lanka,” *Open Political Science* 4:1 (2021): 300–5; DeVotta, “The Genesis, Consolidation, and Consequences of Sinhalese Buddhist Nationalism.”

95 CPA, *Values and Attitudes Survey*, 74–5.

96 *Tamil Guardian*, “Eleven attacks on Batticaloa Hindu temples in tree years – TNA MP,” 2018 සැප්තැම්බර් 25, https://www.tamilguardian.com/content/eleven-attacks-batticaloa-hindu-temples-three-years-tna-mp

97 The Associated Press, “11 Killed in Truck Bombing at Sri Lanka Buddhist Site,” *New York Times*, 1998 ජනවාරි 26, https://www.nytimes.com/1998/01/26/world/11-killed-in-truck-bombing-at-sri-lanka-buddhist-site.html

98 Sivaramakrishnan Parameswaran, “Pain of 1990 Muslim ‘massacre’ lingers in Sri Lanka,’ *BBC*, 2010 අගෝස්තු 12, https://www.bbc.com/news/world-south-asia-10950740

99 *World-Wide Religious News*, “Sri Lankan Buddhists Target Christians for Monk’s Death,” 2003 දෙසැම්බර් 23, https://wwrn.org/articles/13675/

100 *Deutsche Welle*, “Sri Lanka to Ban Burqas Over ‘National Security’ Concerns,”2021 මාර්තු 13, https://www.dw.com/en/sri-lanka-to-ban-burqas-over-national-security-concerns/a-56865781; Nilay Saiya, “Sri Lanka’s Proposed ‘Burqa Ban’ Would Backfire,” *The Diplomat*, 2021 මාර්තු 25, https://thediplomat.com/2021/03/sri-lankas-proposed-burqa-ban-would-backfire.

101 See International Crisis Group, “Sri Lanka’s Judiciary: Politicized Courts, Compromised Rights,” *Asia Report* No. 172, 2009 ජූනි 30, https://reliefweb.int/report/sri-lanka/sri-lankas-judiciary-politicised-courts-compromised-rights-icg-report.

102 US Department of State, *2020 Report on International Religious Freedom: Sri Lanka*, 4.

103 2022 ජූනි වන විට ශ්‍රේෂ්ඨාධිකරණයේ සේවය කළ විනිසුරුවරුන් 17 දෙනාගෙන් එක් අයෙක් දෙමළ වූ අතර එක් අයෙක් මුස්ලිම් විය.

104 නිදසුනක් ලෙස, 2022 ජූනි මස ශ්‍රේෂ්ඨාධිකරණයේ සේවය කළ විනිසුරුවන්ගෙන්, එක් අයෙක් පමණක් කාන්තාවකි. ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය පිළිබඳව වැඩි විස්තර සඳහා, බලන්න https://www.supremecourt.lk/.

105 ICJ, “Sri Lanka: ICJ and Judges Work to Counter Discrimination in Access to Justice,” 2021 මාර්තු 15, https://www.icj.org/sri-lanka-icj-and-judges-work-to-counter-discrimination-in-access-to-justice/.

106 Global Centre for Pluralism, Pluralism Perceptions Survey – Sri Lanka (ඔටාවා: බහුත්වවාදය සඳහා වන ගෝලීය කේන්ද්‍රය, 2021), 60.

107 CPA, *Confidence in Democratic Governance Index (Wave 2): Report*, 18.

108 International Crisis Group, “Sri Lanka’s Judiciary.”

109 ICG, “Sri Lanka: Appointment of New Chief Justice Undermines Rule of Law,” 2013 ජනවාරි 15, https://www.icj.org/sri-lanka-newly-appointed-chief-justices-long-record-of-blocking-justice/; ICG, *Attacks on Judiciary and Legal Profession Undermine the Rule of Law and Prevent Accountability Within Sri Lanka*, දිනය සඳහන් කර නොමැත, https://tbinternet.ohchr.org/Treaties/CCPR/Shared%20Documents/LKA/INT_CCPR_CSS_LKA_18218_E.pdf.

110 Maria Abi-Habib and Dharisha Bastians, “As Pandemic Rages, Sri Lanka’s President Pardons a War Criminal,” *New York Times*, 2020 මාර්තු 28, https://www.nytimes.com/2020/03/28/world/asia/sri-lanka-war-crimes-coronavirus.html; *Tamil Guardian*, “Sri Lanka Dismisses War Crimes Charges,” 2010 ජූනි 1, https://www.tamilguardian.com/content/sri-lanka-dismisses-war-crimes-charges.

